
# දෙවන අර්ධ-වාර්ෂික වාර්තාව

(2025 ජූනි - දෙසැම්බර්)

## 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්'

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම




නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ
ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල් සංවිධානය)
මාර්තු 12 ව්‍යාපාරය

2026 මාර්තු මස ප්‍රකාශයට පත් කරන ලදී

PAFFREL

March 12 Movement

# දෙවන අර්ධ-වාර්ෂික වාර්තාව

## (2025 ජූනි-දෙසැම්බර්)

## ‘පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්’:
## රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

2026 මාර්තු මස ප්‍රකාශයට පත්කරන ලදී

PAFFREL

මාර්තු
மார்ச்
MARCH
MOVEMENT
March 12 Movement

නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල් සංවිධානය)
මාර්තු 12 ව්‍යාපාරය

මෙම වාර්තාව පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය විසින් සිදු කරන ලද ස්වාධීන අධීක්ෂණ ක්‍රියාවලියකි. එහි සොයාගැනීම් ප්‍රසිද්ධියේ ලබා ගත හැකි දත්ත මත පදනම්වන අතර, කිසිදු පුද්ගලයන්ගේ, සංවිධානවල හෝ ව්‍යාපාරයේ නිල නිල මතය හෝ දේශපාලන ස්ථාවරය නිරූපණය නොකරයි.

# පෙරවදන

මෙම වාර්තාව ශ්‍රී ලංකා රජයේ 'පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්' යන ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වාධීනව අධීක්ෂණය කිරීමේ තක්සේරුව ඉදිරිපත් කරයි. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් පසුව, පස් අවුරුදු ආණ්ඩුකරණ කාලය සඳහා 'ජාතික ප්‍රතිපත්ති රාමුව' ලෙස මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය විධිමත්ව පිළිගෙන ඇත. ඊට අමතරව, අමාත්‍යාංශ ඉලක්ක වලට අනුකූලව උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලෙස අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන වලට උපදෙස් දෙන ලද අතර, ක්‍රියාත්මක කිරීම සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන කාර්යසාධන මෙවලමක් ලෙස ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණය (Result-Based Management-RBM) යොදා ගැනීමට ද අමාත්‍ය මණ්ඩලය තීරණය කළේය.

මෙම තෙවන පාර්ශ්වීය අධීක්ෂණ ක්‍රියාවලිය, ජාතික ජන බලවේගයේ (NPP) රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීමේ උචිතබව, සඵලතාව සහ මතුවෙමින් පවතින ප්‍රතිඵල පිළිබඳ සඵලදායී, ස්වාධීන සහ සාක්ෂි මත පදනම් වූ තක්සේරුවක් මෙන්ම, වඩා පුළුල් ජාතික සංවර්ධන අරමුණු සමග එහි අනුකූලතාව කෙසේවීද යන්න ලබාදීමට අදහස් කරයි. මෙම සන්දර්භය තුළ, අධීක්ෂණය, ප්‍රගතිය නිරීක්සීමේ යාන්ත්‍රණයක් ලෙස පමණක් නොව, මාර්තු 12 ව්‍යාපාරයේ දිගුකාලීන ජනවරමට අනුකූලවන පරිදි, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ඵලදායී ආණ්ඩුකරණය, තිරසර සංවර්ධනය සහ පුරවැසියන්ගේ වැඩිදියුණු කළ යහපැවැත්ම බවට පරිවර්තනය වන ආකාරය පිළිබඳ අවබෝධය ගැඹුරු කිරීම සඳහා අවස්ථාවක් ලෙස ද ක්‍රියා කරයි.

ඒ අනුව, පැෆ්රල් සහ මාර්තු 12 ව්‍යාපාරය මෙම දෙවන අර්ධ-වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණ වාර්තාව දැන් ඉදිරිපත් කරන අතර, එය පළමු අර්ධ-වාර්ෂික තක්සේරුව දිගටම ගෙන යාමේ ක්‍රියාවලියකි. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති ඉලක්ක සහ කැපවීම් සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් 2025 ජාතික අයවැය ක්‍රියාවට නැංවීම විශ්ලේෂණය කිරීම කෙරෙහි මෙම වාර්තාව විශේෂ අවධානයක් යොමු කරයි.

පළමු අර්ධ-වාර්ෂික වාර්තාව, 2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා කාලය ආවරණය කළ අතර, අමාත්‍ය මණ්ඩල තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග, විධායක තීරණ සහ අයවැය යෝජනා සමාලෝචනය කිරීම හරහා අදාළත්වය සහ මූලික සඵලතාව තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර, මේවා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සහ පුරවැසි-කේන්ද්‍රීය හොඳම භාවිතයන්ට එරෙහිව පරීක්ෂා කරන ලදි.

මෙම වාර්තාවෙන් පිළිබිඹු වන, අධීක්ෂණයේ දෙවන අදියර 2025 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය ආවරණය කරයි. 2025 ජාතික අයවැය මත පදනම්ව අමාත්‍යාංශ කාර්යසාධනය තක්සේරු කිරීම ඇතුළත් කිරීම සඳහා එය විශ්ලේෂණය පුළුල් කරන අතරම, 2026 ජාතික අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සමග අනුකූලතාව, විශේෂයෙන් සම්පත් වෙන් කිරීමේ කාර්යක්ෂමතාව සහ සංවර්ධනයේ සඵලතාවට දායක වීම පරීක්ෂා කරයි.

මෙම අඛණ්ඩව සිදු කෙරෙන අධීක්ෂණ ප්‍රයත්නය තුළින්, පැෆ්රල් සහ එහි හවුල්කරුවන් රාජ්‍ය ආණ්ඩුකරණය තුළ විනිවිදභාවය, ආයතනික ඉගෙනීම සහ වගවීමේ සංස්කෘතියක් පෝෂ්‍ය කිරීම සඳහා ඔවුන්ගේ කැපවීම යළි තහවුරු කරමින්, ජාතික සංවර්ධන ප්‍රකාශනයේ අන්තර්ගත අභිලාෂයන් ශ්‍රී ලංකාවේ ජනතාවට සැබෑවට දැනෙන හා සාධාරණ ප්‍රතිලාභ බවට පරිවර්තනය කිරීම සහතික කරයි.

# වගු සහ රූප සටහන් ලැයිස්තුව


වගුව 1 එක් එක් අමාත්‍යාංශය යටතේ ඇති පොරොන්දු ගණන සහ අයවැය වැඩසටහන්/ව්‍යාපෘති ..... 18

වගුව 2 අනුකූලතා ඇගයීමේ සාරාංශය ..... 19

වගුව 3 අමාත්‍යාංශ 25 කින් අවශ්‍ය ලියකියවිලි එක් රැස් කිරීමේ තත්ත්වය ..... 25

වගුව 4 ණය ආපසු ගෙවීම් නොමැතිව අමාත්‍යාංශ වෙනුවෙන් අයවැය වෙන් කිරීම, පළාත් සභා අයවැය සහ විශේෂ වියදම් ඒකකය ..... 108

වගුව 5 2025 සහ 2026 පළාත් සභා සඳහා අයවැය වෙන් කිරීම ..... 109

වගුව 6 2025 සහ 2026 දී ණය ආපසු ගෙවීම සඳහා අයවැය වෙන් කිරීම ..... 109

වගුව 7 විශේෂ වියදම් ඒකක ආයතන සහ මුදල් වෙන් කිරීම ..... 111

වගුව 8 අමාත්‍යාංශ 13ක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය හරහා හරහා ලැබුණු ප්‍රතිචාර ..... 115

වගුව 9 අමාත්‍යාංශ 16ක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය හරහා හරහා ලැබුණු ප්‍රතිචාර ..... 117

වගුව 10 ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු සහ මූල්‍ය සැලසුම්කරණය අතර අනුකූලතාව ..... 119

වගුව 11 2026 අයවැය යෝජනා ..... 120

වගුව 12 පශ්චාත්-ව්‍යසන කාලය තුළ නිකුත් කළ රජයේ ගැසට් සහ චක්‍රලේඛ ..... 124

රූප සටහන 1 රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවල දිශානතිය ..... 15

රූප සටහන 2 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක් එක් අංශය යටතේ ඇති පොරොන්දු සංඛ්‍යාව ..... 16

රූප සටහන 3 පොරොන්දුවලට අනුකූල වීම පිළිබඳ උච්චතබවේ ප්‍රතිශත ..... 19

# අන්තර්ගතය


පෙරවදන .......... 3

වගු සහ රූප සටහන් ලැයිස්තුව .......... 4

කෙටි යෙදුම් .......... 7

විධායක සාරාංශය .......... 9

**1.** හැඳින්වීම .......... 10

1.1. සන්දර්භය .......... 11

1.2. වාර්තාවේ විෂය පථය .......... 10

1.3. ක්‍රමවේදය .......... 12

1.3.1. උචිතබව .......... 12

1.3.2. කාර්යක්ෂමතාවය .......... 13

1.3.3. සඵලතාව .......... 13

1.3.4. විශ්ලේෂණ රාමුව .......... 13

1.3.5. සීමාවන් .......... 16

**2.** රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දළ විශ්ලේෂණය: 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' .......... 17

**3.** අමාත්‍ය මණ්ඩල තීරණ සහ ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙරෙහි අනුකූලතාව (2025 ජූනි-දෙසැම්බර්) .......... 21

**4.** ජාතික අයවැය සහ අමාත්‍යාංශ හරහා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සඳහා ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන .......... 23

4.1. ආයතනික සැලසුම්කරණය සහ කාර්යසාධනය කළමනාකරණය .......... 23

4.2. අමාත්‍යාංශවල කාර්යසාධනය පිළිබඳ දත්ත එක්රැස් කිරීම .......... 24

**5.** 2025 ජාතික අයවැය ක්‍රියාවට නැංවීම පිළිබඳ ඇගයීම .......... 28

5.1. 2025 ජාතික අයවැයේ ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ දළ විශ්ලේෂණය .......... 28

5.2. 2025 ජාතික අයවැය සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් .......... 29

5.3. අමාත්‍යාංශ අනුව ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය .......... 29

1. අධ්‍යාපන අමාත්‍යාංශය .......... 29
2. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය .......... 32
3. නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය .......... 35
4. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය .......... 38
5. ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය .......... 42
6. කම්කරු අමාත්‍යාංශය .......... 45
7. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය .......... 48
8. ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය .......... 51
9. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය .......... 54
10. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය .......... 58

11. පරිසර අමාත්‍යාංශය ........ 61

12. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය ........ 64

13. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ........ 67

14. වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය ........ 69

15. බලශක්ති අමාත්‍යාංශය ........ 72

16. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය ........ 75

17. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය ........ 78

18. වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය ........ 81

19. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය ........ 84

20. මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ........ 86

21. ආරක්ෂක අමාත්‍යාංශය ........ 89

22. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය ........ 91

23. ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය ........ 93

24. වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය ........ 96

25. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ........ 99

5.4. නිරීක්ෂණ ........ 108

**6. 2026 ජාතික අයවැයට අනුව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අනුකූලතා සමාලෝචනය ........ 111**

6.1. 2026 ජාතික අයවැය ප්‍රතිපත්තිමය දිශානතිය පිළිබඳ දළ විශ්ලේෂණය ........ 111

6.2. 2026 ජාතික අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ ඇති අනුකූලතාව ........ 112

**7. අපදා කලමනාකරණය පිළිබඳ රජයේ ක්‍රියාමාර්ග ........ 115**

7.1. අපදා කළමනාකරණය සහ පශ්චාත්-දිට්වා සුළි කුණාටු ක්‍රියාමාර්ග පිළිබඳ පොරොන්දු ........ 115

7.2. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ ආපදා හා සම්බන්ධ කැපවීම් ........ 116

7.3. දිට්වා සුළි කුණාටුවෙන් පසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ ඒවා ක්‍රියාත්මක කිරීම ........ 117

7.4. මූල්‍ය කැපවීම් ........ 118

7.5. අධීක්ෂණ අර්ථකථන ........ 118

**8. නිර්දේශ ........ 120**

**9. නිගමනය ........ 122**

**ආශ්‍රිත මූලාශ්‍ර ........ 123**

**ඇමුණුම් ........ 125**

# කෙටි යෙදුම්

| | |
|---|---|
| CIABOC | Commission to Investigate Allegations of Bribery or Corruption (අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව) |
| DPMM | Department of Project Management and Monitoring (ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව) |
| GDP | Gross Domestic Product (දළ දේශීය නිෂ්පාදිතය) |
| LGBTIQ | Lesbian, Gay, Bisexual, Transgender, Intersex, and Queer (or Questioning) (සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික සහ අවිනිශ්චිත) |
| M12M | March 12 Movement (මාර්තු 12 ව්‍යාපාරය) |
| MPs | Members of Parliament (පාර්ලිමේන්තු මන්ත්‍රී) |
| NKRAs | National Key Result Areas (ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර) |
| NPP | National People's Power (ජාතික ජන බලවේගය) |
| PAFFREL | People's Action for Free and Fair Elections (නිදහස් සහ සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය) |
| QPR | Quarterly Progress Report (කාර්තුමය ප්‍රගති වාර්තාව) |
| RTI | Right to Information (තොරතුරු දැනගැනීමේ අයිතිය) |
| SLIDA | Sri Lanka Institute of Development Administration (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) |
| SSU | Special Spending Unit (විශේෂ වියදම් ඒකකය) |
| USD | United States Dollar (ඇමරිකා එක්සත් ජනපද ඩොලරය) |

# විධායක සාරාංශය

නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය (පැෆ්රල් සංවිධානය) සහ මාර්තු 12 ව්‍යාපාරය සමඟ සහයෝගයෙන්, රජයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය කරමින්, එහි දෙවන අර්ධ-වාර්ෂික අධීක්ෂණ වාර්තාව (2025) ඉදිරිපත් කරයි. පළමු අර්ධ-වාර්ෂික වාර්තාවේ ඇගයුම මත ගොඩනඟමින්, මෙම වාර්තාව 2025 ජාතික අයවැය, ආයතනික ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයන්, සහ වාර්තාකරණ කාල සීමාව තුළ අත්පත් කරගත් අංශ-විශේෂිත ප්‍රගතිය පිළිබඳ පුළුල් සමාලෝචනයක් ඇතුළත් කිරීම මඟින් මෙම වාර්තාව විශ්ලේෂණාත්මක ගැඹුර පුළුල් කරයි.

මෙහි සොයාගැනීම්වලින් පෙනී යන්නේ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් සහ ප්‍රතිපත්ති නියෝග හරහා ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ගණනාවක් විධිමත් ලෙස ආරම්භ කර ඇති අතර, ප්‍රකාශිත ප්‍රතිපත්තිමය අභිප්‍රායයේ සිට මැනිය හැකි සහ විපාක මත පදනම් වූ ප්‍රතිඵල දක්වාවන ප්‍රගතිය අසමානව පවතින බවයි. තෝරාගත් අංශවල අයවැය සමඟ අනුකූලතාවය වැඩිදියුණු වීම් නිරීක්ෂණය කළ හැකිය; කෙසේ වෙතත්, සම්පූර්ණ කාර්තුමය ප්‍රගති වාර්තා ලබාගැනීමේ දී පැවති අඩුපාඩු පුළුල් ලෙස ප්‍රතිඵල මට්ටමින් අධීක්ෂණය කිරීමට බාධාවක් වී ඇත. මීට අමතරව, ආයතනික බන්ධණය සහ දෙපාර්තමේන්තු මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් අසම්පූර්ණ වාර්තාකරණය සමස්ත විෂය පථයට සහ තක්සේරුවේ තීව්‍රතාවට බලපා ඇත.

මෙම අභියෝග මධ්‍යයේ වුවද, රජය විසින් තම මැතිවරණ ප්‍රකාශනය මාර්ගෝපදේශක ජාතික ප්‍රතිපත්ති රාමුවක් ලෙස විධිමත් ලෙස සම්මත කර ගැනීම ප්‍රතිඵල කෙරෙහි නැඹුරු වූ ආණ්ඩුකරණයක් කරා යන වැදගත් ප්‍රගමනයක් නියෝජනය කරයි. අභ්‍යන්තර අධීක්ෂණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම මඟින් වගවීම සහ කාර්යසාධනය නිරීක්ෂීම පිළිබඳව වර්ධනය වන ආයතනික පිළිගැනීමක් තවදුරටත් පෙන්නුම් කරයි.

මෙම දෙවන අර්ධ-වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ශක්තිමත් කිරීම තුළ ස්වාධීන, තෙවන පාර්ශවීය අධීක්ෂණයේ කාර්යභාරය සවිගන්වයි. දත්ත සීමා කිරීම් තිබියදීත්, අධීක්ෂණ ක්‍රියාවලිය ක්‍රමානුකූල ලේඛන සමාලෝචනය, අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය, අයවැය පරීක්ෂණය, ආයතනික සිතියම්ගත කිරීම සහ නිල දත්ත ලබා ගැනීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතියෙහි යාන්ත්‍රණයන් විධිමත් ලෙස භාවිතා කිරීම තුළින් ක්‍රමවේදයෙහි දැඩි බව ආරක්ෂා කර ඇත.

මෙම ක්‍රියාවලිය ස්වභාවයෙන්ම නිර්මාණාත්මක බව පැෆ්රල් සංවිධානය සහ මාර්තු 12 ව්‍යාපාරය යළි තහවුරු කරයි. එහි අරමුණ දෝෂ ආරෝපණය කිරීම නොව, මැතිවරණ කැපවීම් මහජනයාට සැබැවට දැනෙන ප්‍රතිඵල බවට ඵලදායී ලෙස පරිවර්තනය කිරීමට සහාය වීම මඟින් විනිවිද පෙනෙන, වගවන සහ කාර්යසාධනය මත පදනම් වූ ආණ්ඩුකරණයක් සඳහා අර්ථවත් ලෙස දායක වීමයි.

ප්‍රජාතන්ත්‍රවාදී වගවීම, ප්‍රතිපත්තිවල සංසක්තිය, සහ සාක්ෂි මත පදනම් වූ රාජ්‍ය පරිපාලනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, රජයේ ධුර කාලය පුරාවටම මෙම ස්වාධීන අධීක්ෂණ ක්‍රියාවලිය පවත්වා ගෙන යාමට සංවිධාන කැපවී සිටී.

**රෝහණ හෙට්ටිආරච්චි**
විධායක අධ්‍යක්ෂ,
නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරිත්වය (පැෆ්රල් සංවිධානය)

# 1

# හැඳින්වීම

## 1.1 සන්දර්භය

ප්‍රතිපත්ති ප්‍රකාශන වාර්තාවේ දෙවන අර්ධ-වාර්ෂික වාර්තාව, රජයේ මැතිවරණ වරමෙහි මුල් කාලීන ක්‍රියාත්මක කිරීමේ චක්‍රයේ තීරණාත්මක අදියරක්වන **2025 ජුනි සිට දෙසැම්බර්** දක්වා කාලය ආවරණය කරයි. මෙම කාලය තුළ, 2025 ජාතික අයවැය රාමුව යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් විධිමත් ප්‍රතිපත්තිමය දිශාවන්, අමාත්‍ය මණ්ඩල තීරණ සහ අයවැය විධිවිධාන බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය රජය විසින් අඛණ්ඩව කරගෙන යන ලදී.

වඩා පුළුල් ආණ්ඩුකරණ සන්දර්භය, අමාත්‍යාංශ තුළ පරිපාලන සංක්‍රාන්ති, ප්‍රමාද වූ වාර්තාකරණ චක්‍ර සහ ක්‍රමයෙන් විකාසයට පැමිණෙන ආයතනික සැකසීම් මගින් සංලක්ෂිත විය. සැලකිය යුතු ලෙස, 2025 ජාතික අයවැය ප්‍රමාද වී ඉදිරිපත් කිරීම සහ අනුමත කිරීම, පළමු කාර්තුවේ ප්‍රගති ලේඛන ලබාගැනීමට බලපාන ලදී. විශ්ලේෂණය සිදු කරන අවස්ථාවේදී, 2025 සඳහා ප්‍රවේශ විය හැකි වූයේ, කාර්තුමය ප්‍රගති වාර්තා හතරෙන් දෙකක් වෙත පමණකි. අයවැය හා සම්බන්ධ ප්‍රමාදයන් හේතුවෙන් පළමු කාර්තුවේ වාර්තාව ලබාගත නොහැකි වූ අතර, සිව්වන කාර්තුවේ වාර්තාව (ඔක්තෝබර්-දෙසැම්බර් 2025) සකස් කරමින් පැවතුනි. ඇතැම් අවස්ථාවන්හි දී, වාර්තාකරණය සම්පූර්ණ අමාත්‍යාංශ මට්ටමින් ඒකාබද්ධ ලෙස සිදු කිරීමට වඩා දෙපාර්තමේන්තු හෝ ප්‍රාදේශීය මට්ටම් වලට සීමා වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආයතනික ආවරණය සිදු වූයේ අර්ධ වශයෙනි.

මෙම සන්දර්භීය යථාර්ථයන් තක්සේරුවේ විෂය පථය සහ ගැඹුර යන දෙකටම බලපා ඇති අතර, ඒවා මෙම වාර්තාවේ විනිවිද බවින් යුතුව පිළිගෙන ඇත.

## 1.2 වාර්තාවේ විෂය පථය

මෙම වාර්තාවේ විෂය පථය වාර්තාකරණ කාල සීමාව තුළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සහ රජයේ සැබෑ ක්‍රියාමාර්ග අතර අනුකූලතාව තක්සේරු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. ප්‍රතිපත්තිමය අභිප්‍රායයන් සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය යන දෙකම ග්‍රහණය කර ගැනීම සඳහා ආණ්ඩුකරණය සහ රාජ්‍ය පරිපාලනයේ බහුවිධ මානයන් හරහා විශ්ලේෂණය විහිදේ.

නිශ්චිත වශයෙන්, වාර්තාව පහත සඳහන් කරුණු පරීක්ෂා කරයි:

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සහ 2025 ජුනි සහ දෙසැම්බර් අතර නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ අතර අනුකූලතාව.
- ජාතික ප්‍රතිපත්ති රාමුවට ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ඒකාබද්ධ කිරීම සහ මුල් පොරොන්දු වලින් බැහැරවීම් හඳුනා ගැනීම.
- 2025-2029 කාලය තුළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම සඳහා මතුවෙමින් පවතින රජයේ උපායමාර්ගික මාර්ග සිතියම.
- ප්‍රතිපත්ති ප්‍රකාශකයේ කැපවීම් ක්‍රියාවට නැංවීම සඳහා 2025 වසර සඳහා සකස් කරන ලද අමාත්‍යාංශ මට්ටමේ ක්‍රියාකාරී සැලසුම්
- ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු වලට සම්බන්ධ මුදල් වෙන් කිරීම්, වියදම් ප්‍රමුඛතා සහ ක්‍රියාත්මක කිරීමේ ආකාරයන් ඇතුළුව, 2025 ජාතික අයවැය.
- අමාත්‍ය මණ්ඩලය, පාර්ලිමේන්තුව, රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතන හරහා ආයතනික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ මාර්ග.
- තනි කැපවීම් පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය, ආරම්භ කරන ලද, සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන ලද, අර්ධ වශයෙන් ක්‍රියාත්මක කරන ලද හෝ අවසන් නොවූ (Pending) ලෙස වර්ගීකරණය කර ඇත.
- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවලට සම්බන්ධ මුදල් වෙන් කිරීම්, වියදම් ප්‍රමුඛතා සහ ක්‍රියාත්මක කිරීමේ ආකාරයන් ඇතුළුව, 2026 ජාතික අයවැය පිළිබඳ දළ විශ්ලේෂණයක් සහ 2025 ජාතික අයවැය සමඟ සංසන්දනය කිරීම.

සමස්ත සොයාගැනීම්, පද්ධතිමය නිරීක්ෂණ සහ ප්‍රතිපත්ති මට්ටමේ නිර්දේශ.

එබැවින්, මෙම වාර්තාවේ විෂය පථය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය ප්‍රතිපාදන, ආයතනික සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනය ආවරණය කරයි.

## 1.3 ක්‍රමවේදය

ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණ ක්‍රියාවලියේ දෙවන අදියර ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දර්ශක යන දෙකම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම අදියරේ දී, පැෆ්රල් සංවිධානය විසින්, විධායක තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්, අමාත්‍ය මණ්ඩල තීරණ, අයවැය වෙන්කිරීම් සහ අමාත්‍යාංශ වල කාර්යසාධනය වැනි යෙදවුම් සහ ක්‍රියාකාරකම් වල දර්ශක පරීක්ෂා කරන ලදී. විශේෂයෙන්, මෙම අදියරේ දී ව්‍යාපෘති (මුලපුරන ලද/ ඉටු කෙරෙමින් පවතින/සම්පූර්ණ කරන ලද), සේවා සැපයීමේ වැඩිදියුණු කිරීම් සහ පනවන ලද නීති සම්පාදන යන මේවා පිළිබඳ අමාත්‍යාංශ වල කාර්යසාධනය අධීක්ෂණය කරන ලදී.

පළමු අදියරේ දී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු පුරවැසියන්ගේ සැබෑ අවශ්‍යතා සහ ප්‍රමුඛතා කෙතරම් හොඳින් ආමන්ත්‍රණය කරන්නේ ද යන්න සහ "උචිතබව" පිළිබඳ නිර්ණායක මත පදනම්ව ජාතික සංවර්ධන අරමුණු සමඟ කොතරම් හොඳින් අනුකූල වන්නේ ද යන්න පිළිබඳ මූලික තක්සේරුවක් ස්ථාපිත කරන ලදී. දෙවන අදියරේ සිට, එය ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ සංවර්ධන ආධාර කමිටුවේ (OECD-DAC) ඉතිරි නිර්ණායක වන "කාර්යක්ෂමතාව" සහ "සඵලතාව" උපයෝගී කර ගැනීම සඳහා තක්සේරුව පුළුල් කෙරුණි. එමගින් කාලයත් සමඟ ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල යන දෙකම පුළුල් ලෙස අධීක්ෂණය කිරීමට ඉඩ සැලසුණි.

### 1.3.1 උචිතබව

'**උචිතබව**' මගින් සංවර්ධන මැදිහත්වීම ඉලක්ක කණ්ඩායම් වල අවශ්‍යතා සහ ප්‍රමුඛතා සපුරාලන ප්‍රමාණය සහ රටේ ජාතික සංවර්ධන සැලැස්මට සහ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ කොතරම් දුරට අනුකූල වන්නේ ද යන්න පරීක්ෂා කරයි.[1] ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය උචිතබවේ නිර්ණායක කාණ්ඩ හතරකට වර්ගීකරණය කළේය: අතිශයින් උචිත, උචිත, අර්ධ වශයෙන් උචිත, සහ උචිත නොවන යන අන්දමිනි.

1 Sivagnanasothy, V. (2020). Development Evaluation in Sri Lanka. USAID/SDGAP, P, 39.

1. **අතිශයින් උචිත:**

- අමාත්‍ය මණ්ඩල තීරණය හෝ අයවැය වෙන් කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවක් සෘජුවම ආමන්ත්‍රණය කරයි.
- ප්‍රතිපත්ති පොරොන්දුව කිසිදු පරතරයකින් තොරව අපේක්ෂිත ඉලක්කයට, ප්‍රමිතියට හෝ අවශ්‍යතාවයට සම්පූර්ණයෙන්ම අනුරූප වේ.

2. **උචිත**

- අමාත්‍ය මණ්ඩල තීරණය හෝ අයවැය වෙන් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවේ අභිප්‍රායට පුළුල් ලෙස සහාය දක්වන නමුත්, විස්තරාත්මකව සම්පූර්ණයෙන්ම අනුකූල නොවේ.
- ප්‍රතිපත්ති/ක්‍රියාකාරිත්වය සහ කැපවීම අතර පොදු අනුරූපතාවක් ඇති නමුත්, යම් අනුවර්තනයක් හෝ අර්ධ වශයෙන් ආවරණය කරන බව පැහැදිලි වේ.

3. **අර්ධ වශයෙන් උචිත**

- අමාත්‍ය මණ්ඩල තීරණය හෝ අයවැය වෙන් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවකට සීමිත සබඳතාවක් දක්වයි.
- පොරොන්දුවේ ඇතැම් අංග පමණක් ආමන්ත්‍රණය කරනු ලබයි, නැතහොත් බලපෑම වක්‍ර හෝ ප්‍රමාණවත් නොවේ.

4. **උචිත නොවන**

- අමාත්‍ය මණ්ඩල තීරණය හෝ අයවැය වෙන් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට කිසිදු අර්ථවත් ආකාරයකින් සම්බන්ධ නොවේ.
- ප්‍රතිපත්තිය/ක්‍රියාකාරිත්වය සහ ප්‍රකාශිත කැපවීම අතර කිසිදු අනුකූලතාවක් නොමැත.

### 1.3.2 කාර්යක්ෂමතාවය

#### කාර්යක්ෂමතාව තක්සේරු කිරීම

තිබිය හැකි විකල්ප සැලකිල්ලට ගනිමින්, සංවර්ධන මැදිහත්වීම්වල පිරිවැය, ඒවායේ ප්‍රතිඵල මගින් කොතරම් දුරට සාධාරණීකරණය කරන්නේ ද යන්න කාර්යක්ෂමතාව මඟින් පරීක්ෂා කරයි. එහි හරය ගත් කල, යම් මැදිහත්වීමක් එහි අපේක්ෂිත ප්‍රතිඵල කාලෝචිතව හා පිරිවැය-ඵලදායී ආකාරයකින් ලබා දී තිබේද, නැතහොත් ලබා දීමට ඉඩ තිබේද යන්න එය තක්සේරු කරයි.

### 1.3.3 සඵලතාව

#### සඵලතාව තක්සේරු කිරීම

මැදිහත්වීමක් එහි අපේක්ෂිත ප්‍රතිඵල සහ බලපෑම් කොතෙක් දුරට මුදුන්පත් කරගෙන තිබේද, නැතහොත් මුදුන්පත් කර ගැනීමට ඉඩ තිබේද, යන්න සඵලතාව මගින් පරීක්ෂා කරයි. සැලසුම් කළ ක්‍රියාකාරකම් සහ නිමැවුම් අපේක්ෂිත ප්‍රතිඵල බවට පරිවර්තනය වී තිබේද යන්න කෙරෙහි අවධානය යොමු කරමින්, එය නිමැවුම් සහ ප්‍රතිඵල අතර සම්බන්ධතාවය තක්සේරු කරයි. මෙම සන්දර්භය තුළ, ප්‍රකාශිත කැපවීම් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කර ඇති ප්‍රමාණය මැනීමෙන් සහ ප්‍රකාශිත ඉලක්ක සහ සැබෑ ජයග්‍රහණ අතර පරතරයන් හඳුනා ගැනීමෙන් සඵලතාව ඇගයීමට ලක් කරනු ලබයි.

### 1.3.4 විශ්ලේෂණ රාමුව

ජනාධිපති ලේකම් කාර්යාලයේ විධායක තීරණ, අමාත්‍ය මණ්ඩල තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්, ජාතික අයවැය වෙන්කිරීම්, අමාත්‍යාංශ වල කාර්යසාධනය සහ අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරකම් වලින් උකහා ගනිමින්, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවලට සමගාමීව වත්මන් රජයේ ප්‍රගතිය, ක්‍රමානුකූලව සමාලෝචනය කරන මෙම වාර්තා වල ඉටු කර ඇති දේ සහ ක්‍රියාත්මක වෙමින් පවතින දේ මනින අතර, පොරොන්දුව; **ක්‍රියාත්මක කර තිබේද, අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර තිබේද, මුලපුරා තිබේද, තවමත් ක්‍රියාත්මක කර නොමැතිද** යන්න සහ **සත්‍යාපනය කළ**

යුතු නොපැහැදිලි කරුණු හඳුනා ගනිමින්, මහජන විවාදයට සහ ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට සාක්ෂි පදනමක් ඉදිරිපත් කරයි.

### විධායක තීරණ

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාවට නැංවීම සඳහා විධායක ජනාධිපතිවරයාගේ තීරණ ඉතා වැදගත් වේ, මන්දයත්, ඒවා රජය සඳහා සමස්ත දිශානතිය සහ ප්‍රමුඛතා සකස් කරන බැවිනි. අමාත්‍ය මණ්ඩලය සහ අමාත්‍යාංශ වලට මඟ පෙන්වීමෙන්, ජනාධිපතිවරයා ප්‍රතිපත්ති සහ සම්පත් සඳහා ඇති කැපවීම් සමඟ අනුකූලවීම සහතික කරයි. ශක්තිමත් නායකත්වයක් මගින් සැපයුම වේගවත් කිරීමට සහ වගවීම ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීම සඳහා විධායක ජනාධිපතිවරයා විසින් ගනු ලබන විධායක තීරණ මෙම ක්‍රියාවලියේ දී අධීක්ෂණය කෙරේ.

### අමාත්‍ය මණ්ඩල තීරණ

අමාත්‍ය මණ්ඩල තීරණ මගින් දේශපාලන කැපවීම්, විධිමත් ප්‍රතිපත්තිමය ක්‍රියාකාරීත්වයන් බවට පරිවර්තනය කරන බැවින්, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍ය මණ්ඩල තීරණ කේන්ද්‍රීය වේ. සාමූහික තීරණ ගැනීම හරහා, අමාත්‍ය මණ්ඩලය යෝජනා අනුමත කිරීම, සම්පත් වෙන්කිරීම සහ නීතිමය හෝ පරිපාලන රාමු ස්ථාපිත කිරීම සහතික කරයි. සඵලදායී අමාත්‍ය මණ්ඩල තීරණ, අමාත්‍යාංශ හරහා ඒකාබද්ධභාවය ඇති කරයි, අතිච්ඡාදනය වීම වළක්වයි, සහ වගවීම ඇති කරයි, ඒවා ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු සහ ප්‍රායෝගික ආණ්ඩුකරණය අතර තීරණාත්මක සම්බන්ධයක් බවට පත් කරයි. මෙම දෙවන අර්ධ-වාර්ෂික වාර්තාව පදනම් වී ඇත්තේ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ශ්‍රී ලංකා වෙබ් අඩවිය (https://www.cabinetoffice.gov.lk/) තුළ, නිල මාධ්‍ය නිවේදන ලෙස ප්‍රකාශයට පත් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ මත වන අතර, එය ප්‍රසිද්ධියේ ලබාගත නොහැකි සත්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් (cabinet memorandum) හෝ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මත රඳා නොපවතී.

### පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ක්‍රියාත්මක කිරීමේදී, පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන් ඉතා වැදගත් වන්නේ පාර්ලිමේන්තුව විසින් නීති, ප්‍රතිපත්ති, සහ රජයේ කැපවීම් බලාත්මක කරන ජාතික අයවැය අනුමත කරන බැවිනි. විවාද, අධීක්ෂණ සහ කමිටුවල කටයුතු හරහා, පාර්ලිමේන්තුව ක්‍රියාත්මක වීමේදී වගවීම සහ විනිවිදභාවය සහතික කරයි. ජනතාවගේ හඬ නියෝජනය කිරීමෙන්, පාර්ලිමේන්තුව විසින් නිත්‍යානුකූලභාවය ශක්තිමත් කරන අතර, රජය එහි ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු සමඟ අනුකූල වන ලෙස තබාගනී.

මෙම අධීක්ෂණ ක්‍රියාවලිය, පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්, විශේෂයෙන් අයවැය නිවේදන, නීතිමය නිවේදන, කාරක සභා ක්‍රියාවලීන් සහ ප්‍රතිපත්ති තීරණ සමඟ කටයුතු කරයි. පළමු මාස හය තුළ, ජාතික අයවැය, 2025 දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා 2025 අප්‍රේල් මාසයේ දී පාර්ලිමේන්තුව තුළ සම්මත කරන ලදී.

### ජාතික අයවැය වෙන්කිරීම්

රජයක් තම දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශනය, ක්‍රියාවට නැංවිය හැකි වැඩසටහන් සහ සේවාවන් බවට පරිවර්තනය කරන ප්‍රධාන මෙවලම ජාතික අයවැය යි. එබැවින්, පොරොන්දු වූ කැපවීම් සඳහා ප්‍රමාණවත් ලෙස අරමුදල් ලබාදෙන බවත්, ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවත්, සහතික කිරීම සඳහා අයවැය අධීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. සම්පත් වෙන්කිරීම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමුඛතා සමඟ අනුකූල වේද යන්න සත්‍යාපනය කිරීමට, ප්‍රතිපත්තිමය අභිප්‍රායයන් සහ සැබෑ වියදම් අතර හිඩැස් හඳුනා ගැනීමට සහ ප්‍රතිඵල වෙනුවෙන් ආයතන වගවිය යුතුවන ලෙස තබා ගැනීමට එය උපකාරී වේ. අයවැය අඛණ්ඩව අධීක්ෂණය කිරීම මගින්, විනිවිදභාවය ශක්තිමත් කරන අතර, මහජන විශ්වාසය වැඩිදියුණු කරමින්, මතුවන අභියෝග ආමන්ත්‍රණය කිරීම සඳහා කාලෝචිත සීරුමාරු කිරීම් බලදායී කරයි.

ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණ ක්‍රියාවලියේ පළමු අදියරේ දී, **උචිතබව** (අයවැය ප්‍රතිපාදන නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් වලට අනුරූප වේ), **කාර්යක්ෂමතාව** (පූර්ණ ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර ඇති මූල්‍ය සම්පත් ප්‍රමාණවත් වීම), සහ **සඵලතාව** (ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක සමඟ අනුකූල වන පැහැදිලි කාලරාමු සහ මැනිය හැකි ඉලක්ක) වැනි නිර්ණායක තුනක් මත පදනම්ව, ප්‍රතිපත්ති ප්‍රකාශන ඉලක්ක සමඟ අනුකූල වන මට්ටම තක්සේරු කිරීම සඳහා 2025 ජාතික අයවැය විශ්ලේෂණය කරන ලදී.

2025 ජාතික අයවැය සන්දර්භය තුළ, අයවැය ඉදිරිපත් කිරීමේ ආරම්භක මාස තුනක ප්‍රමාදය, නව රජයක් පිහිටුවීම හා සම්බන්ධ සංක්‍රාන්ති බාධාවක් ලෙස සැලකිය හැකිය. තවද, සිව්වන කාර්තුවේ සුළි කුණාටු ව්‍යසනය හේතුවෙන් ඇති වූ බාධා කිරීම සාමාන්‍ය අමාත්‍ය කාර්ය ප්‍රවාහයන්ට සහ පරිපාලන ක්‍රියාවලීන්ට සැලකිය යුතු ලෙස බලපෑවේය. මෙම සාධක, කාලය පිළිබඳ කාර්යක්ෂමතාව සහ ආයතනික කළමනාකරණ ධාරිතාව පිළිබඳ ගැටළු මතු කරයි.

ඊට අමතරව, පුනරාවර්තන වියදම් ප්‍රාග්ධන ආයෝජන ඉක්මවා යන සහ සංවර්ධනයට නැඹුරු නොවී බොහෝ දුරට මෙහෙයුම් හා සම්බන්ධව පවතින වියදම්වල සංයුතිය සමස්ත කාර්යක්ෂමතාවයට බලපෑම් ඇති කරයි. ඉහළ පුනරාවර්තන වියදම් අනුපාතයක් හේතුවෙන් මූල්‍ය ප්‍රතිපාදන තිරසර සංවර්ධන ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීම සඳහා රජයට ඇති හැකියාව තදින් සීමා කළ හැකි අතර, එමඟින් රාජ්‍ය සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවයට බලපෑම් ඇති විය හැකිය.

2025 ජාතික අයවැය සම්බන්ධයෙන් ගත් කල, මෙම අදියරේ දී ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ සඵලතාව සීමිත බව පෙනේ. වසරේ තෙවන කාර්තුව දක්වා ලබාගත හැකි දත්ත වලින් පෙනී යන්නේ, මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු සඳහා සීමිත අමාත්‍යාංශ සංඛ්‍යාවකට පමණක් ප්‍රවේශ විය හැකි බවත්, පුළුල් භෞතික ප්‍රගතිය පිළිබඳ දත්ත අමාත්‍යාංශවලින් ලබාගත නොහැකි බවත් ය. භෞතික කාර්යසාධන දර්ශක නොමැතිකම, මූල්‍ය වියදම් සැබෑවට දැනෙන නිමැවුම් සහ ප්‍රතිඵල බවට පරිවර්තනය වී තිබේද යන්න පිළිබඳ අර්ථවත් තක්සේරුවක් කිරීම සීමා කරයි.

සඵලතාව අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීම සඳහා, සියලුම අමාත්‍යාංශ මූල්‍ය හා භෞතික ප්‍රගතියෙහි දත්ත ක්‍රමානුකූලව ප්‍රකාශයට පත් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම අධීක්ෂණ අභ්‍යාසය සම්පූර්ණ භෞතික කාර්යසාධන තොරතුරු ලද පසු, කාර්තු තුනේම දත්ත ඇතුළත් කරමින් 2025 සඳහා ඒකාබද්ධ වාර්ෂික තක්සේරුවක් ඉදිරිපත් කිරීමට අදහස් කරයි.

## අමාත්‍යාංශවල කාර්යසාධනය සහ අදාළ බලධාරීන්ගේ ක්‍රියාකාරකම්

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාවට නැංවීම සඳහා වගකිව යුතු ප්‍රධාන නියෝජිතායතන වන්නේ අමාත්‍යාංශ බැවින්, රජයක ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ දී අමාත්‍යාංශ විසින් කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සම්පත් වෙන් කරන බව, ක්‍රියාකාරකම් සිදුකරන බව, සහ ප්‍රගතිය මනිනු ලබන බව සහතික කරමින්, ආංශික කැපවීම් සඳහා සෑම අමාත්‍යාංශයක්ම සෘජුවම වගකිව යුතුය. අමාත්‍යාංශ විසින් සඵලදායී ලෙස අධීක්ෂණය කිරීම, ක්‍රියාත්මක කිරීමේ දී ඇති හිඩැස්, ප්‍රමාදවීම් සහ අභියෝග හඳුනා ගැනීමට උපකාරීවන අතරම, රජයේ ආයතන හරහා සම්බන්ධීකරණය ද සහතික කරයි. කලට වේලාවට නිකුත් කරන වාර්තා සහ ප්‍රතිපෝෂණය ලබා දීමෙන්, අමාත්‍යාංශ, විනිවිදභාවය, වගවීම සහ සිය ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙරෙහි රජය දක්වන කැපවීම පිළිබඳ සමස්ත විශ්වසනීයත්වය ගොඩනැගීමට දායක වේ.

මෙම විශ්ලේෂණයේ දී, අමාත්‍යාංශවල භෞතික කාර්යසාධනය දෙවන අදියර තුළ නිරීක්ෂණය කරයි. අමාත්‍යාංශවල කාර්යසාධනය තක්සේරු කිරීම සඳහා අමාත්‍යාංශ උපායමාර්ගික සැලසුම් (2025-2029), ප්‍රගතිය අධීක්ෂණ කිරීමේ රාමුව මත පදනම් වූ 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම් සහ කාර්තුමය ප්‍රගති වාර්තා වැනි මූලාශ්‍ර පරීක්ෂා කරනු ලැබේ. අමාත්‍යාංශ 25 සඳහාම තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) යටතේ එම ලේඛන ඉල්ලා අයදුම්පත් ඉදිරිපත් කරන ලදී.

මෙම අදියරේ දී 'ක්ලීන් ශ්‍රී ලංකා' (Clean Sri Lanka) මුලපිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (Commission to Investigate Allegations of Bribery or Corruption -CIABOC) විසින් දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, 2025 නොවැම්බර් මාසයේ දී රටට බලපෑ සුළි කුණාටුව වන දිට්වා සඳහා රජයේ ප්‍රතිචාර මෙහෙවරට සමගාමීව, අලුතින් දියත් කරන ලද "රටම එකට-විෂ මත්ද්‍රව්‍ය මුලිනුපුටා දැමීමේ ජාතික මෙහෙයුම" යන ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාර්තාව සමාලෝචනය කරයි.

### 1.3.5 සීමාවන්

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්, ජාතික ප්‍රතිපත්ති රාමුවට ඒකාබද්ධ කිරීම තුළින්, ඒවා කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස අමාත්‍යාංශවලට උපදෙස් දෙමින් රජය චක්‍රලේඛ නිකුත් කර ඇත. කෙසේවෙතත්, උපායමාර්ගික සැලසුම් සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් (ක්‍රියාකාරී සැලසුම්) සකස් කිරීම අමාත්‍යාංශ මට්ටමින් ප්‍රමාද වී ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) යටතේ කළ ඉල්ලීම් හරහා ලබාගත් තොරතුරු වලට අනුව, වාර්තා කරන විට, අමාත්‍යාංශ තුනක් (03) පමණක් සිය උපායමාර්ගික සැලසුම් සම්පූර්ණ කර තිබුණි.

- අමාත්‍යාංශවල කාර්යසාධන දත්ත රැස් කිරීම අභියෝගාත්මක බව පැහැදිලි විය. අමාත්‍යාංශ 25 න් මෙම විශ්ලේෂණය සඳහා අවශ්‍ය අවම තොරතුරු ලබා දී ඇත්තේ අමාත්‍යාංශ 15 ක් පමණි. තොරතුරු දැනගැනීමේ අයිතිය රාමුව යටතේ දත්ත ඉල්ලුම් කළ අතර, ප්‍රතිචාර සැලකිය යුතු ලෙස වෙනස් විය. සමහර අමාත්‍යාංශ විසින් සීමිත තොරතුරු ප්‍රමාණයක් ලබා දී තිබුණු අතර, බොහෝ පිළිතුරු අසම්පූර්ණ, අපැහැදිලි හෝ ඉල්ලා සිටි නිශ්චිත තොරතුරු ආමන්ත්‍රණය කර නොතිබුණි. මෙම තත්ත්වය මෙම වාර්තාවේ වගුවකින් නිරූපණය කර ඇති අතර, එය විශ්ලේෂණයේ විස්තර සහිත බව සහ ගැඹුර සීමා කර ඇත.

- පළමු අදියරේ දී මෙන්, මෙම වාර්තාව සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ පොදු වසමෙහි (Public Domain) නිල මාධ්‍ය නිවේදන ලෙස ප්‍රකාශයට පත් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ මත ය. අමාත්‍ය මණ්ඩල සංදේශවල (Cabinet Memoranda) අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලද කරුණු සම්බන්ධයෙන් වඩාත් සවිස්තරාත්මක පසුබිම් තොරතුරු සහ වැදගත් සන්දර්භය අඩංගුවන බව පැහැදිලි වේ. ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අනුමත අමාත්‍ය මණ්ඩල තීරණ වඩාත් සවිස්තරාත්මකව ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි ලෙස තිබීමෙන්, විනිවිද භාවය ඉහළ නැංවීමට සහ රජයේ ක්‍රියාකාරිත්වයන් වඩාත් ගැඹුරින් විශ්ලේෂණය කිරීමට හැකිවනු ඇත.

- මෙම වාර්තාව සකස් කරන අවස්ථාවේ දී, තුන්වන කාර්තුවේ ප්‍රගති වාර්තා පමණක් ලැබී තිබුණු අතර, දෙවන සහ තුන්වන කාර්තු වාර්තා පවා සියලුම අමාත්‍යාංශ සඳහා ලබාගත නොහැකි විය. සිව්වන කාර්තුවේ කාර්යසාධන දත්ත තවමත් ලැබී නොමැති අතර, එබැවින් ඒවා මෙම අධීක්ෂණ ක්‍රියාවලියේ මීළඟ වාර්තාවට ඇතුළත් කරනු ඇත.

# 2


# රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දළ විශ්ලේෂණය: 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්'

**"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්"** යන දැක්ම සහිතව ජාතික ජන බලවේගය (NPP) රජය පිහිටුවා ඇත. රජයේ ප්‍රකාශිත ප්‍රතිපත්තිමය ප්‍රමුඛතා සහ අපේක්ෂිත ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇත. මෙම දැක්මෙහි හරය වන්නේ: සුවපහසු රටක පරිසමාප්ත ජීවිතයක්, සුරක්ෂිත රටක ගෞරවනීය ජීවිතයක්, පොහොසත් රටක නවීන ජීවිතයක්, සහ නොසැලෙන රටක අභිමානවත් ජීවිතයක් සහතික කිරීමේ අභිලාෂයයි.

මෙම මූලික අපේක්ෂාවන් හතර **ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර** (National Key Result Areas-NKRAs) සාක්ෂාත් කර ගැනීම සඳහා වන මෙහෙවරෙහි රාමුව ලෙස ක්‍රියා කරයි. මෙම රාමුව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත ඉලක්ක ලෙස, **උප-ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර 39 ක්** හඳුනාගෙන ඇත. ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර (NKRAs) අතරින්, **ආර්ථිකය** වැඩිම සැලසුම් ගත ක්‍රියාකාරකම් සංඛ්‍යාවක් (604) වාර්තා කරන අතර, **ප්‍රජාව** (335), **ආණ්ඩුකරණය** (213) සහ **සමාජ** (181) ජාතික ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍ර සාපේක්ෂව අඩු ක්‍රියාකාරකම් පරිමාවන් පිළිබිඹු කරයි.


රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, සංවර්ධනය කේන්ද්‍ර කරගත් පොරොන්දු 437 ක්, ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් පොරොන්දු 455 ක් සහ සංවර්ධනය සහ ප්‍රතිපත්ති කේන්ද්‍ර කරගත් පොරොන්දු 441 ක් අඩංගු වේ.

මේ අනුව, මුළු පොරොන්දුවලින් තුනෙන් එකක ප්‍රමාණයක් ප්‍රතිපත්ති කෙරෙහි නැඹුරු වූ පොරොන්දු වේ. එයින් පෙන්නුම් කරන්නේ එම පොරොන්දු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය දායකත්වයක් නොමැතිව හෝ අඩු මූල්‍ය දායකත්වයකින් ආරම්භ කළ හැකි බවයි. ඒ හා සමානව, මුළු පොරොන්දුවලින් තවත් තුනෙන් එකක ප්‍රමාණයක් සංවර්ධනය කෙරෙහි නැඹුරු වූ ඒවාවන අතර, ඒ සඳහා මූල්‍ය ආයෝජන සහ කාල රාමු අවශ්‍ය වේ. ඉතිරි පොරොන්දු, ප්‍රතිපත්ති හා සංවර්ධන අංශ දෙකම ආවරණය කරන අතර, ඒවා සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අභිප්‍රාය සහ ප්‍රමාණවත් ආයෝජනය අවශ්‍ය වේ.




රූප සටහන 1 රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවල දිශානතිය

සමස්තයක් වශයෙන්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පුළුල් පරාසයක තේමාත්මක ක්ෂේත්‍ර හරහා පැතිරී ඇති **කැපවීම් 1,333** ක් අඩංගු වේ. මේවාට ඇතුළත් වන්නේ: අධ්‍යාපනය (78), සෞඛ්‍ය (55), නිවාස (12), ක්‍රීඩා (30), කලා හා සංස්කෘතිය (71), ඉතිහාසය (7), පරිසරය (65), මාධ්‍ය (15), සමාජ ආරක්ෂණය (40), ශ්‍රමය (24), කාන්තාවන් (20), ළමයින් (15), තරුණයින් (37), වැඩිහිටියන් (9), ආබාධ සහිත පුද්ගලයින් (34), සාර්ව ආර්ථිකය (83), කෘෂිකර්මය (52), පශු සම්පත් (21), ධීවර කටයුතු (68), ඩිජිටල් රාජ්‍යය (16), පර්යේෂණ හා සංවර්ධන (55), සංචාරක ව්‍යාපාරය (40), කර්මාන්ත (56), මැණික් හා ඛනිජ (38), බලශක්තිය (42), ප්‍රවාහනය (47), සමුද්‍ර ව්‍යාපාර (15), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (30), ඉඩම් (24), ඉදිකිරීම් (19), ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (15), රාජ්‍ය මූල්‍ය (14), අධිකරණ පද්ධතිය (23), මහජන ආරක්ෂාව (14), බන්ධනාගාර (13), මතින් තොර සමාජය (8), රාජ්‍ය තාන්ත්‍රිකභාවය (84), ජාතික ආරක්ෂාව (27), සහ විශ්වීය කැපවීම් (20) යනාදියයි.




**රූප සටහන 2 ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක් එක් අංශය යටතේ ඇති පොරොන්දු සංඛ්‍යාව**

කෙසේ වෙතත්, 2025 මාර්තු මාසයේදී අමාත්‍ය මණ්ඩල තීරණයක් හරහා, රජය විසින් ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව ලෙස විධිමත්ව පිළිගනු ලැබීය. ඒ අනුව, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 1,333 ක්‍රියාකාරකම් 1,385 කට පරිවර්තනය කරන ලද අතර, පසුව ක්‍රියාකාරකම් 1,474 ක් ලෙස අමාත්‍යාංශ 25 ක් හරහා බෙදා හරිනු ලැබ ඇත. කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට පහසු වන පරිදි, සීමිත ක්‍රියාකාරකම් කිහිපයක් අමාත්‍යාංශ එකකට වඩා වැඩි ගණනකට පවරා ඇත. පහත දක්වා ඇති පරිදි මෙම ක්‍රියාකාරකම් **අමාත්‍ය මණ්ඩල අමාත්‍යාංශ 25 ක්** හරහා ලැයිස්තුගත කර ඇත:

| අංකය | අමාත්‍යාංශය | අමාත්‍යාංශ අතර බෙදා හරින ලද පොරොන්දු සංඛ්‍යාව | % |
|---|---|---|---|
| 1 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක | 139 | 10% |
| 2 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන | 108 | 8% |
| 3 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග | 107 | 8% |
| 4 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන | 95 | 7% |
| 5 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය | 94 | 7% |
| 6 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු | 82 | 6% |
| 7 | ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම | 81 | 6% |
| 8 | පරිසර | 76 | 5% |
| 9 | බලශක්ති | 68 | 5% |
| 10 | ධීවර, ජලය හා සාගර සම්පත් | 66 | 5% |
| 11 | තරුණ කටයුතු සහ ක්‍රීඩා | 64 | 5% |
| 12 | කාන්තා හා ළමා කටයුතු | 59 | 4% |
| 13 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන | 55 | 4% |
| 14 | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන | 50 | 4% |
| 15 | මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු | 45 | 3% |
| 16 | ආරක්ෂක | 42 | 3% |
| 17 | ඩිජිටල් ආර්ථික | 37 | 3% |
| 18 | නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන | 33 | 2% |
| 19 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා | 33 | 2% |
| 20 | වරාය හා සිවිල් ගුවන්සේවා | 28 | 2% |
| 21 | විද්‍යා හා තාක්ෂණ | 28 | 2% |
| 22 | කම්කරු හා විදේශ රැකියා | 25 | 2% |
| 23 | වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන | 21 | 2% |
| 24 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන | 20 | 1% |
| 25 | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් | 18 | 1% |
| | එකතුව | 1,474 | |

වගුව 1 එක් එක් අමාත්‍යාංශය යටතේ ඇති පොරොන්දු ගණන සහ අයවැය වැඩසටහන්/ව්‍යාපෘති

# 3

# අමාත්‍ය මණ්ඩල තීරණ සහ ප්‍රතිපත්ති ප්‍රකාශනය කෙරෙහි අනුකූලතාව (2025 ජුනි-දෙසැම්බර්)

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීමේ දී, අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. මන්දයත්, ඒවා දේශපාලන කැපවීම්, විධිමත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බවට පරිවර්තනය කරන බැවිනි. සාමූහික තීරණ ගැනීම හරහා, අමාත්‍ය මණ්ඩලය යෝජනා අනුමත කිරීම, සම්පත් වෙන් කිරීම සහ අවශ්‍ය නීතිමය සහ පරිපාලන රාමු ස්ථාපිත කිරීම සිදු කරයි. හොඳින් සම්බන්ධීකරණය කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අමාත්‍යාංශ හරහා ප්‍රතිපත්තිමය සංගතභාවය සහතික කරයි, ඒවා එකිනෙක අතිච්ඡාදනය වීම අඩු කරයි, සහ වගවීම ශක්තිමත් කරයි, එමඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු සහ ප්‍රායෝගික ආණ්ඩුකරණය අතර තීරණාත්මක සම්බන්ධයක් ඇති කරයි.

මෙම අධීක්ෂණ අභ්‍යාසයේ පළමු අදියරේ දී, 2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා කාලය තුළ ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ සමාලෝචනය කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ, මුළු අමාත්‍ය මණ්ඩල තීරණ 299 ක් ගනු ලැබ ඇති බවට වාර්තාවන අතර, ඉන් තීරණ 216 ක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සමග උචිතවන ආකාරය ඇගයීම සඳහා යොදා ගන්නා ලදී.

දෙවන අදියරේ දී 2025 ජුනි සිට දෙසැම්බර් දක්වා ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ තක්සේරු කරන ලදී. මෙම කාලය තුළ **අමාත්‍ය මණ්ඩල තීරණ 457** ක් නිකුත්කොට ඇති අතර, ඉන් **27** ක් නීත්‍යනුකූලව නියම කරන ලද තීරණ පිළිබිඹු කරමින් ව්‍යවස්ථාපිත ස්වභාවයක් ගත් ඒවා විය. ඉතිරි අමාත්‍ය මණ්ඩල තීරණ **430** ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් සමග උචිතවන ආකාරය ඇගයීම සඳහා යොදා ගන්නා ලදී. එම ඇගයීමෙන් සොයාගත් පරිදි:

22% ක් **අතිශයින් උචිත** වූ අතර, අභිප්‍රාය සහ අන්තර්ගතය යන දෙකෙන්ම නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ඍජුව සහ නිවැරදිව ක්‍රියාත්මක කිරීම පෙන්නුම් කරයි;

31% ක් **උචිත** වූ අතර, නිශ්චිත පොරොන්දු වලට සැමවිටම හරියටම අනුරූප නොවුවත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි තේමාවන් සමග සැලකිය යුතු අනුකූලතාවක් පෙන්නුම් කරයි;


23% ක් **අර්ධ වශයෙන් උචිත** වූ අතර, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉලක්ක සමග සම්බන්ධයක් යෝජනා කරන නමුත්, අපේක්ෂිත විෂය පථයෙන් කොටසක් පමණක් ආමන්ත්‍රණය කරයි, නැතහොත් සීමිත ආකාරයකින් එසේ කරයි;

24% ක් **උචිත නොවන** අතර, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රකාශිත ප්‍රමුඛතා සමග පැහැදිලි සම්බන්ධයක් නොපෙන්වයි.

සමස්තයක් වශයෙන්, තක්සේරු කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ වලින් **76% ක්** ප්‍රතිපත්ති ප්‍රකාශනයට උචිතබව පෙන්නුම් කළ අතර, කැපවීම් සෘජුවම ක්‍රියාත්මක කිරීම තුළින් **22% ක්** ඉහළ සහ **31% ක්** සැලකිය යුතු මට්ටමේ ප්‍රතිපත්ති අනුකූලතාවයක් පිළිබිඹු කළේය. කෙසේ වෙතත්, අර්ධ වශයෙන් උචිත (23%) සහ උචිත නොවන තීරණ (24%) සාපේක්ෂව ඉහළ අනුපාතයකින් පෙන්නුම් කරන්නේ, සැලකිය යුතු අමාත්‍ය මණ්ඩල ක්‍රියාකාරිත්වයන් සංඛ්‍යාවක්, පෙර රජයේ මුලපිරීම් අඛණ්ඩව පවත්වාගෙන යාමට සම්බන්ධ බව හෝ අවස්ථායික සහ පරිපාලන අවශ්‍යතා වලින් පැන නගින බවයි. මෙම සොයාගැනීම්වලින්, මෙම සීමාවන් තිබියදී පවා, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කළ හැකි ආකාරයේ රජයේ ප්‍රතිපත්තිවලට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් රජයේ ඇති අරමුණ යෝජනා කරයි.

| අමාත්‍ය මණ්ඩල තීරණ සංඛ්‍යාව | උචිතබව | ප්‍රතිශනය (ආසන්න %) |
|---|---|---|
| 95 | අතිශයින් උචිත | 22 |
| 132 | උචිත | 31 |
| 100 | අර්ධ වශයෙන් උචිත | 23 |
| 103 | උචිත නොවන | 24 |
| **430** | | **100** |

වගුව 2 අනුකූලතා ඇගයීමේ සාරාංශය




රූප සටහන 3 පොරොන්දුවලට අනුකූල වීම පිළිබඳ උචිතබවේ ප්‍රතිශත

# 4

# ජාතික අයවැය සහ අමාත්‍යාංශ හරහා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සඳහා ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන

## 4.1 ආයතනික සැලසුම්කරණය සහ කාර්යසාධනය කළමනාකරණය

වත්මන් රජය සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යුහගත ආයතනික සැලසුම් සහ කාර්යසාධන කළමනාකරණ රාමුවකට මුලපුරා ඇත.

**ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස :** 2025 මාර්තු 3 වැනි දින "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික ප්‍රතිපත්ති රාමුව ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් විධිමත්ව අනුගත කරගන්නා ලදී. ඒ අනුව, සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන මෙම රාමුව සමග තම සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලීන් අනුකූල කරගැනීමට උපදෙස් දෙන ලදී.

**කාර්යසාධන අධීක්ෂණ චක්‍රලේඛය:** 2025 මාර්තු 24 වන දින, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් PS/SB/Circular/03/2025 යන අංකය සහිත චක්‍රලේඛය නිකුත් කරන ලද අතර, සියලුම අමාත්‍යාංශ වලට ප්‍රගති අධීක්ෂණ රාමුවට සහ 2025-2029 සඳහා උපායමාර්ගික සැලසුම් වලට අනුකූලව ඔවුන්ගේ 2025 ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී.

**අනිවාර්ය සැලසුම්කරණය සහ වාර්තා කිරීම:** සියලුම අමාත්‍යාංශ විසින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පැහැදිලිව ඇතුළත් කරන උපායමාර්ගික සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යාංශ කාර්යසාධන අධීක්ෂණ පද්ධතිය (MPMS) හරහා කාර්තුමය පදනමක් මත ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වාර්තා කළ යුතු ය.

**ආයතනික අධීක්ෂණ යාන්ත්‍රණ:** රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ උපායමාර්ගික තීරණ ගැනීම කඩිනම් කිරීම සඳහා 2024 දෙසැම්බර් 30 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 11 දෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය ආයෝජන අධීක්ෂණ සහ ඇගයීම් කමිටුවක් පත් කරන ලදී.

**ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණය:** කාර්යසාධන වගවීම සහ ප්‍රතිඵල මත පදනම් වූ ක්‍රියාත්මක කිරීම (outcome-oriented implementation) ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණ (RBM) ප්‍රවේශයක් හඳුන්වා දීමට රජය 2025 ඔක්තෝබර් 7 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් ද ගෙන ඇත. අමාත්‍ය ප්‍රතිඵල රාමු, එක් එක් අමාත්‍යාංශයේ ධුරාවලි වගකීම් වලට අනුකූලව, අදාල විෂය පථය තුළ සංවර්ධන ඉලක්ක කාලෝචිත ලෙස මුදුන්පත් කර ගැනීමට උපකාරී වේ. එමගින් ජනතාවට අපේක්ෂිත නිමැවුම් සහ ප්‍රතිලාභ කාලෝචිත ලෙස ලබාදීම, ආර්ථික අංශ අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ රාජ්‍ය ආයෝජන කෙරෙහි මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම සහතික කරයි.[1] රාජ්‍ය අංශයේ ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණය ආයතනගත කිරීම සහ අමාත්‍ය ප්‍රතිඵල රාමු එක් එක් අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සහ අයවැය ක්‍රියාවලියේ උපායමාර්ගික අදියර වලට ඒකාබද්ධ කිරීම සහ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත.

**උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන්:** උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත් කෙටුම්පතට යෝජිත සංශෝධන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමටත්, පසුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, රජය විසින් 2025 ඔක්තෝබර් 21 වන දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ගන්නා ලදී.

2025 දෙසැම්බර් 17 වන දින, පාර්ලිමේන්තුව විසින් 2025 අංක 26 දරන උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත අනුමත කරන ලදී. උපරිම බදු විරාමය අවුරුදු 25 සිට අවුරුදු 10 දක්වා අඩු කිරීම, අධීක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම, සහ උපායමාර්ගික ආයෝජන සඳහා වඩා දැඩි අනුකූලතා අවශ්‍යතාවන් අනිවාර්ය කිරීම ඇතුළු ප්‍රධාන වෙනස්කම් කිහිපයක් සංශෝධන මඟින් යෝජනා කරන ලදී.

මෙම පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වය, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති සංවර්ධන අරමුණු ප්‍රගමනය කිරීම සඳහා කඩිනම් පියවරක් ලෙස සැලකිය හැකිය. කෙසේවෙතත්, මෙම සංශෝධනවලින් පැන නැඟිය හැකි යම් ප්‍රතිවිපාක දැනට පවතින අධීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලියේ කොටසක් ලෙස වෙන වෙනම තක්සේරු කළ යුතු ය.

## 4.2 අමාත්‍යාංශවල කාර්යසාධනය පිළිබඳ දත්ත එක්රැස් කිරීම

ඉහත ආයතනික විධිවිධාන වලට අනුකූලව, මෙම තෙවන පාර්ශ්වීය අධීක්ෂණ අභ්‍යාසය, 2025 දෙසැම්බර් 31 දින වන විට ලබාගත හැකි පරිදි, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුව, 2025 සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛයක් මඟින් ඉල්ලා සිටී.

ඉහත ආයතනික විධිවිධානවලට අනුකූලව, මෙම තෙවන පාර්ශවීය නිරීක්ෂණ ක්‍රියාවලිය මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම ඇගයීමට උත්සාහ කරයි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ප්‍රතිපත්ති රාමුව, ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛයක් මඟින් ඉල්ලා සිටින 2025-2029 කාලසීමාව සඳහා වූ උපායමාර්ගික සැලැස්ම (Strategic Plan), 2025 සඳහා ක්‍රියාකාරී සැලැස්ම (Action Plan), සහ 2025 වර්ෂය සඳහා කාර්තුමය ප්‍රගති වාර්තා (දෙවන සහ තෙවන කාර්තු, පිළිවෙලින් ජූනි 30 සහ සැප්තැම්බර් 30 දිනවලින් අවසන් වන) 2025 දෙසැම්බර් 31 වන දිනට ලබාගත හැකි පරිදි සමාලෝචනය කරනු ලැබේ. අධීක්ෂණ කණ්ඩායම නිල මාර්ගගත වේදිකා සහ තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) යටතේ කළ ඉල්ලීම් හරහා මෙම ලේඛන එක් රැස් කිරීමට උත්සාහ කරන ලදී. අවශ්‍ය කළ ලියකියවිලි රැස් කිරීමේ තත්ත්වය පහත වගුව මගින් දැක්වේ.

පහත වගුව මගින් උපායමාර්ගික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් සහ කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ කැපවීම්වල තත්ත්වය ඉදිරිපත් කරයි. මෙම ලේඛන ඵලදායී ප්‍රතිඵල මත පදනම් වූ කළමනාකරණ රාමුවක අත්‍යවශ්‍ය සංරචකවන අතර, විධිමත් ආයතනික මූලාශ්‍ර වලින් ලබාගත් දත්ත තිබීම, කාලානුරූපී වීම සහ නිරවද්‍යතාවය මත අධීක්ෂණ අභ්‍යාසය දැඩි ලෙස රඳා පවතී.

ස්ථාවර සහ ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි තොරතුරු සහ ලියකියවිලි නොමැති විට, ප්‍රගතිය වෛෂයිකව සහ පුළුල් ලෙස තක්සේරු කිරීමේ හැකියාව සීමා වේ. වාර්තාකරණ අනුකූලතාව ශක්තිමත් කිරීම සහ අනුමත සැලසුම් සහ ප්‍රගති වාර්තා නියමිත කාලසීමාවන්ට අනුව ප්‍රකාශයට පත් කිරීම සහතික කිරීම මගින් අධීක්ෂණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරනු ඇත.

1 https://www.cabinetoffice.gov.lk/cab/index.php?option=com_content&view=article&id=16&Itemid=49&lang=en&dID=13461

| අංකය | අමාත්‍යාංශය | ව්‍යාපෘති කළමණාකරන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත අමාත්‍යාංශ ප්‍රතිඵල රාමුව (2025-2029) | උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම) | කාර්තුමය ප්‍රගති වාර්තාව (QPR) 2025 | | | 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | |
| 01 | නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන | | | | | | | |
| | ජල සම්පාදනය | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| | නිවාස | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 02 | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන | | | | | | | |
| | ප්‍රවාහන | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| | මහාමාර්ග | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| | නාගරික සංවර්ධනය | ලැබී ඇත. | ලැබුණි | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 03 | වරාය හා සිවිල් ගුවන් සේවා | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබුණි | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 04 | පරිසර | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 05 | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් | | | | | | | |
| | වැවිලි | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. |
| | ප්‍රජා යටිතල පහසුකම් | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. |
| 06 | කාන්තා හා ළමා කටයුතු | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 07 | ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණය සහ ප්‍රජා සවිබල ගැන්වීම | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |

| අංකය | අමාත්‍යාංශය | ව්‍යාපෘති කළමණාකරන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත අමාත්‍යාංශ ප්‍රතිඵල රාමුව (2025-2029) | උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම) | කාර්තුමය ප්‍රගති වාර්තාව (QPR) 2025 | | | 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | |
| 08 | කෘෂිකර්ම, පශු සම්පත් | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. |
| 09 | විද්‍යා හා තාක්ෂණ | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 10 | බලශක්ති | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 11 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 12 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 13 | වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 14 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 15 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 16 | මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |

| අංකය | අමාත්‍යාංශය | ව්‍යාපෘති කළමණාකරන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත අමාත්‍යාංශ ප්‍රතිඵල රාමුව (2025-2029) | උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම) | කාර්තුමය ප්‍රගති වාර්තාව (QPR) 2025 | | | 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | |
| 17 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 18 | ධීවර, ජලජ හා සාගර සම්පත් | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 19 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 20 | කම්කරු | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 21 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | ලැබී ඇත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 22 | ඩිජිටල් ආර්ථික | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 23 | තරුණ කටයුතු සහ ක්‍රීඩා | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | ලැබී ඇත. |
| 24 | ආරක්ෂක | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 25 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන | ලැබී ඇත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |

වගුව 3 අමාත්‍යාංශ 25 කින් අවශ්‍ය ලියකියවිලි එක් රැස් කිරීමේ තත්ත්වය

# 5

# 2025 ජාතික අයවැය ක්‍රියාවට නැංවීම පිළිබඳ ඇගයීම

## 5.1 2025 ජාතික අයවැයේ ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ දළ විශ්ලේෂණය

රජයක් තම දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් සහ මහජන සේවාවන් බවට පරිවර්තනය කරන ප්‍රධාන මෙවලම ජාතික අයවැයයි. එබැවින් පොරොන්දු වූ කැපවීම් ප්‍රමාණවත් ලෙස මූල්‍යකරණය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අයවැය අධීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. අයවැය අධීක්ෂණය මඟින් සම්පත් වෙන් කිරීම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමුඛතා සමඟ අනුකූලවී තිබේද යන්න තක්සේරු කිරීමට, ප්‍රතිපත්තිමය අභිප්‍රායයන් සහ සැබෑ වියදම් අතර පරතරයන් හඳුනා ගැනීමට සහ ප්‍රතිඵල සඳහා ආයතනික වගවීම ශක්තිමත් කිරීමට උපකාරී වේ. අයවැය සකස් කිරීමේදී විනිවිදභාවය සහ වගවීම, මහජන විශ්වාසය වර්ධනය කරමින්, ප්‍රතිපත්ති කාලෝචිතව ක්‍රියාත්මක කිරීම සහ උද්භව වන අර්බුද අවස්ථාවලදී වේගවත් ප්‍රතිචාර දැක්වීමට හැකියාව සලසයි.

2024 නොවැම්බර් සිට 2025 මැයි දක්වා සීමිත අධීක්ෂණ කාලය සැලකිල්ලට ගනිමින්, අධීක්ෂණයේ පළමු අදියර ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ නිමැවුම් කෙරෙහි ය. දෙවන අදියර, 2025 ජූනි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය  ආවරණය කරමින්, ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමේ දී අමාත්‍යාංශවල කාර්යසාධනය නිරීක්ෂණයට අදහස් කෙරේ. කෙසේ වෙතත්, රජය වෙනස් වීමෙන් පසු 2025 අයවැය ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් පළමු කාර්තුමය ප්‍රගති වාර්තාව සකස් නොකළ අතර, වාර්තාකරණ කාලය 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්ව තිබියදීත්, දිට්වා ව්‍යසනයේ ප්‍රතිඵලයක් ලෙස සිව්වන කාර්තුමය ප්‍රගති වාර්තා ලබාගත නොහැකිව පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අමාත්‍යාංශවලට අදාළ කැපවීම් ක්‍රියාත්මක කර ඇති ප්‍රමාණය ඇගයීම සඳහා තක්සේරුව දෙවන සහ තුන්වන කාර්තුමය ප්‍රගති වාර්තා මත රඳා පවතී.

කෙසේ වෙතත්, ලිපි ලේඛන ලැබී ඇත්තේ අමාත්‍යාංශ 25 අතරින් 15 කින් පමණකි. එසේ වුවද, හැකිතාක් දුරට පවතින සියලුම ලේඛන භාවිතා කරමින් නිරීක්ෂණ සහ විශ්ලේෂණය සිදු කරන ලදී.

## 5.2 2025 ජාතික අයවැය සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්

ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් 133 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2025 දී අයවැය යෝජනා ඉදිරිපත්කොට ඇත. මෙම අධීක්ෂණ ප්‍රයත්නය මඟින් එම පොරොන්දු ක්‍රියාවට නැංවීම තක්සේරු කිරීමට උත්සාහ කර ඇත. කෙසේ වෙතත්, දත්ත ලබා ගැනීමේ සීමාවන් සහ සවිස්තරාත්මක, වෙන් කරන ලද වාර්තාකරණයක් නොමැතිකම හේතුවෙන්, ව්‍යාපෘති මට්ටමින් මෙම විශ්ලේෂණය සිදු කිරීමට නොහැකි වී ඇත.

සමස්ත අයවැය වෙන් කිරීම් සහ මූල්‍ය ප්‍රගතිය නිල මූලාශ්‍ර හරහා හඳුනාගත හැකි වුවද, භෞතික ප්‍රගතිය සහ නිමැවුම් මට්ටමේ ජයග්‍රහණ පිළිබඳ තොරතුරුවලට බොහෝ දුරට ප්‍රවේශ විය නොහැකි විය. අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ සඵලතාව සහ ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම පිළිබඳ පුළුල් තක්සේරුවක් කිරීම මෙම හිඩැස/පරතරය මගින් සීමා කළේය.

## 5.3 අමාත්‍යාංශ අනුව ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

### 1. අධ්‍යාපන අමාත්‍යාංශය

#### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, රජයේ ප්‍රධාන අමාත්‍යාංශවලින් එකක් වන අතර, එම අමාත්‍යංශයේ අමාත්‍ය ධූරය දරනු ලබන්නේ වර්තමාන අග්‍රාමාත්‍යවරිය විසිනි. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ, අධ්‍යාපන ක්ෂේත්‍රය "ශිෂ්ටසම්පන්න පුරවැසියෙක්-දියුණු මානව සම්පතක්" යන තේමාව යටතේ ආමන්ත්‍රණය කර ඇත. ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු 1,333 න් 78 ක් මෙම තේමාව යටතේ පිහිටා ඇති අතර, එය තේමාත්මක ක්ෂේත්‍ර 16 ක් පුරා විහිදේ.

කෙසේ වෙතත්, ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ, ලැයිස්තුගත කර ඇති මුළු ක්‍රියාකාරකම් 1,385 න්, අධ්‍යාපනයට අදාළ කැපවීම් සංඛ්‍යාව 108 දක්වා වැඩි වී ඇත. විශේෂයෙන්, මූලිකව කාන්තා හා ළමා කටයුතු, ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු යටතේ වර්ගීකරණය කර තිබූ පොරොන්දු කිහිපයක් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට නැවත වෙන් කර ඇති අතර හෝ ද්විතීයකරණයට ලක්ව ඇත.


#### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගත හැකිභාවය

සියලුම අංශ අතරින් ඉහළම කැපවීම් සංඛ්‍යාවක් ඇත්තේ මේවාට වන අතර, එය මුළු ක්‍රියාකාරකම්වලින් ආසන්න වශයෙන් 8% ක් පමණ වේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සහ ප්‍රතිපත්ති රාමුව තුළ අධ්‍යාපනයට ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දී ඇති බව මෙයින් පැහැදිලි වේ. මෙම අවධාරණය තිබියදීත්, 2025-2029 ක්‍රියාත්මක කිරීමේ කාලය සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම තවමත් සකස් වෙමින් පවතින අතර, 2025 සඳහාවන ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හෝ ජාතික ප්‍රතිපත්ති රාමුවේ කැපවීම් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය කර නොතිබුණි. කෙසේ වෙතත්, ලැයිස්තුගත පොරොන්දු ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂය තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් 157 ක් සම්මත කරන ලදී.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාලය තුළ, මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 29 ක් ඉදිරිපත්කොට ඇත. ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර, එමඟින් විවිධ ප්‍රතිපත්ති මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට හැකි වී ඇත. අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙනී යන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අතිශයින් උචිත වන්නේ අමාත්‍ය මණ්ඩල තීරණ තුනක් (03) පමණක් බවත්, පහක් (5) උචිත බවත්, හතක් (7) අර්ධ වශයෙන් උචිත බවත්, සහ දහහතරක් (14) ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් වලට සෘජුවම උචිත නොවන බවත් ය.





රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම


2025 ජාතික අයවැය යටතේ, අධ්‍යාපන අංශය සඳහා රුපියල් මිලියන 273,339 ක වෙන්කොට ඇති අතර, එය මුළු අයවැයෙන් 3.09% ක් වේ. අධ්‍යාපනය හා සම්බන්ධ කැපවීම් 157 ක් අනුරූප අයවැය ප්‍රතිපාදන සමඟ ප්‍රකාශයට පත් කරන ලද අතර, 75.89% ක් පුනරාවර්තන වියදම් සඳහා සහ 24.11% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කොට ඇත.

2026 අයවැය සඳහා 2025 අයවැය ප්‍රතිපාදන හා සසඳන විට, රුපියල් මිලියන 303,850 ක ප්‍රතිපාදන යෝජනා කර ඇති අතර, 76.96% ක් පුනරාවර්තන වියදම් සඳහා සහ 23.04% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇත. කෙසේ වෙතත්, සම්පූර්ණ අරමුදල් ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 3.09% සිට 3.38% දක්වා කුඩා දියුණුවක් දක්නට ලැබේ.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී, අමාත්‍යාංශයට රුපියල් මිලියන 273,339 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා වැය කර තිබුණේ රුපියල් මිලියන 147,491 ක් පමණකි. එය ආසන්න වශයෙන් 54% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරයි. තවද, අමාත්‍යාංශයෙන් භෞතික ප්‍රගතිය පිළිබඳ සාරාංශයක් තවමත් ලැබිය යුතුව ඇත.




**රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)**

අධ්‍යාපනය හා සම්බන්ධ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් මඟින් සංස්කෘතිය පුළුල් හා ගතික කලාපයක් ලෙස පිළිගන්නා අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සහ ළමා හිතකාමී ඉගෙනුම් පරිසරයක් තුළ ජීවන කුසලතා සහ දැනුම පෝෂ්‍ය කිරීම යන මේවා දැඩිව අවධාරණය කරයි. තවදුරටත් තීරණාත්මක කැපවීමක් වන්නේ අධ්‍යාපන වියදම් ක්‍රමානුකූලව දළ දේශීය නිෂ්පාදිතයෙන් (Gross Domestic Product-GDP) 6% දක්වා ඉහළ නැංවීමේ ප්‍රතිඥාව සමඟින් අධ්‍යාපනය සඳහා රාජ්‍ය ආයෝජන ශක්තිමත් කිරීමයි. කෙසේ

වෙතත්, 2025 ජාතික අයවැයෙන් අධ්‍යාපනයට දළ දේශීය නිෂ්පාදිතයෙන් 1% කට ආසන්න මුදලක් වෙන් කර ඇති බව සඳහන් කර ඇත.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කොටසක් ලෙස, අමාත්‍යාංශය විසින් අදහස් විමසීමේ වැඩමුළු 20 ක් පවත්වා ඇති අතර, ප්‍රතිසංස්කරණ යෝජනාවක් 2025 ජූලි 24 වැනි දින විවාදය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, 6 ශ්‍රේණිය සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම මුලින් සැලසුම් කළ පරිදි සම්පූර්ණ කර නොමැත. එය 2027 දක්වා කල් දමා ඇති අතර, 1 ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණ 2026 ජනවාරි සිට ආරම්භ කිරීමට නියමිත ය. ඒ අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමේ සමස්ත තත්ත්වය අර්ධ වශයෙන් ක්‍රියාත්මක වූවක් ලෙස තක්සේරු කෙරේ.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | ජාත්‍යන්තරව ශ්‍රේණිගත විශ්වවිද්‍යාල වල උපාධි හැදෑරීම සඳහා උසස් පාසල් උපාධිධාරීන් සඳහා වසරකට ශිෂ්‍යත්ව 200 ක් පිරිනැමීම | ✓ | ✓ | ✓ |
| 02 | ළමා හිතකාමී අධ්‍යාපනික පරිසරයක් තුළ ජීවන කුසලතා සහ දැනුම පෝෂණය කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ | ✓ | ✓ | ✓ |
| 03 | අවම පහසුකම් පවත්වා ගැනීම සඳහා පාසල් වලට භෞතික හා මානව සම්පත් ලබා දීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 37 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ළඟා කරගෙන ඇති පොරොන්දු ලැයිස්තුගත කර ඇති අතර, ඉතිරිය ඇමුණුම-2 හි දක්වා ඇත.

## 2. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

සෞඛ්‍ය අමාත්‍යාංශය මහජන කේන්ද්‍රීය හා සේවා අරමුණු කරගත් ආයතනයක් වන අතර, එය මාධ්‍ය අංශ සමඟ ද සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වේ. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ, මාධ්‍ය තේමාත්මක ක්ෂේත්‍රය තුළ කැපවීම් 15 කට අමතරව, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කැපවීම් 55 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වගකීම දරයි. සෞඛ්‍ය අංශය හා සම්බන්ධ කැපවීම් 94 ක් පමණ ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ක්‍රියාකාරකම් ලෙස වර්ගීකරණය කර ඇති බව අධීක්ෂණය තවදුරටත් පෙන්වා දෙයි.

සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කැපවීම් අතරට, කෙටි කාලයක් තුළ සෞඛ්‍ය සඳහා රජයේ වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 3% දක්වා ක්‍රමයෙන් වැඩි කිරීම, රාජ්‍ය අරමුදල් කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් යුතුව භාවිතා කිරීම සහ සෞඛ්‍ය අංශය තුළ දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ඇතුළත් වේ. රජය සිය නිල කාලයෙහි දෙවන වසරට පැමිණ ඇති බැවින්, 2025 දී සෞඛ්‍ය සඳහා වෙන් කර ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.6% ක් පමණි.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව


තවදුරටත් අධීක්ෂණ සොයාගැනීම් වලින් හෙළිදරව් වන්නේ, ජාතික ප්‍රතිපත්ති රාමුව සෞඛ්‍ය අංශයේ කැපවීම් 94 ක් ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන ඇතත්, 2025-2029 ක්‍රියාත්මක කිරීමේ කාලය සඳහා උපායමාර්ගික සැලැස්ම තවමත්

සකස් කරමින් පවතින බවයි. සමාලෝචන කාල සීමාව තුළ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලද අතර, එය 2025 සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනය හෝ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ කැපවීම් ප්‍රමාණවත් ලෙස ආවරණය කර නොමැත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 59 ක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණු බවත්, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසුණු බවත්, අධීක්ෂණ නිරීක්ෂණ වලින් පෙන්නුම් කරයි. සමාලෝචනය කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණවලින්, 25 ක් ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දුවලට අතිශයින් උචිත බවත්, 13 ක් උචිත බවත්, 12 අර්ධ වශයෙන් උචිත බවත්, 08 සෘජුව උචිත නොවන බවත් තක්සේරු කර ඇත.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

මීට අමතරව, 2025 ජාතික අයවැය හරහා සෞඛ්‍ය හා සම්බන්ධ කැපවීම් 122 ක් ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒ සඳහා රුපියල් මිලියන 519,541 ක් වෙන්කොට ඇති අතර, එය මුළු අයවැයෙන් 5.8% කි. ප්‍රතිපාදන වලින් 81.61% ක් පුනරාවර්තන වියදම් සඳහාවන අතර, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇත්තේ 18.39% ක් පමණි. මෙයින් පෙන්නුම් කරන්නේ යටිතල පහසුකම් සංවර්ධනය සහ දිගුකාලීන පද්ධති ශක්තිමත් කිරීම සඳහා සීමිත මූල්‍ය ඉඩක් ඇති බවයි. 2026 ජාතික අයවැයේ දියුණුවක් ඇති අතර, එහිදී මුළු ප්‍රතිපාදනවලින් 6.18% ක් සමඟ රුපියල් මිලියන 555,100 ක් වෙන් කරන ලද නමුත්, ප්‍රාග්ධන පුනරාවර්තන වියදම් අනුපාතය බොහෝ දුරට එලෙසම පවතී.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය වෙන් කිරීම

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 519,541 ක් වෙන් කරන ලදී. 2025 වසර සඳහා වැය කළ මුදල් සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

මාධ්‍ය අංශය සම්බන්ධයෙන්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා කරන විධිවිධාන ඉවත් කිරීම ඇතුළුව, 2024 අංක 09 දරන මාර්ගගත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ කැපවීමට අදාළව කමිටුවක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණද, එම පොරොන්දුව සම්බන්ධයෙන් තවමත් කටයුතු කරමින් පවතින අතර, එය විධිමත් ලෙස ක්‍රියාත්මක කර නොමැත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|
| 01 | පවුල් වෛද්‍ය ඒකක ප්‍රදේශයන්හි රෝගීන්ට විශේෂිත සෞඛ්‍ය සේවා සැපයීම සඳහා පර්යන්ත සායනික සේවා (විශේෂිත උපදේශකයින්ගේ පැමිණීම්) ස්ථාපිත කිරීම (Satellite Clinics) | ✓ | ✓ |
| 02 | සහ ප්‍රතිඵල අර්ථකථනය කිරීම සඳහා වෛද්‍යවරයෙකුගේ සහ හෙද නිලධාරියෙකුගේ සේවය පැය 24 පුරා දුරකථන මාර්ගයෙන් ලබා ගත හැකි වන ක්‍රමවේදයක් | ✓ | ✓ |
| 03 | මනෝ, කථන, ශ්‍රව්‍ය, වෘත්තීය සහ ප්‍රජා භෞතචිකිත්සා සඳහා පහසුකම් ස්ථාපිත කිරීම | ✓ | ✓ |
| 04 | සෑම දිස්ත්‍රික්කයකම/පළාතකම පහසුකම් සහිත විස්තීර්ණ හෘද රෝග ඒකකයක්, විස්තීර්ණ පිළිකා සත්කාර ඒකයක්, අක්ෂි සත්කාර ඒකකයක් සහ වකුගඩු සත්කාර ඒකකයක්. | ✓ | ✓ |
| 05 | දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා වගා කිරීම් සහ පර්යේෂණ දිරිමත් කෙරේ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 63 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ දැක්වෙන්නේ එක් සන්ධිස්ථානයක් පමණක් ළඟා කරගත් පොරොන්දුවන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම 2 හි ලැයිස්තු ගත කර ඇත.

## 3. නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රමුඛතා ලෙස සෑම පුරවැසියෙකුටම සෞඛ්‍ය සම්පන්න නිවසක් සැපයීම, ඵලදායී ඉඩම් කළමනාකරණය සහ පුළුල් නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවධාරණය කරයි. නිවාස අංශය තුළ, නව ජීවිත නිවාස, නාගරික නිවාස, ග්‍රාමීය නිවාස සහ වතු නිවාස යන තේමාත්මක කාණ්ඩ හතරක් යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් 12 ක් හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, වතු නිවාස සම්බන්ධ කැපවීම් පසුව වැවිලි හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයට යළි පවරා ඇත.

නව ජීවිත නිවාස කාණ්ඩය යටතේ, අලුත විවාහ වූ යුවළයන්ට නිවාස ඉදිකිරීම හෝ මිලදී ගැනීම සඳහා මූල්‍ය ආධාර සැපයීමට යෝජනා කර ඇත. මෙම පොරොන්දුවට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

නිවාස කටයුතුවලට අමතරව, ඉදිකිරීම් සහ ජල සම්පාදන කාර්යයන් සඳහා අමාත්‍යාංශය වගකිව යුතු වේ. ඉදිකිරීම් අංශය යටතේ, කැපවීම් 19 ක් හඳුනාගෙන ඇති අතර, ජල සැපයුමට අදාළ කැපවීම් සීමිත සංඛ්‍යාවක් පමණක් පර්යේෂණ හා සංවර්ධන කාණ්ඩයට අයත් වේ. ඉදිකිරීම් සම්බන්ධ කැපවීම් කිහිපයක් ප්‍රසම්පාදන ක්‍රියාවලීන් කෙරෙහි අවධානය යොමු කරයි. මෙයට රාජ්‍ය අංශයට අදාළවන ප්‍රමිතිගත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි හඳුන්වා දීම ද ඇතුලත් වේ.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙනී යන්නේ, නිවාස කාර්යයන් මීට පෙර නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ නියම කර තිබූ අතර, එතැන් සිට නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය යටතේ ආයතනීකරණය කර ඇති බැවින්, සමස්තයක් වශයෙන්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් 33 ක් දැනට ජාතික ප්‍රතිපත්ති රාමුවේ සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්මේ පිළිබිඹුවන බවයි. 2026-2028 කාලය තුළ අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව මඟ පෙන්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ද සකස් කර ඇත.

"පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්"යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පහත සඳහන් කැපවීම් ප්‍රකාශයට පත් කර ඇතත්, ඒවා ජාතික ප්‍රතිපත්ති රාමුවට නිශ්චිතව ඇතුළත් කර නොමැත:

- ජාතික සංවර්ධන සැලසුම් වලට අනුකූලව ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාවය දීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- සියලුම රාජ්‍ය ආයතන ඒකාකාර සහ ප්‍රමිතිගත රාජ්‍ය ප්‍රසම්පාදන රාමුවකට අනුගත වන බව සහතික කිරීම.

### ජල සම්පාදනය

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ලැබී ඇත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |


## නිවාස කටයුතු

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ලැබී ඇත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාලය තුළ, මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් ඉදිරිපත්කොට ඇති අතර, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසී ඇත. අධීක්ෂණ විශ්ලේෂණයෙන් පෙනී යන්නේ, අමාත්‍ය මණ්ඩල තීරණ දෙකක් (2) ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත වන බවත්, දෙකක් (2) උචිත බවත්, (2) දෙකක් අර්ධ වශයෙන් උචිත බවත්, (4) හතරක් උචිත නොවන බවත් තක්සේරු කර ඇති බවයි.


රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ




## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම


2026 දී නිවාස ඒකක 31,000 ක් පමණ ඉදිකිරීමේ රජයේ සැලැස්මට අනුකූලව, දිට්වා ආපදා හා සම්බන්ධ බලපෑම් හේතුවෙන් පැන නගින නිවාස ඒකක 20,000 කට වැඩි ප්‍රමාණයක අතිරේක අවශ්‍යතාවයක් සමඟ, Rebuilding Sri Lanka ක්‍රියාවලිය 2026 සඳහා අමාත්‍යාංශයේ කේන්ද්‍රීය වැඩසටහනක් ලෙස මතු වී තිබේ.

2025 ජාතික අයවැය හරහා නිවාස හා සම්බන්ධ කැපවීම් 50 ක් ප්‍රකාශයට පත්කොට ඇත. රු.104,268.00 ක ප්‍රමාණයකින් 2.93% ක් පුනරාවර්තන වියදම් සඳහාවන අතර, 97.09% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇති අතර, මෙම කැපවීම් එකම අනුපාතයකින් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා 2026 අයවැය යටතේ රුපියල් මිලියන 101,212 ක් වෙන්කොට ඇත.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය වෙන් කිරීම**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 104,268 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 26,613 ක් වැය කර ඇති අතර, දළ වශයෙන් 31% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරයි. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.




**රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (තුන්වන කාර්තුව අවසානය වන විට)**

2025 ජාතික අයවැය හරහා නිවාස හා සම්බන්ධ කැපවීම් 50 ක් ප්‍රකාශයට පත්කොට ඇත. රුපියල් මිලියන 104,268.00 ක ප්‍රතිපාදන වලින් 2.93% ක් පුනරාවර්තන වියදම් සඳහා වන අතර, 97.09% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කොට ඇත. 2026 අයවැය යටතේ රුපියල් මිලියන 101,212 ක් වෙන් කර ඇත්තේ එම අනුපාතයෙන්ම මෙම කැපවීම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ය.

කෙසේ වෙතත්, ජල සම්පාදනය අත්‍යවශ්‍ය සේවාවක් බව සටහන් වී ඇති නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒ වෙනුවෙන් නිශ්චිත පොරොන්දු දැකගත නොහැක.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | කොළඹ නගරයේ මුඩුක්කු සහ පැල්පත් නිවාසවල ජීවත්වන ජනතාවට රාජ්‍ය මැදිහත්වීමෙන් සුදුසු නිවාස | ✓ | ✓ | ✓ |
| 02 | නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල, සෞඛ්‍ය, අධ්‍යාපන, ක්‍රීඩා, ප්‍රවාහන, උද්‍යාන ආදී පහසුකම් සහිත අංග සම්පූර්ණ නිවාස ව්‍යාපෘති | | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 08 ක් එය අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් සපුරා ඇති පෙරොන්දු දක්වා ඇති අතර, ඉතිරි පොරොන්දු අමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 4. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ළමා කටයුතුවලට අදාළ කැපවීම් වලට මඟ පෙන්වන මූලික සංකල්පීය රාමුව ලෙස "සුරක්ෂිත ළමා ලෝකයක්, නිර්මාණශීලී අනාගත පරපුරක්" යන්න ප්‍රකාශයට පත් කර ඇත. මෙම කැපවීම්වලට සහාය දෙන ප්‍රධාන මූලධර්ම අතරට ජාත්‍යන්තර සම්මුතීන්, විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (The UN Convention on the Rights of the Child-UNCRC) සමඟ අනුකූලවන නෛතික හා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම ; අපයෝජනයෙන් සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වයෙන් දරුවන්ගේ නිදහස, සුරක්ෂිතතාව සහ ආරක්ෂණය සහතික කිරීම; ප්‍රමාණවත් රැකවරණය සහ පෝෂණය ලබාදීම; සහ සියලුම දරුවන්ගේ සමස්ත යහපැවැත්ම සහ සාකල්‍ය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම ඇතුළත් වේ.

අධීක්ෂණ සොයා ගැනීම්වලින්, ළමුන් හා කාන්තාවන් සම්බන්ධ කැපවීම් සැලකිය යුතු සංඛ්‍යාවක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් සමඟ අනිච්ඡාදනය වන අතර, එමගින් ශක්තිමත් අමාත්‍යාංශ-හරහාවන සම්බන්ධීකරණ යාන්ත්‍රණයක අවශ්‍යතාවය අවධාරණය කරයි. ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ, "සුරක්ෂිත ළමා ලෝකයක්, නිර්මාණශීලී අනාගත පරපුරක්" යන තේමාව යටතේ කැපවීම් 15 ක් ලැයිස්තු ගත කර ඇත. තවත් අමතර කැපවීම් නවයක් "මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනය"යන තේමාව යටතේ ඇතුළත්වන අතර, පොරොන්දු 20 ක් කාන්තාවන් කේන්ද්‍ර කරගත් ඒවා විය.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

මෙම කැපවීම් අධ්‍යාපන අංශය සමඟ තේමාත්මකව අනුකූලව ඇතත්, ළමයින් හා කාන්තාවන් සම්බන්ධ කැපවීම් 59 ක් ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇත. අධීක්ෂණය කරන අවස්ථාවේ දී, අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම තවමත් සකස් කරමින් පැවතුන අතර, ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සම්පූර්ණ කර ඇත.

කාන්තා කටයුතු සම්බන්ධයෙන්, "ආර්තව දරිද්‍රතාව (period poverty) අවසන් කිරීම වෙනුවෙන් අවශ්‍ය බඳු සහන, මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබාදීම" සඳහාවන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනක් හරහා ක්‍රියාත්මක කර ඇති අතර, 2025 ජාතික අයවැය හරහා එයට අයවැය ප්‍රතිපාදන ලැබී තිබේ. එසේම, ළමා හිතකාමී ඉගෙනුම් පරිසරයක් තුළ ජීවන කුසලතා සහ දැනුම පෝෂ්‍ය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහාවන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම, ළමා කටයුතු යටතේ ලැයිස්තු ගත කර ඇතත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන වැඩසටහන් ක්ෂේත්‍රයකින් සමන්විත වේ. කෙසේ වෙතත්, අධීක්ෂණයේ දී සිදුකළ නිරීක්ෂණ මගින් මෙම ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වා දුන් හය වන ශ්‍රේණියේ ඉංග්‍රිසි විෂය මොඩියුලය පිළිබඳ ගැටළු සටහන් කර ඇති අතර, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රකාශිත අරමුණු සමග එහි අනුකූලතාවය පිළිබඳව ගැටළු මතු වී ඇත.


“පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්” යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පහත සඳහන් කැපවීම් ප්‍රකාශයට පත් කර ඇතත්, ඒවා ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පැහැදිලිව පිළිබිඹු වී නොමැත:

- සමරිසි කාන්තා, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික සහ අවිනිශ්චිත (LGBTIQ+) ප්‍රජාවන් සඳහා සෞඛ්‍ය සේවා, නීති ආධාර, සමාජ ආරක්ෂණය සහ යුක්තිය ඇතුළු රාජ්‍ය සේවාවන් සඳහා සාධාරණ ප්‍රවේශය පුළුල් කිරීම.
- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විවිධ අනන්‍යතා ඇති පුද්ගලයින් සමග කටයුතු කිරීමේ දී නීතිය බලාත්මක කරන නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ට මග පෙන්වීම සඳහා, පැහැදිලි මෙහෙයුම් ප්‍රමිතීන් සමග චර්යාධර්ම සංග්‍රහයක් සකස් කිරීම සහ ආයතනගත කිරීම.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 11 ක් ඉදිරිපත්කොට ඇති අතර, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට හැකි වී ඇත. මෙම අමාත්‍ය මණ්ඩල තීරණ වලින් හතරක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත වන බවත්, තුනක් උචිත බවත්, තුනක් අර්ධ වශයෙන් උචිත බවත්, එකක් උචිත නොවන බවත් තක්සේරු කරන ලදී.




**රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ**


## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය හරහා කාන්තා හා ළමා කටයුතු යටතේ කැපවීම් 23 ක් ප්‍රකාශයට පත්කොට ඇති අතර, ඒවා ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා රුපියල් මිලියන 16,328 ක මුදලක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, අධීක්ෂණ විශ්ලේෂණයෙන් පෙන්නුම් කරන්නේ මෙම වෙන් කිරීම්වලින් ආසන්න වශයෙන් 94% ක් පුනරාවර්තන වියදම් වන අතර, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇත්තේ 5% පමණක් බවයි. මෙහිදී ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අපේක්ෂා කරන වැඩසටහන් පුළුල් කිරීම සහ දිගුකාලීන ව්‍යුහාත්මක මැදිහත්වීම් සඳහා සම්පත් ප්‍රමාණවත් ද යන්න පිළිබඳව ගැටළු මතු කරයි. 2026 ජාතික අයවැයෙන් ද සංඛ්‍යා ලේඛනවලින්ද මේ හා සමාන තත්ත්වයක් පිළිබිඹු කරයි.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනර්වර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 16,328 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, දළ වශයෙන් 55% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරමින්, වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 9,016 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

## ප්‍රතිපත්ති ප්‍රකාශයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | තරුණ විවාහක පිරිස් සඳහා නව නිවසක් මිලදී ගැනීමට හෝ නිවසක් ඉදිකර ගැනීමට මූල්‍ය පහසුකම් ලබාදීම | ✓ | ✓ | ✓ |
| 02 | ආබාධ සහිත දරුවන්, වීදි දරුවන් සහ පාසල් නොයන දරුවන් ඇතුළු අවදානම් සහිත දරුවන් කලින් හඳුනා ගැනීම සහ මැදිහත්වීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 20 ක් මෙහිදී අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් ළඟා වී ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 5. ක්‍රීඩා සහ තරුණ කටයුතු අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ක්‍රීඩා අංශය සඳහා මූලික මාර්ගෝපදේශක මූලධර්ම ලෙස සහභාගිත්වය, විනය, විශ්වාසය, තරඟකාරිත්වය, වෘත්තීයභාවය සහ ජාත්‍යන්තර විශිෂ්ටත්වය යනාදිය හඳුනාගෙන ඇත. ප්‍රමාණවත් යටිතල පහසුකම් සංවර්ධනය, ක්‍රීඩා සඳහා සාධාරණ ප්‍රවේශය, ජාත්‍යන්තර සහයෝගීතාවය සහ රාජ්‍ය නියෝජිතායතන, පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධාන අතර සහයෝගීතාවය සඳහාවන කැපවීම් හරහා මෙම මූලධර්ම තවදුරටත් ශක්තිමත් වේ. මෙම රාමුව තුළ, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය, තරුණ තේමා ක්ෂේත්‍රය යටතේ ඇති කැපවීම් 37කට අමතරව, ක්‍රීඩාවට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් 30 ක් ක්‍රියාත්මක කිරීම සඳහා බැඳී සිටී.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ මෙම අමාත්‍යාංශය යටතේ ඇති කැපවීම් 67 ක් ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පිළිබිඹුවන බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාල සීමාව තුළ අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස්කොට තිබුණි. එසේම, මෙම පොරොන්දු ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අමාත්‍යංශය මගින් සකස්කොට ඇත.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පහත සඳහන් කැපවීම් ප්‍රකාශයට පත් කර ඇතත්, ඒවා ජාතික ප්‍රතිපත්ති රාමුවට පැහැදිලිව ඇතුළත් කර නොමැත:

- රාජ්‍යයේ පහසුකම් සැලසීමේ සහාය ඇතිව, සුදුසු සහ ලාභදායී රැකියා අවස්ථා වෙත ප්‍රවේශ වීමට තරුණ තරුණියන්ට ඇති අයිතිය ආරක්ෂා කිරීම.
- පාරිසරික පාලනය සහ තිරසර මුලපිරීම් සඳහා තරුණ තරුණියන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් පාලන මට්ටමින් තරුණ පරිසර කමිටු පිහිටුවීම.


| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබුණි |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ හයක් ඉදිරිපත්කොට ඇත. ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට හැකි වී ඇත. අධීක්ෂණ විශ්ලේෂණයෙන් පෙනී යන්නේ අමාත්‍ය මණ්ඩල තීරණ දෙකක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්වලට අතිශය උචිත ලෙස තක්සේරු කර ඇති අතර, දෙකක් උචිත ලෙස තක්සේරු කර ඇති බවත්, එකක් අර්ධ වශයෙන් උචිත බවත්, එකක් උචිත නොවන බවත්ය.

### අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම


2025 ජාතික අයවැය හරහා රුපියල් මිලියන 12,600 ක ප්‍රතිපාදන සහිතව මුළු කැපවීම් 29 ක් ප්‍රකාශයට පත්කොට ඇත. මෙම කැපවීම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා 2026 අයවැය යටතේ රුපියල් මිලියන 14,300 ක් වෙන් කර





**රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ**

ඇත. මෙහෙයුම් පිරිවැය සහ සංවර්ධන ආයෝජන අතර සාපේක්ෂව සමතුලිත වෙන් කිරීමක් පෙන්නුම් කරමින්, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් අතර අනුපාතය ආසන්න වශයෙන් 55% පුනරාවර්තන සහ 45% ප්‍රාග්ධන වියදම් නොවෙනස්ව පවතී.

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 12,600 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, වසර තුළ නිම කිරීමට නියමිත ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 4,300 ක් පමණක් වැය කර ඇති අතර, එය ආසන්න වශයෙන් 34% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරයි. භෞතික ප්‍රගතිය පිළිබඳ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.




**රූප සටහන: 2025 සහ 2026 දි පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සමඟ, ක්‍රීඩා සහ තරුණ කටයුතු හා සම්බන්ධ කැපවීම් කිහිපයක් අතිච්ඡාදනය වන බව අධීක්ෂණයෙන් හෙළිවන අතර, ඒවා පුනරාවර්තනය වීම වැළැක්වීමට සහ ක්‍රියාත්මක කිරීමේ දී ඒකාබද්ධතාවය සහතික කිරීමට, අමාත්‍යාංශ හරහා ඵලදායී සම්බන්ධීකරණයක අවශ්‍යතාවය අවධාරණය කරයි.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතය, තරඟ පාවාදීම් සහ අනෙකුත් අක්‍රමිකතා ඇතුළු සියලු ආකාරයේ වංචා සහ දූෂණ තුරන් කිරීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීම | ✓ | ✓ | ✓ |
| 02 | රජයේ මැදිහත්වීම හරහා සියලුම පාසල් වලට අවශ්‍ය ක්‍රීඩා උපකරණ සහ පහසුකම් සාධාරණ ලෙස බෙදා හැරීම | ✓ | ✓ | ✓ |
| 03 | ජාතික තරුණ සේවා සභාව සහ එහි ශාඛා, ජාතික යොවුන් සේනාංකය, යෞවන සමාජ ව්‍යාපාරය වැනි රජයේ ආයතන දැනුම, නිපුණතාවය, විනය සහිත ක්‍රියාශීලී නවීන තරුණ නායක නායිකාවන් ගොඩනැගීම අරමුණු කොට ප්‍රතිසංවිධානය කිරීම | ✓ | ✓ | ✓ |
| 04 | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම අංග සම්පූර්ණ ක්‍රීඩා පිටි ඉදිකිරීම | ✓ | ✓ | ✓ |
| 05 | බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා එක්සත් ක්‍රීඩා පුහුණු වැඩසටහනක් සංවර්ධනය කිරීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 37 ක් අධීක්ෂණය කර ඇත. සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් සපුරා ඇති පොරොන්දු ඉහත වගුවේ දක්වා ඇති අතර, ඉතිරි පොරොන්දු ඇමුණුව-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 6. කම්කරු අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ "කාර්යක්ෂම ශ්‍රම සම්පතක්-ගෞරවනීය වෘත්තීය ජීවිතයක්" යන තේමාව ශ්‍රමයට අදාළ කැපවීම් මෙහෙයවන පූර්ණ විෂය පථයක් සහිත තේමාව ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රමයේ ගෞරවය සහ වටිනාකම ආරක්ෂා කිරීම, සේවා ස්ථානයේ සමානව සැලකීම සහ විවිධත්වය ආරක්ෂා කිරීම සහ වෙනස්කොට සැලකීමෙන් තොරව සමාන අවස්ථා ලබාදීම මෙම තේමාවට පාදකවන මූලික ප්‍රතිපත්ති වේ.

වැටුප් විෂමතා අවම කිරීම සහ සේවකයින් දිරිගැන්වීම අරමුණු කරගත් ජාතික වැටුප් ව්‍යුහයක් ස්ථාපිත කිරීම ඇතුළුව, මෙම තේමාව යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 21 ක් ලැයිස්තු ගත කර ඇත. මේ සම්බන්ධයෙන්, 2025 සහ 2026 දී අමාත්‍ය මණ්ඩල තීරණ, පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන් සහ අයවැය වෙන් කිරීම් හරහා ජාතික වැටුප් ව්‍යුහයක් හඳුන්වා දී ඇත. ඊට අමතරව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මාසික වැටුප් සංශෝධන මෙන්ම ජාතික අවම වේතන පනතට සංශෝධන ද බලාත්මක කර ඇත.

කෙසේ වෙතත්, අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙනී යන්නේ, මෙම සංශෝධන දෛනික වැටුප් ලබන සේවකයින්ට සෘජුවම ප්‍රතිලාභ ලබාදී නොමැති බවයි. උඩරට වතු කම්කරුවන්ගේ ජීවන වියදමට සරිලන පරිදි වැටුප් වැඩි කිරීම සඳහා 'ශ්‍රී ලාංකේය ජාතියක්-විශ්වීය පුරවැසියෙක්' යන තේමාව යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වෙනම දක්වා ඇති කැපවීම, ඉහත වැටුප් සංශෝධන හරහා ඵලදායී ලෙස ආමන්ත්‍රණය කර නොමැත. 2026 අයවැයේ විශේෂ නිවේදනයක් මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමට අනුකූලව උඩරට වතු කම්කරුවන්ගේ දෛනික වැටුප් වැඩි කිරීමට යෝජනා කර ඇති අතර, එය ක්‍රියාත්මක කිරීමේ වගකීම කම්කරු අමාත්‍යාංශයට නොව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට පවරා ඇත.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

අධීක්ෂණය තවදුරටත් පෙන්නුම් කරන්නේ, ශ්‍රමය හා සම්බන්ධ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් 24 ම ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේදී, 2026-2028 කාලසීමාව සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, 2025 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණු නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සියලුම කැපවීම් එමගින් සම්පූර්ණයෙන් ආවරණය කර නොතිබුණි.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පහත සඳහන් කැපවීම් ප්‍රකාශයට පත් කර ඇති බවත්, ඒවා ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවත් අධීක්ෂණ අභ්‍යාසය මගින් හඳුනාගෙන ඇත.


- පාසල් විෂය මාලාව තුළ උපාධි මට්ටම දක්වා වෘත්තීය අධ්‍යාපනය ඒකාබද්ධ කිරීම.
- ආර්ථිකය ප්‍රසාරණය වන විට අමතර රැකියා අවස්ථා ඇති කිරීමේ යාන්ත්‍රණයක් සමඟින් දිගුකාලීන රැකියා විරහිත උපාධිධාරීන් හට රැකියා ලබාදීම.
- ගුරු වෘත්තියට පුද්ගලයින් 20,000 ක් බඳවා ගැනීම.
- තොරතුරු තාක්ෂණ අංශය තුළ STEM උපාධිධාරීන් 3,000 ක් සහ STEM නොවන උපාධිධාරීන් 9,000 ක් ස්ථානගත කිරීම.

කෙසේ වෙතත්, යෝජිත රැකියා අවස්ථා ගණන ජාතික ප්‍රතිපත්ති රාමුව තුළින් ඉවත් කර ඇත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ අටක් ඉදිරිපත් කරන ලද අතර, ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. එමගින් තෝරාගත් ශ්‍රමය-ආශ්‍රිත ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසුණි. සමාලෝචනයට ලක් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණවලින් එකක් ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු වලට අතිශයින් උචිත ලෙස තක්සේරු කර ඇති අතර, හතරක් උචිත, එකක් අර්ධ වශයෙන් උචිත සහ දෙකක් උචිත නොවන ලෙස තක්සේරු කරන ලදී.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ


## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

තවද, 2025 ජාතික අයවැය හරහා ශ්‍රමය ආශ්‍රිත කැපවීම් 14 ක් ප්‍රකාශයට පත් කරන ලද අතර, 2025 දී 72% පුනරාවර්තන සහ 18% ප්‍රාග්ධන වියදම් අනුපාතයකින් රුපියල් මිලියන 6,136 ක් වියදම් කරන ලදී. මෙම කැපවීම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා 2026 අයවැය යටතේ රුපියල් මිලියන 6400 ක් ආසන්න වශයෙන් එකම අනුපාතයෙන් වෙන් කර ඇත.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 6,136 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, දළ වශයෙන් 52% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරමින් වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 3,168 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.




**රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)**

### පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රමුඛ පොරොන්දුවක් වන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් වල ව්‍යුහාත්මක වෙනස්කම් ය. ඒ අනුව, පනත් සංශෝධනය කිරීම මගින් කම්කරුවන්ගේ මාසික වැටුප පමණක් නොව දෛනික වැටුප ද වැඩි කරන ලදී. මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා, 2025 අංක 10 දරන කම්කරු අයවැය සහන දීමනා (සංශෝධන) පනත සහ 2025 අංක 9 දරන කම්කරු අයවැය සහන දීමනා (සංශෝධන) පනත අවලංගු කරන ලද අතර, ඒවාට 2005 සහ 2016 අයවැය වලින් අයවැය දීමනා ලබා දී තිබුණි. පසු විපරමක් ලෙස, වැටුප් ව්‍යුහයට මීට පෙර ඇතුළත් කර තිබූ අයවැය දීමනා 2025 අංක 11 දරන ජාතික අවම සේවක වැටුප් (සංශෝධන) පනත මගින් මූලික වැටුප සහ වේතන බවට විපරිවර්තනය කරන ලදී.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | පාර්ලි-මේන්තුව | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|---|
| 01 | කම්කරු ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | ✓ | | ✓ | ✓ |
| 02 | මිනිස්බලය සේවකයින් සඳහා සාධාරණ වැටුප් සහ රැකියා සුරක්ෂිතභාවය සහතික කිරීම (වැටුප් ව්‍යුහය) | ✓ | | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුල පුරන ලද පොරොන්දු 14 ක් එය අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් සපුරා ඇති පොරොන්දු පෙන්නුම් කර ඇති අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 7. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

කෘෂිකාර්මික අංශය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට ආසන්න වශයෙන් 8.4% ක දායකත්වයක් සපයන අතර, මෙම අංශයට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්වල උපායමාර්ගික වැදගත්කම අවධාරණය කරයි. “ඉහළ ඵලදායිතාවක්-ආහාර සුරක්ෂිත රටක්” යන තේමාත්මක ක්ෂේත්‍රය යටතේ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ උප අංශ 10 ක් හරහා කැපවීම් 52 ක් ඇතුළත් වේ. ඊට අමතරව, උප අංශ හතරක් හරහා කැපවීම් 21 ක් “ඉහළ ගුණාත්මක පශු නිෂ්පාදනයක් - ව්‍යවසායකත්ව ප්‍රවේශයක්” යන තේමාව යටතට වැටෙන අතර, තවත් කැපවීම් 24 ක් උප අංශ හතරක් හරහා ඉඩම් සහ වාරිමාර්ගවලට සම්බන්ධ වේ. සාමූහිකව, මෙම කැපවීම් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වරමට අයත් වේ.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයා ගැනීම්වලින් පෙනී යන්නේ කෘෂිකර්මාන්තය, පශු සම්පත්, ඉඩම්, සහ වාරිමාර්ග ආශ්‍රිත කැපවීම් 107 ක් ජාතික ප්‍රතිපත්ති රාමුවට අන්තර්ග්‍රහණය කර ඇති බවත්, එය අධ්‍යාපනයට පසු, සියලුම අංශ අතරින් දෙවන ඉහළම කැපවීම් සංඛ්‍යාව නියෝජනය කරන බවත්, මුළු කැපවීම්වලින් ආසන්න වශයෙන් 8% ක් පමණ වන බවත් ය. සමාලෝචනය කරන අවස්ථාවේදී, 2026-2028 කාලපරිච්ඡේදය සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, සමාලෝචන කාලපරිච්ඡේදය සඳහා ක්‍රියාකාරී සැලැස්ම ලැබීමට නියමිතව තිබුණි.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පහත සඳහන් කැපවීම ජාතික ප්‍රතිපත්ති රාමුවට විශේෂිතව ඇතුළත් කර නොමැති බව අධීක්ෂණ අභ්‍යාසය මගින් හඳුනා ගන්නා ලදී:


- පාරිසරික හෝ සමාජීය වශයෙන් සංවේදී ප්‍රදේශවල ඉඩම් ආරක්ෂා කිරීම.

ප්‍රතිපත්ති ප්‍රකාශනයට එය ඇතුළත් කර තිබියදීත්, මෙම කැපවීම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පිළිබිඹු නොවන අතර, එමගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අභිප්‍රාය සහ විධිමත් ප්‍රතිපත්ති සම්මත කිරීම අතර හිඩැසක්/පරතරයක් පෙන්නුම් කෙරේ.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම - 2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව - Q2 (2025 ජුනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව - Q3 (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව - Q4 (2025 දෙසැම්බර්) | ලැබී ඇත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 25 ක් ඉදිරිපත් කරන ලද අතර, ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබී තිබුණි. එමගින් තෝරාගත් ප්‍රතිපත්තිමය මූලපිරීම් ක්‍රියාත්මක කිරීමට හැකි වී ඇත. සමාලෝචනය කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණවලින් හයක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවලට අතිශයින් උචිත වන බවත්, නවයක් උචිත බවත්, පහක් අර්ධ වශයෙන් උචිත බවත්, පහක් උචිත නොවන බවත් තක්සේරු කරන ලදී.





රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම


අමාත්‍යාංශයට අදාළ කැපවීම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා අයවැය ප්‍රතිපාදන 119 ක් 2025 ජාතික අයවැයට ඇතුළත් කර තිබුණු අතර, ඊට අනුරූපව අමාත්‍යාංශයට රුපියල් මිලියන 218,382 ක ප්‍රතිපාදන වෙන්කොට ඇත.

එය මුළු ජාතික අයවැයෙන් 2.48% කි. ප්‍රතිපාදන වලින් 38.38% ක් සහ 61.62% ක් පිළිවෙලින් පුනර්වර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇත. සංසන්දනාත්මකව, 2026 අයවැය තුළ 2025 අයවැය වෙන් කිරීම රුපියල් මිලියන 229,050.00 ක් වූ අතර, එය වැඩිවීමක් පෙන්නුම් කරයි. පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වල අනුපාතය ආසන්න වශයෙන් සමාන වේ.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනර්වර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 218,382 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, දළ වශයෙන් 44% ක මූල්‍ය ප්‍රගතියක් පිළිබිඹු කරමින් වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 95,642 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.




**රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)**

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | බහුලව පවතින සත්ව රෝග මැඩපැවැත්වීම සඳහා ජාතික වැඩපිළිවෙළක් | ✓ | ✓ | ✓ |
| 02 | කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපාදන ඉහළ නැංවීම | ✓ | ✓ | ✓ |
| 03 | වැව්, ඇළ මාර්ග සහ ගංගා හැරවුම් වැනි ප්‍රධාන වාරිමාර්ග පද්ධතීන් කාලානුරූපව ප්‍රතිසංස්කරණය | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 43 ක් අධීක්ෂණයට ලක් කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් මුදුන්පත් කර ගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 8. ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

ශ්‍රී ලංකාවේ ධීවර අංශය, සමුද්‍ර ධීවර කර්මාන්තය, අභ්‍යන්තර (මිරිදිය) ධීවර කර්මාන්තය සහ ජලජීවී වගා කර්මාන්තය යන ප්‍රධාන සංරචක තුනකින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය අධිකරණ බල සීමාවට ආසන්න වශයෙන් වර්ග කිලෝමීටර් 517,000 ක විශේෂ ආර්ථික කලාපයක් (Exclusive Economic Zone -EEZ) ඇතුලත් වේ. ඊට අමතරව, රට තුළ පුළුල් අභ්‍යන්තර සහ වෙරළබඩ ජල සම්පත් ඇති අතර, ආසන්න වශයෙන් වර්ග කිලෝමීටර 21,500 ක අභ්‍යන්තර ජල මූලාශ්‍ර, වර්ග කිලෝමීටර 1,580 ක කලපු සහ මෝය, සහ වර්ග කිලෝමීටර 5,200 ක ජලාශ වලින් සමන්විත වේ.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අංශයට අදාළව ආසන්න වශයෙන් කැපවීම් 68 ක් දක්වා ඇත. ජීවී සහ අජීවී සාගර සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම, නීල ආර්ථික ප්‍රවේශයක් හරහා නවීන සාගරය මත පදනම් වූ කර්මාන්ත ස්ථාපිත කිරීම සහ 2028 වන විට විසිතුරු මත්ස්‍ය හා ජලජ ශාක අපනයනයෙන් ලැබෙන ආදායම 25% කින් වැඩි කිරීමේ ඉලක්කයක් ඇතුළුව, ගෝලීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකික වෙළඳ සන්නාමයක් සංවර්ධනය කිරීම යන මේවා ප්‍රධාන කැපවීම් අතර වේ.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව

මෙම අමාත්‍යාංශයේ වරම යටතේ ජාතික ප්‍රතිපත්ති රාමුවට විවිධ අංශ හා සම්බන්ධ කැපවීම් 66 ක් ඇතුළත් කර ඇති බව අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙන්නුම් කරයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාල පරිච්ඡේදය සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, එය අධීක්ෂණ අරමුණු සඳහා තවමත් විධිමත් ලෙස ලැබිය යුතුව ඇත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් ඉදිරිපත්කොට ඇති අතර, ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇත. එමඟින් තෝරාගත් ප්‍රතිපත්තිමය මූලපිරීම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසී ඇත. සමාලෝචනය කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ අතරින්, දෙකක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත යැයි තක්සේරු කරන ලදී. කැපවීම් හතක් උචිය යැයි තක්සේරු කරන ලද අතර, එකක් අර්ධ වශයෙන් උචිත විය.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ


## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

ජාතික අයවැය මගින් මෙම අමාත්‍යාංශයට රුපියල් මිලියන 11,684.30 ක් වෙන්කොට ඇති අතර, එයින් 53% ක් පුනරාවර්තන ද, 47% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වේ. 2026 අයවැය තුළ යෝජනා 18 ක් ඇත. 2026 අයවැය යටතේ රුපියල් මිලියන 11,800 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇති අතර, එයින් ආසන්න වශයෙන් 35% ක් පුනරාවර්තන වියදම් සඳහා සහ 65% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇති අතර, එමඟින් ආයෝජන කෙරෙහි නැඹුරු වූ මැදිහත්වීම් කෙරෙහි සාපේක්ෂව ශක්තිමත් අවධාරණයක් පෙන්නුම් කරයි.




**රූප සටහන: 2025 සහ 2026 පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමග මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 11,684 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, දළ වශයෙන් 46% ක මූල්‍ය ප්‍රගතියක් පිළිබිඹු කරමින් වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 5,374 ක් වෙන්කොට ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.




**රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානය වන විට)**

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | දැනට දැඩි පසු බෑමකට ලක්ව ඇති සමුද්‍රීය ධීවර කටයුතු යථාවත් කිරීම සඳහා, මූල්‍ය සහ තාක්ෂණික සහය ලබාදීම | ✓ | ✓ | ✓ |
| 02 | උතුරු හා නැගෙනහිර පළාත් ආශ්‍රිතව එහි ජනතාව ඉලක්ක කොට ගත් බහුදින ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා වරාය පුළුල් කිරීම හා පහසුකම් වැඩි දියුණු කිරීම | ✓ | ✓ | ✓ |
| 03 | නීතිවිරෝධී ධීවර කටයුතු අධෛර්යමත් කිරීම, සමුද්‍රීය අනතුරු සහ දූෂණයන් අවම කිරීම සහ හදිසි ප්‍රතිචාර හා සමුද්‍රීය විපත් අවම කිරීම සඳහා යාන්ත්‍රණයන් | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 21 ක් එය අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් මුදුන්පත් කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 9. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය මෙහෙයවනු ලබන්නේ "ඩිජිටල් රාජ්‍යකරණයක්-ජාත්‍යන්තර හවුල්කාරිත්වයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තේමාවෙනි. එය නවෝත්පාදනයන් මගින් මෙහෙයවනු ලබන තිරසර ආර්ථික වර්ධනය, රාජ්‍ය සේවාවන්හි ඩිජිටල් විපර්වර්තනය, ශ්‍රී ලංකාවේ වෙළඳපල අනන්‍යතාවය යළි සන්නාමගත කිරීම, ඩිජිටල් ආර්ථිකය තුළ අවස්ථා උපයෝගී කර ගැනීම, උසස් තාක්ෂණයන්, හොඳම භාවිතයන් සහ වෙළඳපල ප්‍රවේශය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම, සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඇතුළු ප්‍රධාන මූලධර්ම මගින් ශක්තිමත් වී ඇත.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ මෙම තේමාත්මක ක්ෂේත්‍රය යටතේ ඇති කැපවීම් 37 ක් ජාතික ප්‍රතිපත්ති රාමුවේ ලැයිස්තු ගත කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාලය සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, 2025 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, අධීක්ෂණ අරමුණු සඳහා තවමත් විධිමත් ලෙස ලැබී නොතිබුණි.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ අටක් ඉදිරිපත් කරන ලදී. ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණු අතර, එමඟින් තෝරාගත් කැපවීම් පිළිබඳ ප්‍රගතිය ලබා ගැනීමට පහසුකම් සැලසිණි. සමාලෝචනය කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ අතරින් තුනක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත වන බවත්, දෙකක් උචිත බවත්, දෙකක් අර්ධ වශයෙන් උචිත බවත්, එකක් උචිත නොවන බවත් තක්සේරු කරන ලදී.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අමාත්‍යාංශ අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

මෙම තේමාත්මක රාමුව යටතේ, ප්‍රතිපත්ති ප්‍රකාශනය අමාත්‍යාංශයේ වරම තුළ පවතින කැපවීම් 37 ක් සංක්ෂිප්ත කර දක්වා ඇති අතර, ඒ සඳහා අයවැය වැඩසටහන් සහ ව්‍යාපෘති 16 කින් සහාය ලැබේ. 2025 ජාතික අයවැය මඟින් අමාත්‍යාංශයට රුපියල් මිලියන 16,623 ක් වෙන් කර ඇති අතර, ඉන් 59% ක් ප්‍රාග්ධන වියදම් සඳහා සහ 41% ක් පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර ඇත. තවද, 2026 ජාතික අයවැය මඟින් ඩිජිටල් යටිතල පහසුකම් සහ ඩිජිටල් විපරිවර්තන මුලපිරීම් කෙරෙහි සුළුවෙන් ආයෝජන කිරීමේ නැඹුරුවක් පෙන්නුම් කරන අතර, ඒ හේතුවෙන් ප්‍රාග්ධන වියදම 59% සිට 61% දක්වා ඉහළ ගොස් තිබේ.





**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 16,623 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ආසන්න වශයෙන් 18% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරමින් වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 2,535 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.

විද්‍යුත් ප්‍රසම්පාදනය ඇතුළත් ඩිජිටල් පාදක ආණ්ඩුකරණය සහ ශක්තිමත් රාජ්‍ය අධීක්ෂණ යාන්ත්‍රණයක් මගින් රාජ්‍ය මූල්‍ය කාර්යක්ෂමතාව, විනිවිදභාවය, යහපාලනය සහ වගවීම වැඩි දියුණු කිරීම හා අනවශ්‍ය රාජ්‍ය වියදම් කපා හැරීම පොරොන්දුවලින් එකකි. 2026 ජාතික අයවැය තුළ ඇති අයවැය වෙන් කිරීම හරහා ඉහත පොරොන්දුව ක්‍රියාත්මක කිරීමට රජය අදහස් කරයි.

ප්‍රතිපත්ති සඳහා විශාල වශයෙන් මුදල් වෙන්කිරීම් මගින් ඊට ශක්තිමත් සහායක් ලබාදී ඇත. 2026 අයවැය මඟින් ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන සහ ගෙවීම් පද්ධති පුළුල් කිරීම සඳහා ඩිජිටල්කරණය සඳහා වන බිලියන 30 ක ප්‍රමාණයේ විශාල මුදලක් වෙන් කර ඇත.

මාධ්‍ය වාර්තා අනුව, 2026 ජූලි 1 වැනිදා සිට මධ්‍යම රජයේ සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (Integrated Treasury Management Information System-ITMIS) පද්ධතිය හරහා නිකුත් කරන මිලදී ගැනීමේ ඇණවුම් පමණක් භාවිත කළ යුතු බව රජය නියම කර ඇත.




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

"නවෝත්පාදන දිරිමත් කරන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කරන, සහ දත්ත පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සහතික කරන ආධාරක නියාමන රාමුවක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව, රජය 2025 මාර්තු 17 වන දින පුද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට සහ ඉන් පසුව, 2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබේ. ඒ අනුව, නියාමන අධීක්ෂණය ශක්තිමත් කිරීම, අනුකූලතාවය වැඩිදියුණු කිරීම සහ ඩිජිටල් ආර්ථිකය නංවාලීම සඳහා 2025 ඔක්තෝබර් 30 වන දින පාර්ලිමේන්තුව විසින් 2025 අංක 22 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත අනුමත කර ඇත. කෙසේ වෙතත්, මෙම පනත බලාත්මක කිරීම තවමත් සිදු වී නොමැත.[□] තවද, ශ්‍රී ලංකාව තුළ සයිබර් ආරක්ෂාව සඳහා ජාතික මට්ටමේ නීතිමය රාමුවක් නොමැත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහිකිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 10 ක් එය අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් මුදුන්පත් කරගෙන ඇති පොරොන්දු ලැයිස්තුගත කර ඇත; ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 10. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තේමාව වන "උදාර සංස්කෘතික ජීවිතයක්-සහකම්පනීය ජනතාවක්" යන්න සංස්කෘතික කටයුතු සඳහා පුළුල් සහ පූර්ණ විෂය පථයක් සහිත රාමුවක් සපයයි. මෙම තේමාව ප්‍රධාන මූලධර්ම මඟින් මෙහෙයවනු ලැබේ, ඒවාට ඇතුළත් වන්නේ:

- සෑම ප්‍රජාවකටම තම සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීමට සහ සංවර්ධනය කිරීමට ඇති අයිතිය;
- සංස්කෘතික සංවර්ධනය සඳහා ක්‍රියාකාරීව සහභාගි වීමට ප්‍රජාවන්ට සහ පුද්ගලයන්ට ඇති අයිතිය;
- අන්තර් සංස්කෘතික වශයෙන් සාරවත් කිරීම සහ විකසනය;
- දේශීය හා ගෝලීය සංස්කෘතික දැනුම මත පදනම් වූ බුද්ධිමය, අධ්‍යාත්මික සහ සෞන්දර්යාත්මක හැකියාවන් සහිත සානුකම්පිත පුද්ගලයින්ගේ වර්ධනය;
- සංස්කෘතික විවිධත්වය පිළිගැනීම සහ නිර්මාණාත්මක සංස්කෘතික විචාරණය ප්‍රවර්ධනය කිරීම;
- දේශපාලන මැදිහත්වීම්වලින් තොර සංස්කෘතික නිෂ්පාදන සඳහා සහාය; සහ
- සංස්කෘතිකමය වශයෙන් පොහොසත් සමාජයක් පෝෂ්‍ය කිරීම සඳහා රජයේ මුලපිරීම්

මෙම තේමාව යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 82 ක් ලැයිස්තු ගත කර ඇත. අධ්‍යාපනික ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම සහ පාසල් වැඩසටහන් සහ උපදේශ ද්‍රව්‍ය බෙදා හැරීම හරහා ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයේ වටිනාකම ඉස්මතු කිරීම සඳහා දැනුවත් කිරීමේ ක්‍රියාවලීන් මෙයට ඇතුළත් වේ. සංස්කෘතිය පුළුල් හා ගතික ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගනිමින්, පාසල් විෂයමාලා සහ ප්‍රජා පාදක අධ්‍යාපන වැඩසටහන් වලට ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමය ආශ්‍රිත අන්තර්ගතයන් ඒකාබද්ධ කිරීම ද කැපවීම් මගින් අවධාරණය කෙරේ. ඊට අමතරව, සාහිත්‍යය, චිත්‍රපට සහ ටෙලිනාට්‍ය, රංග කලාව, නැටුම්, දෘශ්‍ය කලා, මූර්ති සහ ඡායාරූපකරණය, සංගීතය සහ ගීතය, අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් සහ සාම්ප්‍රදායික කලා ඇතුළු විවිධ සංස්කෘතික අංශ මෙම තේමාව ආවරණය කරයි.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙන්නුම් කරන්නේ කැපවීම් 78 ම ජාතික ප්‍රතිපත්ති රාමුවට අන්තර්ග්‍රහණය කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාලය තුළ ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද, අධීක්ෂණ අරමුණු සඳහා තවමත් විධිමත් ලෙස ලැබිය යුතුව තිබුණි.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 16 ක් ඉදිරිපත් කරන ලදී. ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, එමගින් තෝරාගත් කැපවීම්වල ප්‍රගතිය ලබාගැනීමට හැකිවේ. සමාලෝචනය කරන ලද තීරණ අතරින්, එකක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙසත්, පහක් උචිත ලෙසත්, අර්ධ වශයෙන් උචිත වන කිසිවක් නොමැති ලෙසත්, දහයක් උචිත නොවන ලෙසත් තක්සේරු කර ලදී.





රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය මගින් අමාත්‍යාංශයේ වැඩසටහන් සහ ව්‍යාපෘති 90 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 14,466.20 ක් වෙන්කොට ඇති අතර, ඉන් 59,77% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 40.33% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද, වෙන් කර ඇත. සංසන්දනාත්මකව, 2026 අයවැය වෙන් කිරීම රුපියල් මිලියන 14,550 ක් වූ අතර, එය වෙන් කිරීම් වල සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි, නමුත් පුනරාවර්තන වියදම් අනුපාතය 59.77% සිට 65.46% දක්වා වැඩි වී, ප්‍රාග්ධනය 40.33% සිට 34.54% දක්වා අඩු වූ අතර, එමගින් දිශානතිය සංවර්ධනය දෙසට ගමන් නොකරයි.




2025 දී, අමාත්‍යාංශයට රුපියල් මිලියන 14,466.20 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, දළ වශයෙන් 39% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරමින්, වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 5,621 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතිය පිළිබඳ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.




**රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)**

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | රාජ්‍ය ලේඛනාගාරය නවීන තාක්ෂණික පහසුකම් සහිතව ප්‍රතිසංවිධානය කිරීම | ✓ | ✓ | ✓ |
| 02 | රටේ ඉතිහාසය, සංස්කෘතිය සහ උරුමයට අදාළ පාර්ශ්වකරුවන් විසින් දැනට නියුක්තව සිටින සංස්කෘතික සම්පත් ආරක්ෂා කිරීමේ සහ කළමනාකරණයට අදාළ කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් සංස්කෘතික උරුමය සහ ඉතිහාසයේ වටිනාකම් පිළිබඳ ඔවුන් තුළ තිබෙන අවබෝධය වැඩිදියුණු කිරීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 13 ක් එය අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් මුදුන්පත් කර ගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 11. පරිසර අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ පාරිසරික ප්‍රතිපත්තිය මෙහෙයවනු ලබන්නේ “ජෛව විවිධත්වයේ සෞඛ්‍ය සම්පන්න පැවැත්ම සහතික කරන තිරසර පරිසරයක්” යන දැක්ම මගිනි. සමාජ-ආර්ථික සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂාව අතර සමතුලිතතාවයක් පවත්වා ගනිමින් ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම එය අවධාරණය කරයි. පාරිසරික ආණ්ඩුකරණය සඳහා සහභාගීත්ව ප්‍රවේශයන්, දේශගුණික විපර්යාස වල බලපෑම් අවම කිරීම සහ සුදුසු දැනුම, කුසලතා, ආකල්ප සහ හැසිරීමේ වෙනස්වීම් මගින් ශක්තිමත් වූ සමබර පරිසරයකින් සහාය වන සෞඛ්‍ය සම්පන්න සමාජයක් පෝෂ්‍ය කිරීම ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රමුඛතා අතරට ඇතුළත් වේ.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව

තේමාත්මක ක්ෂේත්‍ර 12 ක් යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 65 ක් ලැයිස්තු ගත කර ඇති අතර, අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙන්නුම් කරන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 76 ක් ජාතික ප්‍රතිපත්ති රාමුවට අන්තර්ග්‍රහණය කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාලය තුළ අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. එය RTI ඉල්ලීම් හරහා ලැබීමට නියමිතව ඇත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ හයක් ඉදිරිපත් කරන ලදී. ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එමඟින් තෝරාගත් කැපවීම් වල ප්‍රගතිය ලබාගැනීමට හැකිවේ. සමාලෝචනය කරන ලද තීරණ අතරින් දෙකක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත වන ලෙස ද, එකක් උචිත වන ලෙස ද, එකක් අර්ධ වශයෙන් උචිත වන ලෙස සහ දෙකක් උචිත නොවන ලෙස ද, තක්සේරු කරන ලදී.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැයෙන් යෝජනා කර ඇති අයවැය වැඩසටහන් සහ ව්‍යාපෘති 54 ක් සඳහා අමාත්‍යාංශයට රුපියල් මිලියන 16,077 ක් වෙන්කොට ඇත. එයින් 78% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 22% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන් කර ඇති අතර, එමඟින් සංවර්ධනය කෙරෙහි නැඹුරු මැදිහත්වීම් සඳහා සාපේක්ෂව සීමිත ආයෝජනයක් සහිතව, මෙහෙයුම් ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු වී ඇති බව පෙන්නුම් කෙරේ.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 16,077 ක් වෙන්කොට ඇත. 2025 වර්ෂය සඳහා වූ වියදම් ප්‍රමාණය සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.

2026 ජාතික අයවැයෙන් අමාත්‍යාංශයට රුපියල් මිලියන 19,410 ක වැඩි කළ ප්‍රතිපාදන ප්‍රමාණයක් පෙන්නුම් කරන අතර, එයින් 75% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 25% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන් කර ඇති අතර, එය ආයෝජන සඳහා සුළු වර්ධනයක් පෙන්නුම් කරයි.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | පරිසර සුරක්ෂිතතාව තහවුරු කිරීම උදෙසා දැනට පනවා ඇති අණපනත්වල දුර්වලකම්, අඩුපාඩු, ඌනතාවන් ඉවත් කිරීම, ජාත්‍යන්තරය සමග එළඹී ගිවිසුම් හා ප්‍රඥප්තීන් හා දේශීය පාරිසරික නීති සමාලෝචනය | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 14 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් මුදුන්පත් කර ගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 12. අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

නීතිය මත පාලනයක් - සම ප්‍රවේශී අධිකරණ පද්ධතියක්  යනු රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මෙම ක්ෂේත්‍රයට අදාළ සංරචකයේ කේන්ද්‍රීය තේමාවයි. මෙම තේමාව නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ නීතිය යටතේ සමාන ආරක්ෂාව, අධිකරණ ස්වාධීනත්වය, මහජන විශ්වාසය, විනිවිදභාවය සහ යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂමතාවය ඇතුළු ප්‍රධාන මූලධර්ම මගින් මෙහෙයවනු ලැබේ.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛණ ලබා ගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙනී යන්නේ කැපවීම් 33 ම ජාතික ප්‍රතිපත්ති රාමුවට අන්තර්ග්‍රහණය කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාලසීමාව සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාවට නැංවීමට මග පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් වෙමින් පැවති අතර, අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ලැබීමට නියමිතව තිබුණි.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම - 2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව - Q2 (2025 ජුනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව - Q3 (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව - Q4 (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාල පරිච්ඡේදය තුළ, අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 19 ක් ඉදිරිපත් කරන ලදී. ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණු අතර, එමගින් තෝරාගත් කැපවීම් වල ප්‍රගතිය ලබාගැනීමට පහසුකම් සැලසුණි. මෙම තීරණ අතරින් හතරක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙසත්, හයක් උචිත ලෙසත්, පහක් අර්ධ වශයෙන් උචිත ලෙසත්, හතරක් උචිත නොවන ලෙසත් තක්සේරු කරන ලදී.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය මඟින් රුපියල් මිලියන 54,308 ක් සහ මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් අයවැය වැඩසටහන් සහ ව්‍යාපෘති 66 ක් වෙන්කොට ඇත. ඉන් 70% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 30% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන්කොට ඇත. එය බන්ධනාගාර සඳහා වන මෙහෙයුම් වියදම් වල ප්‍රමුඛතාවයක් පිළිබිඹු කරන අතර, අධිකරණ පද්ධතියේ තෝරාගත් ප්‍රාග්ධන ආයෝජන සඳහා සහාය ලබාදේ. 2026 දී ජාතික අයවැයෙන් ද එම තත්ත්වය පෙන්නුම් කෙරිණි. එනමුත් ප්‍රතිපාදන රුපියල් මිලියන 59,277.40 දක්වා වැඩි වී තිබුණි.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමග මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 54,308 ක් වෙන්කොට ඇත. 2025 වර්ෂය සඳහා වූ වියදම් ප්‍රමාණය සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

"මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සළකා කටයුතු කිරීම" (පි. 201) යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද විනිමය පනත් කෙටුම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත, රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර, ඉන් පසුව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2024 ජූලි 15 දින පැවති අමාත්‍ය මණ්ඩල මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත. මූල්‍ය විනය ඉහළ නැංවීම, ව්‍යාපාර ආරක්ෂා කිරීම සහ වාණිජ ගනුදෙනුවල දී චෙක්පත් වල "අගරු" (bounced) වීම පැතිර පැවතීම අඩු කිරීම සඳහා 2025 අගෝස්තු 15 වන දින රජය විසින් 2025 අංක 13 දරන විනිමය පනත් කෙටුම්පත් (සංශෝධන) පනත අනුමත කරන ලදී.

තවද, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නීත්‍යානුකූල පුද්ගලයින්ගේ සැබෑ හිමිකාරිත්වයේ විනිවිදභාවයට අදාළ ඌනතාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනත සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩල මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. මෙය මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ අනෙකුත් නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩලීම සඳහා සිදු කෙරේ. ඒ අනුව, ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය කිරීම, වගවීම වැඩි දියුණු කිරීම, සහ හිමිකාරිත්වයේ විනිවිදභාවය සම්බන්ධයෙන් නියාමන අධීක්ෂණයේ පෙර පැවති හිඩැස් පියවීම සඳහා 2025 අගෝස්තු 4 වන දින පාර්ලිමේන්තුව විසින් 2025 අංක 12 දරන සමාගම් (සංශෝධන) පනත අනුමත ලදී.

රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම (පි. 209) ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව වන අතර, පොරොන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය පළමු අදියරේ අධීක්ෂණ වාර්තාවට ඇතුළත් කර ඇත. තවද, 2025 ජූනි 18 වන දින 2025 අංක 7 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත බලාත්මක කිරීම මඟින් පාර්ලිමේන්තුව තුළ අදාළ නීතිමය විධිවිධාන සලසා ඇති බව අධීක්ෂණය කෙරේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලැයිස්තු ගත කර ඇති ප්‍රධාන පොරොන්දු වලින් එකකි. කෙසේ වෙතත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බලාත්මකව තබා ගනිමින්, එය රාජ්‍යයට එරෙහි ත්‍රස්තවාදය වැළැක්වීමේ (PSTA) පනත නමින් නව නීතියකින් ප්‍රතිස්ථාපනය කිරීමට රජය අදහස් කරයි. සමාලෝචනය සඳහා කෙටුම්පත් පනත බෙදා හරිමින් රජය මහජනතාවගෙන් යෝජනා ඉල්ලා ඇත. මෙම ප්‍රවේශය මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි රජය ජනතාව සමඟ ඇතිකර ගත් සමාජ ගිවිසුමෙන් වෙනස්වීමක් ඇතිවිය හැකි තත්ත්වයක් පෙන්නුම් කරයි.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව: මත්ද්‍රව්‍ය වැරදිවලට දඬුවම් දැඩි කිරීම, නඩු කඩිනමින් විසඳීම සඳහා පියවර ගැනීම (පි. 212), 1978 අංක 2 දරණ විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ පිළිබඳ ආඥා පනත සහ අධිකරණ පනත (මහ මුහුදේ අන්තරායකර මත්ද්‍රව්‍ය ජාවාරම තහනම් කිරීම) සංශෝධනය කිරීමට රජය 2025 ජූනි 23 වන දින කැබිනට් තීරණයක් ගත්තේය. එම පනත් කෙටුම්පත සඳහා පළමු කියවීම 2025 දෙසැම්බර් 18 දින සිදුකරන ලදී.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව: අධිකරණ ක්‍රියාවලියට නවීන තාක්ෂණය හඳුන්වාදීමට පියවර ගැනීම සහ විනිශ්චයකාරවරුන්ට හා කාර්යමණ්ඩලයට ඒ සම්බන්ධ නිසි පුහුණුව ලබාදීම ආදිය තුළින් අධිකරණ ක්‍රියාවලිය වඩා සුමට හා කාර්යක්ෂම කිරීම (පි. 201), රජය විසින් විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ (සංශෝධන) පනත් කෙටුම්පත සහ අධිකරණ (සංශෝධන) පනත් කෙටුම්පත (මහ මුහුදේ අන්තරායදායක මත්ද්‍රව්‍ය ජාවාරම තහනම් කිරීම) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබේ.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | පාර්ලිමේන්තුව | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|---|
| 01 | රිමාන්ඩ් සිරකරුවන් ලෙස දීර්ඝකාලීනව රඳවා තැබීම වැළැක්වෙන පරිදි අපරාධ යුක්ති ක්‍රමයට සම්බන්ධ ආයතනවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | ✓ | | | |
| 02 | සුහුරු අධිකරණ ශාලා (Smart Court House) ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම සහ අධිකරණ වාර්තා මෘදු පිටපත් (Soft copies) පවත්වාගෙන යාම | ✓ | | ✓ | ✓ |
| 03 | ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව විශේෂ පහසුකම් ඇතුළුව බන්ධනාගාර තුළ පහසුකම් පුළුල් කිරීම | ✓ | | ✓ | ✓ |
| 04 | මූල්‍ය අවභාවිතාවන්, අල්ලස්, කොමිස් වැනි දූෂිත ක්‍රියාවන් වැළැක්වීම අරමුණු කරගනිමින් නීතිරීති සම්පාදනය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම | | ✓ | | |
| 05 | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) ඇතුළු සියලු පීඩාකාරී ක්‍රියාවන් අහෝසි කිරීම සහ රටේ සියලු ප්‍රදේශ වල ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් සහතික කිරීම | | ✓ | | |
| 06 | මත්ද්‍රව්‍ය වැරදි සඳහා දඬුවම් ශක්තිමත් කිරීම සහ නඩු කඩිනමින් විසඳීමට පියවර ගැනීම | ✓ | ✓ | | |
| 07 | අධිකරණ ක්‍රියාවලියට නවීන තාක්ෂණය හඳුන්වාදීමට පියවර ගැනීම සහ විනිශ්චයකාරවරුන්ට හා කාර්යමණ්ඩලයට ඒ සම්බන්ධ නිසි පුහුණුව ලබාදීම ආදිය තුළින් අධිකරණ ක්‍රියාවලිය වඩා සුමට හා කාර්යක්ෂම කිරීම | ✓ | ✓ | | |
| 08 | නීති විශේෂඥ කමිටුවක් මගින් පවතින නීති සමලෝචනය කොට අවශ්‍ය නීති යාවත්කාලීන කිරීම | ✓ | ✓ | | |

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව:නීති විශේෂඥ කමිටුවක් මගින් පවතින නීති සමලෝචනය කොට අවශ්‍ය නීති යාවත්කාලීන කිරීම (පි. 201), නීති කෙටුම්පත්කරු විසින් සකස් කරන ලද සමථකරණ (සිවිල් සහ වාණිජ ආරවුල්)

පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට, සහ ඉන් පසුව, පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට රජය අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇත. පළමු කියවීම 2025 ජූලි 11 වන දින සිදු කරන ලදී.

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 19 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් මුදුන්පත් කරගෙන ඇති පොරොන්දු පෙන්නුම් කරන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 13. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවය රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පවතින ප්‍රධාන මෙවලමයි. ආසන්න වශයෙන් මිලියන 1.4 ක කාර්යමණ්ඩලයකින් සමන්විත රාජ්‍ය සේවයට, අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සිට කාර්යාල සහායක කාර්ය මණ්ඩලය දක්වා පුළුල් පරාසයක වෘත්තිකයන් සහ නිලධාරීන් ඇතුළත් වේ. මෙම ශ්‍රම බලකාය නඩත්තු කිරීම සඳහා රාජ්‍ය වියදමෙන් සැලකිය යුතු කොටසක් වෙන් කරනු ලබයි.

මෙම අංශය යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්, විනිවිදභාවය සහ වගවීම, කුසලතා මත පදනම් වූ පත්වීම් සහ උසස්වීම්, කාර්යක්ෂමතාව සහ විධිමත් ක්‍රියාපටිපාටි වලට අනුගත වීම, සදාචාරාත්මක හැසිරීම සහ ආයතනික අඛණ්ඩතාව, උසස් තාක්ෂණය භාවිතය, ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය, හවුල්කාරිත්වයන් සහ මහජන සහභාගීත්වය, මහජන දැනුවත්භාවය සහ කුසලතා සංවර්ධනය, සමස්තය ඇතුළත් කිරීම සහ වෙනස් කොට නොසැලකීම, ඇතුළු මූලධර්ම මගින් මෙහෙයවනු ලැබේ.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව


මෙම අමාත්‍යාංශය යටතේ මුළු ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් 20 ක් හඳුනා ගෙන ඇත. ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, ආණ්ඩුකරණය තුළ මහජන සහභාගීත්වය වැඩි දියුණු කිරීම සඳහා දින නියමයක් නොමැතිව කල් දමා ඇති පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ වසරක් ඇතුළත පැවැත්වීම මෙන්ම, අවශ්‍ය සම්පත් සහ තාක්ෂණික පහසුකම් සැපයීම හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන සංශෝධනය යටතේ පිළිගත් ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ද මේවාට ඇතුළත් වේ.

අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙනී යන්නේ මෙම කැපවීම් 20 ම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ ලැයිස්තු ගත කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාලය සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමට මග පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද තවමත් විධිමත් ලෙස ලැබිය යුතුව ඇත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ලැබී ඇත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාල පරිච්ඡේදය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් ඉදිරිපත් කරන ලද අතර, ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එමඟින් තෝරාගත් කැපවීම් පිළිබඳ ප්‍රගතිය ලබා ගැනීමට හැකිවිය. මෙම තීරණ අතරින් තුනක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත වන ලෙස තක්සේරු කරන ලදී. එකක් උචිත වන ලෙස ද, හතරක් අර්ධ වශයෙන් උචිත වන පරිදි සහ හතරක් උචිත නොවන ලෙස තක්සේරු කෙරුණි.





රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

2012 සහ 2021 වර්ෂ වල පැවති සීමා නිර්ණ කමිටුවේ නිර්දේශ සමාලෝචනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා නව සීමා නිර්ණ කමිටුවක් පත් කිරීමට අමාත්‍යාංශ 2025 අගෝස්තු 04 වන දින අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. නමුත්, මෙම කමිටුව තවමත් ස්ථාපිත කර නොමැත.

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

රාජ්‍ය මූල්‍යකරණය සම්බන්ධයෙන්, 2025 ජාතික අයවැයේ දී මෙම අමාත්‍යාංශය අයවැය යෝජනා 131 ක් යටතේ ආවරණය විය. මුළු අයවැයෙන් 6.66% ක් වන රුපියල් මිලියන 588,141.00 ක ප්‍රතිපාදනයක් අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කර තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වලින් 93% ක් සහ ප්‍රාග්ධන වියදම් සඳහා 6.5% ක් පමණක් වූ අතර, මෙය පුනරාවර්තන-නැඹුරුවක් සහිත මැදිහත්වීම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන බව පෙන්නුම් කරයි. 2026 වර්ෂයට රු.674,000.00 මිලියනක් වෙන් කර ඇත. එය මුළු අයවැයේ 7.5% ක් වේ. පුනරාවර්තන වියදම 95% ක් පමණ වැඩිවී ඇති අතර, එයත් එම තත්ත්වයම පෙන්නුම් කරයි.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 588,141 ක් වෙන්කොට ඇත. 2025 වර්ෂය සඳහා වන වියදම් ප්‍රමාණය සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | අවම පහසුකම් පවත්වා ගැනීම සඳහා පාසල් වලට භෞතික හා මානව සම්පත් සැපයීම | | ✓ | ✓ |
| 02 | පුරවැසියන්ට විනිවිද බවින් යුතු සහ කාර්යක්ෂම සේවාවන් සපයන ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම | ✓ | ✓ | ✓ |
| 03 | රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේදී සහය දැක්වීමට සහ ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් සතුව තිබිය යුතු හැකියාවන් වර්ධනය කිරීමට, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙහි (SLIDA) ශක්‍යතාවය ඉහළ දමමින් ප්‍රතිව්‍යුගත කිරීම | | ✓ | ✓ |
| 04 | රැකියා සඳහා රට තුළ සහ රටින් පිටත සංක්‍රමණික පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 11 ක් අධීක්ෂණය මගින් නිරීක්ෂණය කර ඇත. ඉහත වගුවේ එක් සන්ධිස්ථානයකට ළඟා වූ පොරොන්දු පෙන්නුම් කරන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

රට තුළ සහ ඉන් පිටත සංක්‍රමණිකයින්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම (පි. 194) මූලික ආයතනික පියවර හරහා අර්ධ වශයෙන් ආමන්ත්‍රණය කර ඇත. විදේශයන්හි පදිංචි සංක්‍රමික ශ්‍රී ලාංකිකයන් සම්බන්ධයෙන් වන ක්‍රියාත්මක කිරීමේ රාමුව පරීක්ෂා කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇති අතර, කැපවුණු කමිටුවක් පිහිටුවා ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා මැතිවරණ කොමිසන් සභාව විසින් මහජන මතය සහ පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සඳහා වන ඉල්ලීම් ඇතුළුව උද්දේශන ප්‍රයත්නයන් සිදු කර ඇත.

කෙසේ වෙතත්, මෙම පියවර ක්‍රියාපටිපාටිමය සහ සූදානම් කිරීමේ ස්වභාවයෙන් පවතින බව මෙම අධීක්ෂණ අභ්‍යාසය නිරීක්ෂණය කරයි. නිශ්චිත ව්‍යවස්ථාදායක සංශෝධන හෝ විදේශවල සිට ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාකාරී යාන්ත්‍රණයන් නොමැති වීමේ හේතුවෙන්, මෙම කැපවීම තවමත් ඉටු වූ බව සැලකිය නොහැකිය. ඒ අනුව, ප්‍රතිපත්ති අභිප්‍රාය සහ සැබෑවට දැනෙන ලෙස ක්‍රියාවට නැංවීම අතර පරතරයක් පෙන්නුම් කරන බැවින්, වත්මන් තත්ත්වය තක්සේරු කෙරෙන්නේ මුල් පොරොන්දුව නිසි පරිදි ඉටු නොවුණු බවයි.

## 14. වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුව, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සංකල්පය තුළ ගැබ් වී ඇති අතර, එය මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සහ තාක්ෂණික සංවර්ධන මාර්ග සිතියමක් සමඟ ඒකාබද්ධ වී ඇත. එය උත්සාහ දරන්නේ ආර්ථික අවස්ථාවන්ට සාධාරණ ප්‍රවේශයක්, ආර්ථික තීරණ ගැනීමේ දී සමස්තය ඇතුලත් කෙරෙන සහභාගීත්වයක් සහ ආර්ථික ප්‍රතිලාභ සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කිරීමට ය. තිරසර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම අරමුණු කරගත් ප්‍රධාන මූලධර්ම දහයක් වටා මෙම රාමුව ව්‍යුහගත කර ඇත. එහි ඉලක්කය වන්නේ ඔරොත්තු දීමේ හැකියාව සහිත, නිෂ්පාදනය පදනම් කරගත් ආර්ථිකයක් සංවර්ධනය කිරීම හරහා 2030 වන විට සැබෑ දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් බිලියන 120 දක්වා ළඟා කර ගැනීම ය.

මෙම අරමුණුවලට අනුකූලව, දේශීය වෙළඳාම යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් දහයක් සහ ජාත්‍යන්තර වෙළඳාම යටතේ තවත් දහයක් හඳුනා ගෙන ඇත. කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ ප්‍රවාහනය සඳහා තාක්ෂණික සහ මූල්‍ය ආධාර සැපයීම කෙරෙහි අතිරේක කැපවීමක් හඳුනා ගෙන ඇත.

## ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව


මෙම අමාත්‍යාංශය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුවට කැපවීම් 21 ක් අන්තර්ග්‍රහණය කර ඇති බව අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාල පරිච්ඡේදය සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමට මග පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති නමුත්, තවමත් ඒවා විධිමත් ලෙස ලැබිය යුතුව ඇත.

අධීක්ෂණ අභ්‍යාසය පහත සඳහන් කැපවීම් හඳුනාගත් අතර, එය ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රකාශයට පත් කර ඇති නමුත්, දේශීය වෙළඳාම යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලැයිස්තු ගත කර නොමැත:

- වෙළඳපල තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම, ආයතන අධීක්ෂණය කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීම, වෙළඳපල ක්‍රියාකාරකම් කාර්යක්ෂමව සංවිධානය කිරීම සහ වාණිජ මෙහෙයුම්වල රජයේ කොටස් නියෝජනය කිරීම මගින් සාධාරණ මිල ගණන් යටතේ මහජනතාවට ඉහළ ගුණාත්මකභාවයකින් යුත් භාණ්ඩ හා සේවා අඛණ්ඩව සැපයීම සහතික කිරීම.

**නිරීක්ෂණය:** ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන තේමාත්මක ඉලක්කයට අනුකූලව, දේශීය වෙළඳ අංශයේ වෙළඳපල නියාමනය සහ පාරිභෝගික ආරක්ෂාව කෙරෙහි රජයේ අවධාරණය පිළිබිඹු කරමින් මෙම කැපවීම ජාතික ප්‍රතිපත්ති රාමුවට එකතු කිරීමක් නියෝජනය කරයි.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |




**රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ**


## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ තුනක් ඉදිරිපත්කොට ඇති අතර, ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇත. එමගින් තෝරාගත් කැපවීම් පිළිබඳ ප්‍රගතිය ලබාගැනීමට පහසුකම් සැලසුණි. මෙම තීරණ තුනම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමට අතිශයින් උචිත බව තක්සේරු කරන ලදී.

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

රාජ්‍ය මූල්‍යකරණය සම්බන්ධයෙන්, 2025 දී අමාත්‍යාංශය අයවැය යෝජනා 15 ක් යටතේ ආවරණයකොට ඇත.

රුපියල් මිලියන 2,664 ක ප්‍රතිපාදනයකින් 81% ක් පුනාරාවර්තන වියදම් සඳහා ද, 18.33% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද, වෙන් කර ඇත. නමුත් 2026 ජාතික අයවැයේ දී රුපියල් මිලියන 4,450.00 ක් සහ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා 50:50 කට ආසන්න අනුපාතයක් යනු, වෙන් කිරීමෙහි සැලකිය යුතු වෙනසකි.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 2,664 ක් වෙන් කොට ඇත. 2025 වසර සඳහා වැය කළ මුදල් සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව ඇත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | ප්‍රපාතන-විරෝධී (anti-dumping) නීති ශක්තිමත් කිරීම, නව සාධාරණ වෙළඳ නීති හඳුන්වා දීම සහ පවතින රෙගුලාසි යාවත්කාලීන කිරීම. | | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 05 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ ස්තම්භස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 15. බලශක්ති අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

හරිත ආර්ථිකයක් සංවර්ධන කිරීමට සහාය වීම සඳහා පුනර්ජනනීය බලශක්තියේ සැලකිය යුතු වැඩිවීමක් සමගින්, තෙල් මත පදනම් වූ විදුලි උත්පාදනය මත අඩුවෙන් යැපෙන බලශක්ති මිශ්‍රණයක් කරා මාරුවීමකට රජයේ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමුඛත්වය දෙයි. අඛණ්ඩ බලශක්ති සැපයුමක් සහතික කරමින්, ජාතික තෙල් පිරිපහදුව, ගබඩා කිරීම සහ බෙදා හැරීමේ යටිතල පහසුකම් පුනර්ජීවනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා වන පියවරයන් ද මෙම ප්‍රතිපත්තිය මගින් දක්වා ඇත. මෙම කැපවීම්වලට මඟ පෙන්වන පූර්ණ විෂයපථයක් සහිත මූලධර්ම අතරට බලශක්තිය අත්‍යවශ්‍ය ජාතික සේවාවන් ලෙස හඳුනා ගැනීම, තිරසර හා ආරක්ෂිත බලශක්ති සැපයුමක් සහ පරිභෝජනයක් සහතික කිරීම සහ බලශක්ති ආර්ථිකය විදේශ ආදායම් මාර්ගයක් ලෙස ස්ථානගත කිරීම ඇතුළත් වේ.

මෙම අංශය යටතේ සමස්ත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ආසන්නව 5% ක් නියෝජනය කරන ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් 68 ක් හඳුනාගෙන ඇත. නිශ්චල සහ ජංගම ප්‍රභවයන්ගෙන් වායු දූෂණය අවම කිරීම අරමුණු කර ගනිමින්, කාර්මික සහ ප්‍රවාහන ක්ෂේත්‍ර වල විකල්ප බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම සහ නියාමනය කිරීම සඳහා වූ කැපවීම් මේවාට ඇතුළත් වේ.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛණ ලබා ගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙනී යන්නේ කැපවීම් 68 ම ජාතික ප්‍රතිපත්ති රාමුවට අන්තර්ග්‍රහණය කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාලය සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවති අතර, ක්‍රියාකාරී සැලැස්ම ලැබීමට නියමිතව තිබුණි.

බලශක්ති අංශය යටතේ ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රකාශිත නමුත්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ලැයිස්තු ගත කර නොමැති පහත සඳහන් කැපවීම අධීක්ෂණ අභ්‍යාසය මගින් හඳුනා ගන්නා ලදී:

- රජයේ රෝහල්, පාසල් සහ ආගමික පරිශ්‍ර වලට විදුලි සැපයුම් යෝජනා ක්‍රම සැපයීම සඳහා අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණයෙන් ජාතික වැඩසටහනක් දියත් කිරීම. මහජන බදු හරහා අරමුදල් සපයන සහනාධාර මත යැපීම අවම කිරීම සඳහා ස්වයං-ජනනය සහ බලශක්ති සංරක්ෂණ පියවරයන් මෙම වැඩසටහනට අන්තර්ගත කරනු ඇත.


**නිරීක්ෂණය:** ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන තේමාත්මක ඉලක්කයට අනුකූලව, මෙම කැපවීම ජාතික ප්‍රතිපත්ති රාමුවට එකතු කිරීමක් නියෝජනය කරන අතර, රාජ්‍ය ආයතන සඳහා බලශක්ති කාර්යක්ෂමතාව සහ තිරසර විදුලි සැපයුම කෙරෙහි රජයේ අවධානය ඉස්මතු කරයි.

### ඛනිජ තෙල්

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 14 ක් ඉදිරිපත් කරන ලදී. ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, තෝරාගත් කැපවීම් පිළිබඳ ප්‍රගතිය සාමූහිකව ලබා ගැනීමට පහසුකම් සැලසුණි. මේවායින්, සංදේශ දෙකක් ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් වලට අතිශයින් උචිත විය, තුනක් උචිත විය, හතක් අර්ධ වශයෙන් උචිත විය, සහ දෙකක් උචිත නොවීය.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ


## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

2025 ජාතික අයවැයෙන් අමාත්‍යාංශය අයවැය යෝජනා 21 ක් යටතේ ආවරණය කර ඇති අතර, ඒ සඳහා රුපියල් මිලියන 21,142 ක් වෙන් කර ඇත. එයින් 5% ක් පුනරාවර්තන වියදම් සඳහා සහ 95% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇති අතර, එය ආයෝජන කෙරෙහි නැඹුරු වූ මැදිහත්වීම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන බව පෙන්නුම් කරයි. 2026 දී රුපියල් මිලියන 22,373 ක් වෙන් කරන ලද අතර, පුනර්වර්තන වියදම්වල අනුපාතය ප්‍රාග්ධන වියදම්වලට ආසන්න වශයෙන් සමාන වේ.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 21,142 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, දළ වශයෙන් 13% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරමින් වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 2,756 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නැත.




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව; "ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරඟකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීම් ක්‍රියාවලිය සක්‍රීය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම (පි. 166), වසර පහක් ඇතුළත කලාපයේ අඩුම අගය දක්වා විදුලි මිල ක්‍රමයෙන් අඩු කරනු ඇත", 2024 දෙසැම්බර් 30 වන දින රජය 2024 අංක 36 දරන විදුලිබල පනත යළි සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන තිබේ. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම සඳහා වෙනම, ස්වාධීන සමාගම් වලට වෙන් කිරීමෙන් විදුලිබල අංශය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2025 අගෝස්තු 18 වන දින 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවත් පත් කිරීම සඳහා තරඟකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීම් ක්‍රියාවලිය සක්‍රීය කර, තෙල් මත පදනම් වූ විදුලි ජනනය අඩු මිලැති සූර්ය හා සුළං ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම (P.166), වසර පහක් ඇතුළත කලාපයේ අඩුම අගය දක්වා විදුලි මිල ක්‍රමයෙන් අඩු කරනු ඇත | ✓ | ✓ | |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 05 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම 2 හි ලැයිස්තු ගත කර ඇත.

## 16. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශ

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ප්‍රවාහන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සමස්ත ප්‍රධාන අරමුණ වන්නේ ආරක්ෂිත, දැරිය හැකි සහ කාලෝචිත සංචලනය සහතික කරන කාර්යක්ෂම සහ විශ්වාස කළ හැකි පොදු ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීමයි. ප්‍රධාන ඉලක්කයක් වන්නේ වසර පහක් ඇතුළත පොදු ප්‍රවාහනය හරහා ජාතික මගී ප්‍රවාහන ඉල්ලුමෙන් 70% ක් සපුරාලීමයි.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛණ ලබා ගැනීමේ හැකියාව

මෙ අරමුණට අනුකූලව, ප්‍රවාහන අංශය යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් 47 ක් දක්වා ඇත. අධීක්ෂණයේ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ අමාත්‍යාංශය සම්බන්ධයෙන් හඳුනාගත් කැපවීම් 50 ම ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා අදහස් කරන ලද අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම (2026-2028) සකස් කරමින් පැවති අතර, ඊට අනුරූප ක්‍රියාකාරී සැලැස්ම තවමත් අවසන් කර නොතිබුණි.

### ප්‍රවාහන හා මහාමාර්ග


| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### නාගරික සංවර්ධනය

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ලැබී ඇත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ පනස් පහක් ඉදිරිපත් කරන ලද අතර, ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණු අතර, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් වල ප්‍රගතිය ලබාගැනීමට පහසුකම් සැලසුණි. අනුමත වූ අමාත්‍ය මණ්ඩල තීරණ තක්සේරුවකින් පෙනී යන්නේ පහක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවයි; කෙසේ වෙතත්, දහඅට ක් සෘජුවම උචිත වන බවත්, දහසය ක් අර්ථ වශයෙන් උචිත වන බව සහ දහසයක් උචිත නොවන බවත් ය.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ


## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා 108 ක් අමාත්‍යාංශය හා සම්බන්ධ කර ඇති අතර, රජයේ මුළු වියදමෙන් 5.54% ක් නියෝජනය කරන රුපියල් මිලියන 489,303 ක ප්‍රතිපාදනයක් අමාත්‍යාංශයට වෙන්කොට ඇත. මෙම ප්‍රතිපාදන වලින් 11% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 89% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද වෙන් කරන ලද අතර, එය ආයෝජන කෙරෙහි නැඹුරු වූ යටිතල පහසුකම් සංවර්ධනය දැඩිව අවධාරණය කරන බව පිළිබිඹු කරයි. සංසන්දනාත්මකව, 2026 අයවැයෙන් රුපියල් මිලියන 497,259 ක් වෙන් කරන ලද අතර, එහි පුනරාවර්තන-ප්‍රාග්ධන වියදම් සමාන අනුපාතයකින් වෙන් කර ඇත.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 489,330 ක් වෙන් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, දළ වශයෙන් 50% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරමින්, වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 243,290 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නැත.




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්

ත්‍රීරෝද රථ සේවාව, කාර්යමණ්ඩල ප්‍රවාහනය සහ පාසැල් ළමුන් ප්‍රවාහනය ද ඇතුළත් අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත් කිරීම (පි. 175) ප්‍රවාහන අංශය යටතේ ලැයිස්තු ගත පොරොන්දුවක් වන අතර, අධීක්ෂණයේ පළමු අදියරේ දී අමාත්‍ය මණ්ඩලය තුළ අවශ්‍ය පියවර ගෙන ඇත. ඊට අමතරව, 2025 ජුනි 19 වන දින පාර්ලිමේන්තුවේ දී 2025 අංක 8 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභා (සංශෝධන) පනත සම්මත කරන ලදී.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | පාර්ලිමේන්තුව | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|---|
| 01 | ත්‍රීරෝද රථ සේවාව සහ කාර්ය මණ්ඩල, පාසැල් ළමුන් ප්‍රවාහනයද ඇතුළත් අනෙකුත් කුලී රථ සේවාවන් විධිමත් කර ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් බවට පත්කිරීම | ✓ | ✓ | | |
| 02 | දුම්රිය මැදිරි වැඩිපුර යෙදවීම හා දුම්රිය ගමන් වාර වැඩිකිරීමෙන් කාර්යක්ෂම දුම්රිය සේවාවක් හඳුන්වාදීම | ✓ | | ✓ | ✓ |
| 03 | කඩිනමින් ප්‍රතිසංස්කරණය කළ යුතු ග්‍රාමීය හා වතු ආශ්‍රිත මාර්ග හඳුනාගෙන ප්‍රමුඛතා ලේඛනයක් සකසා එම ප්‍රමුඛතා ලේඛනයට අනුව මාර්ග ප්‍රතිසංස්කරණය කර තිරසාරව නඩත්තු කිරීම | ✓ | | ✓ | ✓ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 04 | අධිවේගී මාර්ග (E), මහාමාර්ග (A,B) සහ පළාත් මාර්ග (C,D) යන සියල්ලම කාලානුරූපව නිසිපරිදි නඩත්තු කර පවත්වාගෙන යාම | ✓ | | ✓ | ✓ |
| 05 | දැනට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර අතහැර දමා තිබෙන මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට මීරිගම දක්වා වූ ඉතිරි කොටස මතුවී තිබෙන ගැටලු නිරාකරණය කර ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම | ✓ | | ✓ | ✓ |
| 06 | ප්‍රමුඛතා පදනමින් ක්‍රමානුකූලව දැනට දුම්රිය මාර්ග ජාලය මගින් ආවරණය නොවන ප්‍රදේශ දක්වා දුම්රිය මාර්ග දීර්ඝ කර සෑම ප්‍රධාන නගරයකටම දුම්රිය සේවා සැපයීම | ✓ | | ✓ | ✓ |
| 07 | තදාසන්න ප්‍රදේශ වලට දුර පළාත් වලින් පැමිණෙන මගීන්ට බස් නැවතුම්පොළ සහ දුම්රිය නැවතුම්පොළ එකම ස්ථානකට පිහිටි මගී හුවමාරු නගර පිහිටුවීම සඳහා පහසුකම් හඳුනාගෙන සංවර්ධනය කිරීම | ✓ | | ✓ | ✓ |

අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 51 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ වැඩි ගණනක් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තු ගත කර ඇත.

## 17. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

'ව්‍යවසායකත්ව ප්‍රවර්ධනයක්-ජීවධරණී ප්‍රවේශයක්' යන්නෙන් නියෝජනය වන්නේ කාර්මික සංවර්ධනය සහ පෞද්ගලික අංශයේ ව්‍යාප්තිය සඳහා රජයේ සමස්ත ප්‍රධාන ප්‍රතිපත්තිමය දිශානතිය යි. බිඳ වැටී ඇති දේශීය නිෂ්පාදන කර්මාන්ත නැවත පණ ගැන්වීම, අපනයන කර්මාන්ත වල තරගකාරීත්වය ඉහළ නැංවීම, සේවා කර්මාන්ත ප්‍රවර්ධනය, නව ගෝලීය වෙළඳපල අවස්ථා ගවේෂණය කිරීම සහ සුරක්ෂිත කිරීම, ඒකාබද්ධ ජාතික උපාය මාර්ගයකට අනුකූලව විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම, ආයෝජන හිතකාමී ව්‍යාපාරික පරිසරයක් පෝෂ්‍ය කිරීම සහ අඩු පිරිවැය යටිතල පහසුකම් සැපයීම සහ නිෂ්පාදන යෙදවුම් සහතික කිරීම මෙම ප්‍රතිපත්ති රාමුවේ මූලික අරමුණු වේ.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛණ ලබා ගැනීමේ හැකියාව

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කාර්මික සංවර්ධනය සහ ව්‍යවසායකත්වයට අදාළ මුළු කැපවීම් 95 ක් ප්‍රකාශයට පත් කර ඇත. අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙනී යන්නේ කැපවීම් 95 ම ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, මෙම ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීමට අදහස් කරන ලද 2026-2028 කාල පරිච්ඡේදය සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවතුනි. වාර්තා කර ඇති පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත; කෙසේ වෙතත්, එය තවමත් තක්සේරුව සඳහා විධිමත් ලෙස ලැබී නොමැත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ පහළොවක් ඉදිරිපත් කොට ඇත. ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එමඟින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් ප්‍රගමනය සඳහා පහසුකම් සපයා ඇත. අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය කිරීමෙන් හෙළි වන්නේ, එකක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවයි. කෙසේ වෙතත්, තීරණ නවයක් උචිත ලෙසත්, තුනක් අර්ධ වශයෙන් උචිත ලෙසත්, දෙකක් උචිත නොවන ලෙසත් තක්සේරු කරන ලදී.




**රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ**


## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අමාත්‍යාංශය ආශ්‍රිතව අයවැය යෝජනා 25 ක් පැවති අතර, රුපියල් මිලියන 13,943 ක් වෙන් කර තිබුණි. ඉන් 35% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 65% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද, වෙන් කර තිබුණු අතර, 2026 අයවැයෙන් රුපියල් මිලියන 13,000.00 ක් වෙන් කර ඇත. එයින් පුනරාවර්තන ප්‍රාග්ධන වියදම් අනුපාතය 42% පුනරාවර්තන සහ 58% ප්‍රාග්ධන වියදම් ලෙස සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කරයි.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 13,943 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, ආසන්න වශයෙන් 32% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරමින් වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 4,511 ක් වැය කර ඇත. භෞතික ප්‍රගතියේ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නැත.




**රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)**

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලි-මේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|
| 01 | ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ඉතා වැදගත් වන මූල්‍ය සහාය ලබාදීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රය හරහා ශක්‍යතා ඇගයීම් සහ ණය ලකුණු (Credit score) මත පදනම්ව, රුපියල් මිලියන 10 දක්වා ඇපකර රහිත ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | ✓ | |
| 02 | සමෘද්ධි බැංකු සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු ඇතුළු සමුපකාර බැංකුකරණය ශක්තිමත් කිරීම මගින් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායයන් සඳහා මූල්‍ය සහයෝගය ඉහළ නැංවීම | ✓ | ✓ |

අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 18 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන එකක් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තුගත කර ඇත.

## 18. වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වැවිලි අංශයට, විශේෂයෙන් කැප වූ සුවිශේෂී තේමාත්මක අවධානය යොමු කරන ක්ෂේත්‍රයක් හඳුනාගෙන නොමැත. කෙසේ වෙතත්, අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙන්නුම් කරන්නේ වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාළ කැපවීම් 18 ක් ඇතුළත් කර ඇති බවයි.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව


සමාලෝචනය කරන අවස්ථාවේ දී, අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා නිර්මාණය කර ඇති 2026-2028 දක්වා කාලය සඳහා අමාත්‍යාංශයේ උපායාමාර්ගික සැලැස්ම සකස් කර තිබුණි. මෙම කැපවීම් ක්‍රියාවට නැංවීම සඳහා එයට අනුගාමීව ක්‍රියාකාරී සැලැස්මක් ද සකස් කර ඇත. අමාත්‍යාංශයේ කාර්යභාරය දෙයාකාර වේ: (අ) වැවිලි කර්මාන්තය සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීම, සහ (ආ) කර්මාන්තය මත සෘජුවම යැපෙන ජීවනෝපායයන් ඇති වතු ප්‍රජාවන් තුළ සමාජ-ආර්ථික තත්ත්වයන් සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

### වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම්

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | ලැබී ඇත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | ලැබී ඇත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ දෙකක් ඉදිරිපත් කරන ලද අතර, ඒ දෙකටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇත. එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් වල ප්‍රගතිය කෙරෙහි පහසුකම් සැලසුණි. මෙම අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ තක්සේරුවකින් පෙනී යන්නේ ඒ දෙකම උචිත ලෙස තක්සේරු කර ඇති බවයි.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ


## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අමාත්‍යාංශය හා සම්බන්ධව අයවැය යෝජනා 37 ක් පැවති අතර, රුපියල් මිලියන 17,783.00 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණි. එහි 31% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 69% ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද, වෙන් කර ඇති අතර, එය ප්‍රාග්ධනය අධික යටිතල පහසුකම් සහ ආංශික සංවර්ධන මුලපිරීම් පිළිබිඹු කරයි. 2026 අයවැය යටතේ රුපියල් මිලියන 25,050 ක් වෙන් කරන ලද අතර, 2025 දී 69% ක් වූ ප්‍රාග්ධන වියදම් 53.29% දක්වා අඩුවිය. පුනරාවර්තන වියදම් 31% සිට 53.29% දක්වා වැඩිවීම සංවර්ධනය කෙරෙහි වූ නැඹුරුවක සිට මෙහෙයුම් කෙරෙහි නැඹුරුවක් පෙන්වයි.




රූප සටහන: 2025 සිට 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 17,783 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 7,987 ක් පමණක් වැය කර ඇති අතර, එය ආසන්න වශයෙන් 46% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරයි. භෞතික ප්‍රගතිය පිළිබඳ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අාමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | මලයගම් ප්‍රජාවන් සඳහා නිවාස, ජලය සහ සනීපාරක්ෂක පහසුව ඉහළ නැංවීම සඳහා මූල්‍යමය සහ යටිතල පහසුකම් සැපයීම | ✓ | ✓ | ✓ |
| 02 | වතු අවට ප්‍රදේශ වල දැරිය හැකි මිලකට නිවාස යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 07 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන එකක ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තුගත කර ඇත.

## 19. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

"උදාර රාජ්‍යතාන්ත්‍රිකත්වයක්-ස්වෛරී රාජ්‍යයක්" යන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්ති රාමුවට මඟ පෙන්වන සමස්ත ප්‍රධාන ප්‍රතිපත්ති දිශානතිය යි. ශ්‍රී ලංකාවේ සමකාලීන විදේශ සබඳතා සැලකිය යුතු ලෙස හැඩගැසී ඇත්තේ 2022 උග්‍ර ආර්ථික අර්බුදයෙන් ගොඩඒමේ අවශ්‍යතාවයෙන් බව ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිගනී. මෙම අර්බුදය බාහිර කටයුතු සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු වලට අඛණ්ඩව බලපෑම් කරයි. ඒ සමගම, ප්‍රධාන ගෝලීය සහ කලාපීය බලවතුන් අතර ඉහළ යමින් පවතින භූ දේශපාලනික ආතතීන් ජාතික ආරක්ෂාවට සහ කලාපීය ස්ථාවරත්වයට උපායමාර්ගික අභියෝග ඉදිරිපත් කරන අතර, ඒ සඳහා සමබර, නොබැඳි සහ ස්වෛරීභාවය පිළිබඳ සවිඥානික රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශයක් අවශ්‍ය කරයි.

අමාත්‍යාංශයේ අධිකාරී බලය තුළ සංචාරක ව්‍යාපාරය සහ විදේශ රැකියා ද ඇතුළත් වේ. සැලකිය යුතු ආර්ථික, සමාජ-සංස්කෘතික සහ පාරිසරික ප්‍රතිලාභ ජනනය කිරීමේ හැකියාව ඇතිව ආර්ථිකය ප්‍රධාන වශයෙන් මෙහෙයවන්නක් ලෙස සංචාරක ව්‍යාපාරය හඳුනා ගෙන ඇත. මෙම අංශයේ සම්පත් පදනම ප්‍රධාන කුළුණු හතරක් මත රඳා පවතින බව වටහා ගෙන ඇත: ස්වභාවික වත්කම්, සංස්කෘතික උරුමය, මානව ප්‍රාග්ධනය සහ මූල්‍ය ප්‍රාග්ධනය. මෙම කුළුණු ශක්තිමත් කිරීම තිරසාර සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ගෝලීය තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා කේන්ද්‍රීය වේ.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛණ ලබා ගැනීමේ හැකියාව

මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සම්පූර්ණ කැපවීම් 139 ක් ප්‍රකාශයට පත් කර ඇත. අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ මේ සියලුම කැපවීම් අමාත්‍යාංශයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේදී, මෙම කැපවීම් ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීමට අදහස් කරන 2026-2028 කාලය සඳහා වන අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවතුනි. වාර්තාවන පරිදි,, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත; කෙසේ වෙතත්, තක්සේරු කිරීම සඳහා එය තවමත් විධිමත් ලෙස ලැබී නොමැත.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පහත සඳහන් කැපවීම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පිළිබිඹු වී නොමැති බව අධීක්ෂණ අභ්‍යාසය මගින් හඳුනා ගන්නා ලදී:


- ගෝලීය පිළිගැනීම, ස්ථාපිත ආයතනික ව්‍යුහයන්, බහු-පක්ෂ නියෝජනය සහ නිතර සම්බන්ධ වීමේ අවස්ථා සැලකිල්ලට ගෙන, පාර්ලිමේන්තු රාජ්‍යතාන්ත්‍රිකභාවය ඉහළම ප්‍රමුඛතාවයක් ලෙස ශක්තිමත් කිරීම.

**නිරීක්ෂණය:** ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කර තිබියදීත්, මෙම කැපවීම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ නොමැති අතර, එය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අභිප්‍රාය සහ විධිමත් ප්‍රතිපත්ති සම්මත කිරීම අතර හිඩැසක්/පරතරයක් පෙන්නුම් කරයි.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ විසි එකක් ඉදිරිපත් කරන ලදී. ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණු අතර, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් වල ප්‍රගතිය ලබා ගැනීමට පහසුකම් සැලසුණි. අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ තක්සේරු කිරීමෙන් පෙනී යන්නේ, ඒවායින් පහක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවත්; හතක් උචිත ලෙසත්, හතක් අර්ධ වශයෙන් උචිත ලෙසත්, දෙකක් උචිත නොවන ලෙසත් තක්සේරු කර ඇති බවයි.




**රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ**

**අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම**

රාජ්‍ය මූල්‍යකරණය සම්බන්ධයෙන්, අමාත්‍යාංශය 2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා 7 ක් ද, රුපියල් මිලියන 21,773 ක ප්‍රතිපාදන ද, වෙන්කොට ඇත. එයින් 90% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 10% ක් පමණක් ප්‍රාග්ධන වියදම් සඳහා ද, වෙන් කර තිබුණු අතර, 2026 දී ජාතික අයවැය ප්‍රතිපාදන රුපියල් මිලියන 23,000 ක් ලෙස වැඩි වී ඇති අතර බෙදා වෙන් කිරීම එලෙසම පවතී.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 21,773 ක් වෙන්කොට ඇත. 2025 වසර සඳහා වැය කළ මුදල සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්

"සංචාරක කර්මාන්තයේ අවිධිමත් සේවා සපයන්නන් විධිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම්" (පි. 146) යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව, 2025 සැප්තැම්බර් 3 වන දින පාර්ලිමේන්තුව විසින් 2025 අංක 17 දරන සූදු නියාමන අධිකාරි පනත අනුමත කර ඇත. එමගින් කැසිනෝ, මාර්ගගත සහ අක්වරළ සූදුව ඇතුළු සියලුම සූදුව හා සම්බන්ධ ක්‍රියාකාරකම් නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ මධ්‍යගත අධිකාරියක් ස්ථාපිත කෙරේ. ආදායම ඉහළ නැංවීම, මුදල් විශුද්ධිකරණයට එරෙහි පියවර ශක්තිමත් කිරීම සහ සමාජ හානිය අවම කිරීම සඳහා එය යල්පැන ගිය නීති ප්‍රතිස්ථාපනය කරයි.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | රට වටා ගමනාන්තවල වල දැනට පවතින සංචාරක යටිතල පහසුකම් සහ නවීකරණය කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් | | ✓ | ✓ |
| 02 | රාජ්‍යතාන්ත්‍රික පුහුණු කිරීම් ආයතනය සහ ලක්ෂ්මන් කදිරග ාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය (LKI) ප්‍රතිව්‍යුහගත කිරීම සහ ශක්තිමත් කිරීම | | ✓ | ✓ |
| 03 | සංචාරක කර්මාන්තයේ අවිධිමත් සේවා සපයන්නන් විධිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම | ✓ | | |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 20 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ ඊට වැඩියෙන් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තුගත කර ඇත.

## 20. මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සමස්ත ප්‍රධාන තේමාව වන්නේ මිත්‍රශීලී ආරක්ෂක සේවාවක් ස්ථාපිත කිරීමයි. මහජන ආරක්ෂක පරිපාලනය සහ පාර්ලිමේන්තු කටයුතු යන දෙකෙහිම වගකීම මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට පැවරී ඇත.

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණ වන්නේ පොලිස් සේවය ස්වාධීන, කාර්යක්ෂම, හා මහජනතාව සමඟ සමීපව කටයුතු කරන පුරවැසි කේන්ද්‍රීය ආයතනයක් බවට පරිවර්තනය කිරීමයි. මෙම අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කේන්ද්‍රීය සංරචකයක් වන්නේ යුක්තිය ක්‍රියාත්මක කිරීමයි. ප්‍රධාන කැපවීම් පහත පරිදි වේ:

- පාස්කු ඉරු දින ප්‍රහාරයේ වින්දිතයින් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ නඩු තීන්දුවලින් වරදකරුවන් වූ දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව අපරාධ නීතිය යටතේ නඩු පැවරීම
- කාලයක් තිස්සේ නොවිසඳුණු දේශපාලන ඝාතන, ජනමාධ්‍යවේදීන්ගේ, ක්‍රීඩකයන්ගේ සහ අන් අයගේ පැහැර ගැනීම් පිළිබඳ විමර්ශන කඩිනම් කිරීම
- දේශපාලන බලපෑම් මත තර්ජනයට ලක්ව රට හැරගිය මාධ්‍යවේදීන්, ආරක්ෂක අංශ නිලධාරීන් ඇතුළු අනෙකුත් පුද්ගලයන්ට යුක්තිය ඉටු කිරීම


## ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

අමාත්‍යාංශයේ වරමට අදාළ කැපවීම් 45 ක් ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බව අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙන්නුම් කරයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වනු ඇතැයි අදහස් කරන, 2026-2028 කාලය සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවතුනි. ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත; කෙසේ වෙතත්, එය තවමත් සමාලෝචනය සඳහා විධිමත් ලෙස ලැබී නොමැත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

## අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචනය කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ පහක් ඉදිරිපත් කරන ලද අතර, ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබුණි. මෙය තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් වල ප්‍රගතියට පහසුකම් සැලසීය. අනුමත අමාත්‍ය මණ්ඩල තීරණ තක්සේරු කිරීමෙන් පෙනී යන්නේ එකක් නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවයි. එකක් උචිත ලෙසත්, එකක් අර්ධ වශයෙන් උචිත ලෙසත්, දෙකක් උචිත නොවන ලෙසත් තක්සේරු කර ඇත.




රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා 17 ක් අමාත්‍යාංශය හා සම්බන්ධ කරන ලද අතර, රජයේ මුළු වියදමෙන් 2.25% ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 175,992 ක ප්‍රතිපාදනයක් අමාත්‍යාංශයට ලබා දී ඇත. මෙම වෙන් කිරීමෙන් 91.35% ක් පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර තිබුණු අතර 8.65% ක් පමණක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර තිබුණි. එය යටිතල පහසුකම් සංවර්ධනයට වඩා මෙහෙයුම් කෙරෙහි නැඹුරුවක් පිළිබිඹු කරන බව දැඩිව අවධාරණය කරයි. 2026 අයවැය යටතේ රුපියල් මිලියන 218,696.09 ක්, ඒ හා සමාන පුනරාවර්තන-ප්‍රාග්ධන වියදම් අනුපාතයක් සහිතව වෙන් කරන ලදී.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 198,422 ක් වෙන්කොට ඇත. 2025 වසර සඳහා වැය කළ මුදල සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|
| 01 | මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් කිරීම සඳහා පුනරුත්ථාපන වැඩසටහන් විධිමත් කිරීම | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මූලපුරන ලද පොරොන්දු 04 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන එකක් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තුගත කර ඇත.

## 21. ආරක්ෂක අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

ආරක්ෂක අමාත්‍යාංශයේ සමස්ත ප්‍රධාන අරමුණ වන්නේ ආරක්ෂිත සහ ඔරොත්තු දීමේ හැකියාව ඇති රාජ්‍යයක් සහතික කිරීමයි. ජාතික ආරක්ෂාව ස්වාධීන හා සමබර රාජ්‍යතාන්ත්‍රිකභාවය, මානව හිමිකම් ආරක්ෂා කරන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය, විවිධත්වය වැළඳ ගන්නා සමානාත්මතාවය සහ සමාජ සමගිය සහ පුරවැසියන්ගේ සහ රාජ්‍යයේ ආරක්ෂාව සඳහා කැප වූ වෘත්තීය හමුදාවක් මත පදනම් විය යුතු බව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අවධාරණය කෙරේ.

අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්වලට පාදකවන ප්‍රධාන ක්ෂේත්‍ර අතරට ඇතුළත් වන්නේ: පුරවැසියන් ආරක්ෂා කිරීම; ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම; අභ්‍යන්තර ආරක්ෂාව සහ ජාතික සංහිඳියාව ශක්තිමත් කිරීම; සමුද්‍රීය වසම සහ ගුවන් අවකාශයේ ආරක්ෂාව සහතික කිරීම; ජාතික ආරක්ෂක රාමුව තුළ වගවීම සහ වගකීම ඉහළ නැංවීම; ජාතික සම්පත් ආරක්ෂා කිරීම; බලශක්ති ආරක්ෂාව සහතික කිරීම; ජාතික ආරක්ෂාව කෙරෙහි රාජ්‍ය බුද්ධි සේවාවන්හි දායකත්වය ශක්තිමත් කිරීම; සහ විධිමත් ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම යනාදියයි.

### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාල කැපවීම් 42 ක් ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාවට නැංවීම සඳහා මඟ පෙන්වීමට අදහස් කරන, 2026-2028 කාලසීමාව සඳහා වන අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් වෙමින් පැවතුනි. ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති බවට වාර්තා වුවද, එය තවමත් විධිමත් ලෙස සමාලෝචනය සඳහා ඉදිරිපත් කර නොමැත.

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පහත සඳහන් කැපවීම ජාතික ආරක්ෂාව යටතේවන ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පිළිබිඹු නොවන බව අධීක්ෂණ අභ්‍යාසය මඟින් හඳුනා ගන්නා ලදී.


- නීතියේ ආධිපත්‍යයට අනුකූලව ප්‍රජාතන්ත්‍රවාදය, පුරවැසි අයිතිවාසිකම් සහ මානව හිමිකම් ආරක්ෂා කරන අතරම, ජනවාර්ගික ප්‍රජාවන් අතර සමගිය සහ සහජීවනය ප්‍රවර්ධනය කරන යහපාලන මූලපිරීම් ක්‍රියාත්මක කිරීම.

**නිරීක්ෂණය:** ප්‍රතිපත්ති ප්‍රකාශනයට ඇතුළත් කර තිබියදීත්, මෙම කැපවීම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ දක්නට නොමැති අතර, එමගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අභිප්‍රායයන් සහ ජාතික ආරක්ෂක වසම තුළ විධිමත් ප්‍රතිපත්ති ප්‍රකාශනය අතර හිඩැසක්/පරතරයක් ඉස්මතු කරයි.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 7 ක් ඉදිරිපත්කොට ඇති අතර, ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් වල ප්‍රගතිය ලබාගත හැකිවිය. මෙම අමාත්‍ය මණ්ඩල තීරණ තක්සේරු කිරීමෙන් පෙන්නුම් කරන්නේ දෙකක් නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවයි. තීරණ තුනක් උචිත ලෙසත්, දෙකක් අර්ධ වශයෙන් උචිත ලෙසත්, උචිත නොවන ලෙස කිසිවක් නොපැවති බවටත් තක්සේරු කරන ලදී.





රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා 71 ක් අමාත්‍යාංශය හා සම්බන්ධ කර තිබුණු අතර, රජයේ මුළු වියදමෙන් 4.76% ක් නියෝජනය කරමින්, රුපියල් මිලියන 420,323.70 ක් අමාත්‍යාංශයට වෙන්කොට ඇත. මෙම ප්‍රතිපාදනයෙන් 86% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 14% ක් පමණක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කොටතිබුණු අතර, එයින් මෙහෙයුම් කෙරෙහි නැඹුරු වූ ආරක්ෂක වියදම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම පිළිබිඹු කරයි.

2026 අයවැය යටතේ රුපියල් මිලියන 432,435.00 ක් වෙන්කොට තිබුණු අතර, ඒ හා සමාන පුනරාවර්තන-ප්‍රාග්ධන වියදම් අනුපාතයක් ඇත.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 420,323.70 ක් වෙන්කොට ඇත. 2025 වසර සඳහා වැය කළ මුදල සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ආමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|---|
| 01 | ස්වභාවික විපත් වලට ගොදුරු විය හැකි ප්‍රදේශ හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ අවදානම අඩු කිරීම | ✓ | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 14 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ ඊට වැඩියෙන් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තුගත කර ඇත.

## 22. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි, සමාජ ප්‍රගමනය සහ ජාතික සංවර්ධනය සඳහා විද්‍යාත්මක විසඳුම් ලබාදීම සඳහා පර්යේෂණ සහ සංවර්ධනය මගින් මෙහෙයවන ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම එහි සමස්ත ප්‍රධාන තේමාවයි. ශ්‍රී ලංකාව හට බුද්ධිමත් හා කුසලතා පූර්ණ මානව සම්පත්වලින් සමන්විත ශක්තිමත් පදනමක් ඇති බවත්, ගම් මට්ටමින් පවා නවෝත්පාදකයින් බිහිවන බවත් ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිගනී. කෙසේ වෙතත්, බිම් මට්ටමේ නවෝත්පාදනයන් හඳුනා ගැනීම, පෝෂ්‍ය කිරීම සහ වාණිජකරණය කිරීම සඳහා ව්‍යුහගත යාන්ත්‍රණ වල සීමිත බව මෙන්ම, පර්යේෂණ හා තාක්ෂණ සංවර්ධනයට සහාය වීමට ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති බව එය ඉස්මතු කරයි. අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති දිශානතියේ කේන්ද්‍රීය කුළුණක් වන්නේ මෙම පරතරයන් ආමන්ත්‍රණය කිරීමයි.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ අමාත්‍යාංශයේ අධිකාරී බලය යටතේ අදාළ කැපවීම් 28 ක් ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාවට නැංවීම සඳහා මඟ පෙන්වීමට අදහස් කරන 2026-2028 කාලසීමාව සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් වෙමින් පැවතුනි. වාර්තා වී ඇති පරිදි, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, එය තවමත් සමාලෝචනය සඳහා විධිමත් ලෙස ලැබී නොමැත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ හයක් ඉදිරිපත්කොට ඇති අතර, ඒ සියල්ල සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් වල ප්‍රගතිය ලබාගත හැකිවිය. මෙම අමාත්‍ය මණ්ඩල තීරණ තක්සේරු කිරීමෙන් පෙන්නුම් කරන්නේ ඒවායින් එකක් නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවත්, උචිත ලෙස කිසිවක් තක්සේරු කර නොමැති බවත්, දෙකක් අර්ධ වශයෙන් උචිත බවත්, තුනක් උචිත නොවන බවත් ය.




**රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ**


## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා 20 කට අමාත්‍යාංශය සම්බන්ධ කර පැවති අතර, රුපියල් මිලියන 5,750 ක ප්‍රතිපාදනයක් වෙන්කොට ඇත. එයින් 49% ක් පුනරාවර්තන වියදම් සඳහා සහ 51% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇති අතර, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් වල සමතුලිත අනුපාතයක් පෙන්නුම් කරයි. සංසන්දනාත්මකව, 2026 අයවැය යටතේ රුපියල් මිලියන 6,770 ක් වෙන්කොට ඇති අතර, පුනරාවර්තන වියදම් 46.82% සහ ප්‍රාග්ධන වියදම් 53.18% ක් වන බැවින්, මෙහෙයුම් කෙරෙහි ඇති නැඹුරුවට වඩා සංවර්ධනය කෙරෙහි නැඹුරුවක් දෙසට සුළු දියුණුවක් පෙන්වයි.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයැවය ප්‍රතිපාදන**

2025 වසරේදී අමාත්‍යාංශයට රුපියල් මිලියන 5,750 ක් වෙන්කොට තිබුණි. කෙසේ වෙතත්, වසර තුළ නිම කිරීමට නියමිත ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 2,290 ක් පමණක් වැය කර ඇති අතර එය ආසන්න වශයෙන් 40% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරයි. භෞතික ප්‍රගතිය පිළිබඳ සාරාංශය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

## 23. ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි, ග්‍රාමීය සංවර්ධන න්‍යාය පත්‍රයේ සමස්ත ප්‍රධාන ඉලක්කය වන්නේ, දරිද්‍රතාවය පිටුදැකීම සහ සමස්තය ඇතුළත් කරන සමාජ සංවර්ධනය හරහා වඩා ආරක්ෂිත සමාජයක් සහ පොහොසත් ජාතියක් නිර්මාණය කිරීමයි. මෙම ප්‍රතිපත්ති රාමුවේ මාර්ගෝපදේශක මූලධර්මවලට සමාජ සහයෝගීතාව, සමාජ සවිබල ගැන්වීම, අවශ්‍යතා ඇති අයට ඉලක්කගත මූල්‍ය ආධාර, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, සියලුම පුරවැසියන් සඳහා ජීවන චක්‍රය පදනම් කරගත් සමාජ ආරක්ෂාව, සමාජ සාධාරණත්වය සහතික කිරීම සහ කිසිවෙකු මඟ නොහැරීම සහ සුභසාධන ප්‍රතිලාභ තෝරා ගැනීමේ දී සහ ලබාදීමේදී ප්‍රතිලාභීන්ගේ සහ අදාළ පාර් ශ්වකරුවන්ගේ කාර්යක්ෂම හා අර්ථවත් සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම ඇතුළත් වේ.

රජයේ සමාජ ආරක්ෂණ සහ සුභසාධන වැඩසටහන්වල මූලික අරමුණ වන්නේ, සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමවන අතර, හැකි මුල්ම අවස්ථාවේ දී, ක්‍රියාකාරී ආර්ථික සහභාගිත්වයට මාරුවීමට ඔවුන්ට හැකියාව ලබා දීමයි. ශ්‍රී ලාංකිකයන් සඳහා ජීවන චක්‍ර ප්‍රවේශයක් මත පදනම් වූ විශ්වීය සමාජ ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට රජය අපේක්ෂා කරයි.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබා ගැනීමේ හැකියාව

අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ අමාත්‍යාංශයේ වරම යටතේ අදාල කැපවීම් 81 ක් ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේදී, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාවට නැංවීම සඳහා මඟ පෙන්වීමට අදහස් කරන 2026-2028 කාලසීමාව සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් වෙමින් පැවතුනි. වාර්තා කර ඇති පරිදි, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද, එය තවමත් සමාලෝචනය සඳහා විධිමත් ලෙස ලැබී නොමැත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |

## අමාත්‍යාංශ පිළිබඳව අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචන කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 6 ක් ඉදිරිපත්කොට ඇත. ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලැබී ඇති අතර, එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් පිළිබඳ ප්‍රගතිය ලබා ගැනීමට පහසුකම් සැලසුණි. මෙම අමාත්‍ය මණ්ඩල තක්සේරු කිරීමෙන් පෙනී යන්නේ 2 ක් නිශ්චිත ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවත්, 2 ක් උචිත ලෙස තක්සේරු කර ඇති බවත්, අර්ධ වශයෙන් උචිතවන කිසිවක් නොතිබු බවත්, දෙකක් උචිත නොවන බවත් ය.





රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා 33 ක් අමාත්‍යාංශය හා සම්බන්ධ කර, රුපියල් මිලියන 31,350 ක ප්‍රතිපාදනයක් ලබා දී ඇත. එයින් 80% ක් පුනරාවර්තන වියදම් සඳහා සහ 20% ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇති අතර, එය ග්‍රාමීය යටිතල පහසුකම් සහ වර්ධනය මුලපිරීම්වලට වඩා දැඩිව අවධාරණය කර තිබුණේ මෙහෙයුම් නැඹුරුවක් කෙරෙහි බව පෙන්නුම් කරයි.

2026 අයවැය යටතේ රුපියල් මිලියන 61,691.50 ක් වෙන්කොට ඇති අතර, පුනරාවර්තන-ප්‍රාග්ධන වියදම් අනුපාතයේ සැලකිය යුතු වෙනසක් සිදු වී ඇත. පුරාවර්තන වියදම් 80% සිට 44.56% දක්වා අඩු වී, ප්‍රාග්ධන වියදම් 20% සිට 55.44% දක්වා වැඩි වී ඇත.




**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 31,350 ක් වෙන්කොට ඇත. 2025 වසර සඳහා වැය කළ මුදල සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වයන්

"සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකු ද ඇතුළත් සමුපකාර බැංකුකරණය ශක්තිමත් කර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කිරීම (පි. 153)", යන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුව, 2025 මැයි 7 වන දින රජය විසින් 2025 අංක 15 දරන සමෘද්ධි (සංශෝධන) පනත් කෙටුම්පත හරහා සමෘද්ධි ප්‍රජා පාදක බැංකු සහ සමෘද්ධි ප්‍රජා පාදක බැංකු සමිති රජයේ විගණනයට යටත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගෙන ඇත. සමෘද්ධි මූල්‍ය ආයතන තුළ මූල්‍ය අධීක්ෂණය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා 2025 අගෝස්තු 22 වන දින පාර්ලිමේන්තුව විසින් 2025 අංක 15 දරන සමෘද්ධි (සංශෝධන) පනත අනුමත කරන ලදී.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අමාත්‍ය මණ්ඩලය | පාර්ලිමේන්තුව |
|---|---|---|---|
| 01 | සමෘද්ධි හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුද ඇතුළත් සමුපකාර බැංකුකරණය ශක්තිමත් කර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කිරීම | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මූලපුරන ලද පොරොන්දු 10 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන දෙකක් හෝ ඊට වැඩියෙන් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තුගත කර ඇත.

## 24. වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු වන්නේ, ශ්‍රී ලංකාව ගෝලීය සමුද්‍රීය හා ගුවන් සේවා අංශවල ප්‍රධාන භූමිකාවක් ඉටුකරන්නෙකු ලෙස ස්ථාන ගත කිරීමයි. ශ්‍රී ලංකාව, ලෝකයේ ස්ථානගත වී තිබීම හේතුකොට ගෙන, නැගෙනහිර සහ බටහිර යා කෙරෙන ප්‍රධාන මුහුදු මාර්ග මුණගැසෙන උපායමාර්ගික සන්ධිස්ථානයක ස්ථානගත වී තිබීම හේතුකොටගෙන, ගෝලීය නාවික ක්ෂේත්‍රයේ විශාල භූමිකාවක් නිරූපණය කරනු ලබයි. අපේ රට අසළින් යාත්‍රා කරන නෞකා මගින් නැව් භාණ්ඩ ටොන් ලක්ෂ ගණනක් වාර්ෂිකව ප්‍රවාහනය කෙරේ. රජයේ අරමුණ වන්නේ, සැපයුම් දාමවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, දක්ෂ සමුද්‍රීය ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සහ ඉන්දියානු සාගරයේ එහි පිහිටීමෙන් වාසි ලබාගැනීම මඟින් රට ලෝක මට්ටමේ නාවික මධ්‍යස්ථානයක් බවට විපරිවර්තනය කිරීම යි.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 28 ක් මෙම අමාත්‍යාංශයට සෘජුවම අදාළ වේ. අධීක්ෂණ සොයාගැනීම්වලින් පෙන්නුම් කරන්නේ කැපවීම් 28 ම ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, මෙම කැපවීම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මඟ පෙන්වීම සඳහා නිර්මාණය කර ඇති 2026-2028 සඳහා වන අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් කරමින් පැවතුනි. ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇතත්, එය තවමත් විධිමත් ලෙස සමාලෝචනය සඳහා ඉදිරිපත් කර නොමැත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජූනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | ලැබී ඇත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | ලැබී ඇත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය


සමාලෝචනය කාල පරිච්ඡේදය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 4 ක් ඉදිරිපත් කරන ලදී. ඒ සියල්ල අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, එමඟින් තෝරාගත් ප්‍රතිපත්තිමය මුලපිරීම්වල ප්‍රගතිය ලබා ගැනීමට හැකිවිය. මෙම තීරණ තක්සේරු කිරීමෙන් පෙනී යන්නේ එකක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවයි. එකක් උචිත ලෙසත්, එකක් අර්ධ වශයෙන් උචිත ලෙසත්, එකක් උචිත නොවන ලෙසත් තක්සේරු කරන ලදී.




**රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ**

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා නවයකට අමාත්‍යාංශය සම්බන්ධ කර තිබුණි. ජාතික අයවැයෙන් 2025 සඳහා රුපියල් මිලියන 191 ක් ද, 2026 සඳහා රුපියල් මිලියන 4128 ක් වෙන්කොට ඇත. 2026 අයවැය ඉදිරිපත් කිරීමට පෙර අමාත්‍ය මණ්ඩල සංශෝධනයක් සිදු වූ අතර, වියදම් අනුපාතය විශ්ලේෂණය කළ හැක්කේ මිළඟ වාර්තාවෙනි.





**රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයවැය ප්‍රතිපාදන**

2025 වසරේදී, අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයට රුපියල් මිලියන 191 ක් වෙන්කොට ඇත. කෙසේ වෙතත්, වසර තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා වැය කරන ලද්දේ රුපියල් මිලියන 104 ක් පමණක්වන අතර, එය ආසන්න වශයෙන් 54% ක මූල්‍ය ප්‍රගති අනුපාතයක් පිළිබිඹු කරයි. භෞතික ප්‍රගතියෙහි සාරාංශය අමාත්‍යාංශයෙන් තවමත් ලැබී නොමැත. අමාත්‍ය ධුර සංශෝධන හේතුවෙන් ඉතිරි මුදල් ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ වෙත පවරා ඇත.

2025 අග භාගයේදී, ප්‍රධාන අමාත්‍යාංශවල ආයතනික ව්‍යුහය සැලකිය යුතු ප්‍රතිව්‍යුහගත කිරීමකට භාජනය විය. නාගරික සංවර්ධන සහ වරාය සහ සිවිල් ගුවන් සේවා පිළිබඳ කාර්යයන් එකිනෙකට වෙනස් පරිපාලන ආයතනවලට වෙන් කරන ලදී. නාගරික සංවර්ධන විෂය භාරය නිවාස අමාත්‍යාංශයෙන් ඉවත් කර ප්‍රවාහන අමාත්‍යාංශයට යළි පවරන ලදී. ඊට සමගාමීව, වරාය සහ සිවිල් ගුවන් සේවා විෂය භාරය ප්‍රවාහන අමාත්‍යාංශයෙන් ඉවත් කර, ස්වාධීන වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයක් ලෙස යළි පිහිටුවන ලදී.

මෙම වසර මැද ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2025 සඳහා වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පිළිබිඹුවන අයවැය ප්‍රතිපාදන සංසන්දනාත්මකව අඩු බව පෙනේ. ඒ හේතුවෙන්, වාර්තාකරණ කාල සීමාව සඳහා අර්ථවත් විශ්ලේෂණයක් කිරීමට අවකාශයක් නොමැත. කෙසේ වෙතත්, 2026 ජාතික අයවැය මඟින් මෙම අමාත්‍යාංශය සඳහා වෙනම සහ පූර්ණ වසරක ප්‍රතිපාදනයක් සපයන අතර, එමඟින් ඊළඟ අදියරේ අධීක්ෂණයේ දී වඩාත් පුළුල් තක්සේරුවක් සිදු කිරීමට හැකිවනු ඇත.




රූප සටහන: මූල්‍ය ප්‍රගතිය (3 වන කාර්තුව අවසානයවන විට)

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ මාර්ගය

| අංකය | පොරොන්දුව | අයවැය | 2026 ජාතික අයවැයට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අමාත්‍යාංශ ප්‍රගති වාර්තාව |
|---|---|---|---|
| 01 | වරාය ව්‍යාප්තිය, නඩත්තු, දත්ත ගබඩා, නිෂ්පාදන ක්‍රියාවලීන්, ජාතික නැව්, යටිතල පහසුකම්, අංගනය සහ ක්‍රියාකාරිත්වයන් පුළුල් කිරීම | ✓ | ✓ |
| 02 | සම්බන්ධතාවයට සහාය වීම සඳහා විභවයක් සහිත ප්‍රධාන පෙදෙස් වල දේශීය ගුවන්තොටුපළවල් සහ ජල ගුවන්තොටුපළවල් (water aerodromes) තවදුරටත් සංවර්ධනය කිරීම | ✓ | ✓ |

අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපුරන ලද පොරොන්දු 09 ක් අධීක්ෂණය කර ඇත. ඉහත වගුවේ සන්ධිස්ථාන එකක් ළඟා කරගෙන ඇති පොරොන්දු දැක්වෙන අතර, ඉතිරි පොරොන්දු ඇමුණුම-2 හි ලැයිස්තුගත කර ඇත.

## 25. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

### ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් විශ්ලේෂණය කිරීම

නවීන ජීවිතයක්: පොහොසත් රටක් සහ ප්‍රජාතාන්ත්‍රික ආර්ථිකයක්-පොහොසත් රටක් යනු මූලාශ ප්‍රකාශනයේ සමස්ත ඉලක්කය වේ. ජනතාවට නිදහසේ ආර්ථික කටයුතු වල නියැලීමට සාධාරණ අවස්ථා, සමාන මැදිහත්වීමක් යටතේ ආර්ථික තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධවීම හා සැමට ආර්ථික ප්‍රතිලාභවල සාධාරණ පංගුවක් ලැබීම සහතික කරන ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය මූලික කර ගනිමින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හා තාක්ෂණික සංවර්ධන මාර්ග සිතියමක් සමඟ එකිනෙක බද්ධ වූ නොසැලෙන නිෂ්පාදන ආර්ථිකයක් මගින් 2030 දී ඇ.ඩො. බිලියන 120 ක තථ්‍ය දළ දේශීය නිෂ්පාදිත ඉලක්කයක් සහිතව තිරසාර ආර්ථික වර්ධනයක් හා සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා ප්‍රධාන මූලධර්ම දහයක් පදනම්ව ජාතික ජන බලවේගයේ ආර්ථික ප්‍රතිපත්ති රාමුව ගොඩනඟා ඇත.


### ආයතනික සැලසුම්කරණය සහ ලේඛන ලබාගැනීමේ හැකියාව

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කාර්මික හා ව්‍යවසායකත්වය යටතේ පොරොන්දු 55 ක් ලැයිස්තු ගත කර ඇති අතර, අධීක්ෂණ සොයාගැනීම් වලින් පෙන්නුම් කරන්නේ මෙම අමාත්‍යාංශය සඳහාවන ජාතික ප්‍රතිපත්ති රාමුවට කැපවීම් 55 ක් ඇතුළත් කර ඇති බවයි. සමාලෝචනය කරන අවස්ථාවේ දී, 2026-2028 කාලසීමාව සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම සඳහා අමාත්‍යාංශයේ උපායමාර්ගික සැලැස්ම සකස් වෙමින් පැවති අතර, ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති නමුත්, එය තවමත් විධිමත් ලෙස ලැබී නොමැත.

| ප්‍රලේඛනය | දත්ත එක්රැස් කිරීම පිළිබඳ යාවත්කාලීන තත්ත්වය |
|---|---|
| උපායමාර්ගික සැලැස්ම (2025-2029) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| ක්‍රියාකාරී සැලැස්ම (වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම-2025) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-දෙවන කාර්තුව (2025 ජුනි) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-තුන්වන කාර්තුව (2025 සැප්තැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| කාර්තුමය ප්‍රගති වාර්තාව-හතරවන කාර්තුව (2025 දෙසැම්බර්) | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |
| 2025-09-30 දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව | RTI හරහා ඉල්ලුම්කොට ඇත. ලැබී නැත. |

### අමාත්‍ය මණ්ඩල තීරණ විශ්ලේෂණය

සමාලෝචනය කාලය තුළ, අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 66 ක් ඉදිරිපත් කරන ලද අතර, ඒ සියල්ලටම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එමගින් තෝරාගත් ප්‍රතිපත්ති මුලපිරීම් වල ප්‍රගතිය ලබාගත හැකි විය. අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ තක්සේරුවෙන් තක්සේරුවකින් පෙනී යන්නේ 13 ක් ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම්වලට අතිශයින් උචිත ලෙස වර්ගීකරණය කර ඇති බවයි. කෙසේ වෙතත්, 22 ක් උචිත ලෙසත්, 15 ක් අර්ධ වශයෙන් උචිත ලෙසත්, 16 ක් උචිත නොවන ලෙසත් තක්සේරු කරන ලදී.





රූප සටහන: අමාත්‍ය මණ්ඩල තීරණ

## අයවැය සහ කාර්යසාධනය තක්සේරු කිරීම

2025 ජාතික අයවැය යටතේ අයවැය යෝජනා 101 ක් අමාත්‍යාංශය හා සම්බන්ධ වී ඇති අතර, මුදල් අමාත්‍යාංශයට ජාතික අයවැයෙන් රුපියල් මිලියන 3,562,925.30 ක් (40.33%) යනු සැලකිය යුතු ප්‍රතිපාදන වෙන් කිරීමකි.

මෙම වෙන් කිරීමෙන්, 95.09% ක් පුනරාවර්තන වියදම් සඳහා ද, 4.91% ක් පමණක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කර ඇති අතර, එයින් පිළිබිඹු කෙරෙන්නේ එය සංවර්ධන දිශානතියට වඩා මෙහෙයුම් කෙරෙහි නැඹුරුවක් දැඩිව අවධාරණය කරන බවයි.




රූප සටහන: 2025 සහ 2026 දී පුනරාවර්තන සහ ප්‍රාග්ධනය සමඟ මුළු අයැවය ප්‍රතිපාදන

සංසන්දනාත්මකව, 2026 දී රුපියල් මිලියන 3,148,229 ක් වෙන් කරන ලද අතර, එය ජාතික අයවැයෙන් 35% කි. පුනරාවර්තන-ප්‍රාග්ධන වියදම් අනුපාතය, 93.57% පුනරාවර්තන සහ 6.43% ප්‍රාග්ධනය ලෙස සුළු වෙනසක් සහිතව සිදුවේ.

2025 දී අමාත්‍යාංශයට රුපියල් මිලියන 3,562,925 ක් වෙන්කොට ඇත. 2025 වසර සඳහා වැය කළ මුදල සහ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තවමත් අමාත්‍යාංශයෙන් ලැබී නොමැත.

## ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් පිළිබඳ පාර්ලිමේන්තු ක්‍රියාකාරීත්වයන්

ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, “බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම” (පි. 103) සඳහාවන රජය දළ එකතු කිරීමේ බද්ද 15% සිට 18% දක්වා වැඩි කිරීමට සහ ශ්‍රී ලාංකික පුරවැසියන් මත පනවා ඇති කැසිනෝ ප්‍රවේශ බද්ද ඇමරිකානු ඩොලර් 50 සිට ඇමරිකානු ඩොලර් 100 දක්වා වැඩි කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගන්නා ලදී. ඒ අනුව, කැසිනෝ ප්‍රවේශ බද්ද ඇමරිකානු ඩොලර් 100 දක්වා වැඩි කිරීමට සහ ඔට්ටු ඇල්ලීමේ සහ සූදු ව්‍යාපාර සඳහාවන දළ එකතු කිරීමේ බද්ද 15% සිට 18% දක්වා ඉහළ නැංවීම සඳහා 2026 ජනවාරි 1 වන දින සිට බලපැවැත්වන පරිදි, 2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු (සංශෝධන) පනත[1] රජය විසින් අනුමත කර ඇත.

සමාජ ආරක්ෂණ මූල්‍යකරණය ශක්තිමත් කිරීම සඳහා අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම ක්‍රියාත්මක කිරීම සඳහා, 2025 සැප්තැම්බර් 15 දිනැති කැබිනට් තීරණයක් මගින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට රජය අනුමත කළ අතර, පසුව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 2025 අංක 24 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත 2025 දෙසැම්බර් 5 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අතර, බදු ව්‍යුහය විධිමත් කිරීමේ අරමුණින් බදු අය කළ හැකි සේවාවන්හි විෂය පථය පැහැදිලි කරමින් නිදහස් කිරීම් සඳහා සංශෝධන හඳුන්වා දෙන ලදී.

මෙම සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත ක්‍රියාත්මත කිරීම හා අනුබද්ධව ඇති ආදායම් එකතු කිරීම සහ වියදම් යන දෙකෙහිම විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවෙනු ඇතැයි අධීක්ෂණ අභ්‍යාසය අපේක්ෂා කරයි. විශේෂයෙන්ම, පහත සඳහන් කරුණු හෙළිදරව් කිරීම සඳහා පැහැදිලි මහජන වාර්තාකරණ යාන්ත්‍රණ ස්ථාපිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ:

(අ) බද්ද යටතේ එකතු කරන ලද මුළු ආදායම,

(ආ) සමාජ ආරක්ෂණ වැඩසටහන් වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන, සහ

(ඇ) එවැනි වියදම් හරහා සාක්ෂාත් කරගත් මැනිය හැකි ප්‍රතිඵල.

මහජන විශ්වාසය පවත්වා ගැනීම සහ ශක්තිමත් කළ සහ සාධාරණ සමාජ ආරක්ෂණ සේවාවන් සඳහා මෙම අතිරේක බදු බර සෘජුවම දායකවන බව විදහා දැක්වීමට මෙම බද්ද පරිපාලනය කිරීමේ දී විනිවිදභාවය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ.

ස්ත්‍රීන් පීඩාවට පත්කරන අධික පොලී අයකර ගන්නා අයුක්ති සහගත ක්ෂුද්‍ර මූල්‍ය ණය බරින් ඔවුන් නිදහස් කිරීම සඳහා පියවර (පි. 77) සහ නීතිමය විධිවිධාන සහ මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් ලබාදී ඇති ක්ෂුද්‍ර මූල්‍ය ණය පිළිබඳ සමාලෝචනය කොට අගතියට පත් පාර්ශවයන්ට සහන සැලසීම (පි. 105) යන පොරොන්දු ක්ෂුද්‍ර මූල්‍ය ණය සම්බන්ධව ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි අඩංගු වේ. ඒ අනුව, රජය 2025 අගෝස්තු 11 වන දින ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් ගන්නා ලදී. නව ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පතක් පිළිබඳව 2025 සැප්තැම්බර් 22 දින තවත් අමාත්‍ය මණ්ඩල තීරණයක් ගන්නා ලදී. 2016 අංක 6 දරන පැරණි ක්ෂුද්‍ර මූල්‍ය පනත ප්‍රතිස්ථාපනය කරමින්, අඩු ආදායම්ලාභීන්ට සහ කුඩා ව්‍යාපාර වෙනුවෙන් ණය සාධාරණ බව සහතික කරමින්, ඉහළ පොලී උගුල් හෝ අයුතු ප්‍රයෝජන ගැනීම වැළැක්වීම සඳහා කුඩා ණය සපයන්නන් සඳහා නීති රීති සකස් කරන එම පනත් කෙටුම්පත සඳහා පළමු කියවීම 2025 නොවැම්බර් 26 වන දින සිදු කරන ලදී. බලපත්‍රලාභී ණය දෙන්නන් පොලී සීමාවන්, විනිවිදභාවය පිළිබඳ නීති සහ සදාචාරාත්මක ණය එකතු කිරීමේ ක්‍රම අනුගමනය කළ යුතු අතර, උල්ලංඝනය කිරීම් සඳහා දඬුවම් ද ලබාදිය යුතු ය. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දුව හා සංසන්දනාත්මකව මෙම නීතියේ කාර්යක්ෂමතාවය මැනීම කළ යුත්තේ පනතක් ලෙස පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන් පසුව ය.

1 https://www.parliament.lk/en/business-of-parliament/act-details/G6406

## 5.4 නිරීක්ෂණ

### 2025 ජුනි-දෙසැම්බර් දක්වා ප්‍රධාන සන්දර්භීය සලකා බැලීම්

- අයවැය ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රමාණයක් වියදම් වලට වඩා පුනරාවර්තන වියදම් සඳහා (ණය ආපසු ගෙවීම් හැර) යන බව අධීක්ෂණ ක්‍රියාවලියේ දී හඳුනාගෙන ඇත. මෙයින් පෙන්නුම් කරන්නේ අමාත්‍යාංශ විසින් සංවර්ධන මැදිහත්වීම්වලට වඩා මෙහෙයුම් ක්‍රියාකාරීත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති බවයි. සමස්තයක් ලෙස ගත් කල, සමස්ත අයවැය ප්‍රතිපාදන වල මෙම අනුපාතය පහත පරිදි වේ:

| වසර | සම්පූර්ණ මුදල් වෙන් කිරීම (රුපියල් මිලියන) | පුනරාවර්තන (රුපියල් මිලියන) | % | ප්‍රාග්ධන (රුපියල් මිලියන) | % |
|---|---|---|---|---|---|
| 2025 | 6,637,463 | 5,410,996 | 81.5% | 1,226,467 | 18.5% |
| 2026 | 6,450,279 | 5,166,034 | 80.1% | 1,284,245 | 19.9% |

වගුව 4 ණය ආපසු ගෙවීම් නොමැතිව අමාත්‍යාංශ වෙනුවෙන් අයවැය වෙන් කිරීම, පළාත් සභා අයවැය සහ විශේෂ වියදම් ඒකකය

- ජාතික අයවැය මඟින් පළාත් සභා සඳහා අරමුදල් වෙන් කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශ හා සමාන ආකාරයකින්වන අතර, එයින් පිළිබිඹු කරන්නේ මෙහෙයුම් සහ සංවර්ධන විධි නියෝග සමාන බවයි. 2025 ජාතික අයවැයෙන්, පළාත් සභා සඳහා රුපියල් මිලියන 551,944 ක් වෙන්කොට ඇති අතර, එය සමස්ත රජයේ වියදමින් 6.25% කි.

  2026 ජාතික අයවැයෙන් මෙම වෙන් කිරීම රුපියල් මිලියන 618,100 දක්වා වැඩි වී ඇත. කෙසේ වෙතත්, වියදම්වල සංයුතිය බොහෝ දුරට නොවෙනස්ව පවතී. පුනරාවර්තන-ප්‍රාග්ධන වියදම් අනුපාතය ආසන්න වශයෙන් 85:15 ලෙස අඛණ්ඩව පවතින අතර, එයින් පෙන්නුම් කරන්නේ ප්‍රතිපාදනවලින් වැඩි ප්‍රමාණයක් ප්‍රාග ්ධන ආයෝජන සහ සංවර්ධනය කෙරෙහි නැඹුරු වූ ක්‍රියාකාරකම්වලට වඩා මෙහෙයුම් සහ පරිපාලන වියදම් සඳහා යොමු කර ඇති බවයි.

| වසර | සම්පූර්ණ මුදල් වෙන් කිරීම (රුපියල් මිලියන) | පුනරාවර්තන (රුපියල් මිලියන) | % | ප්‍රාග්ධන (රුපියල් මිලියන) | % |
|---|---|---|---|---|---|
| 2025 | 551,944 | 472,500 | 86% | 79,444 | 14% |
| 2026 | 618,100 | 533,000 | 86% | 85,100 | 14% |

වගුව 5 2025 සහ 2026 පළාත් සභා සඳහා අයවැය වෙන් කිරීම

- ණය ආපසු ගෙවීම, සැලකිය යුතු මූල්‍ය බරකින් සමන්විත වෙයි. 2025 දී වෙන් කළ රුපියල් මිලියන 1,600,000 ක් (මුළු වියදමෙන් 18% ක් පමණ) සහ 2026 දී මිලියන 1,877,740 ක් (මුළු වියදමෙන් 21% ක් පමණ), ජාතික අයවැය තුළ ණය සේවාකරණයේ ඉහළ යන කොටස සාර්ව ආර්ථික හා ව්‍යුහාත්මක බලපෑම් කිහිපයක් නිර්මාණය කළ හැකිය:

| වසර | සම්පූර්ණ අයවැය වෙන් කිරීම (රුපියල් මිලියන) | පුනරාවර්තන (රුපියල් මිලියන) | % | ප්‍රාග්ධන (රුපියල් මිලියන) | % |
|---|---|---|---|---|---|
| 2025 | 8,835,001 | 0 | 0% | 1,600,000 | 18.1% |
| 2026 | 8,980,000 | 0 | 0% | 1,877,740 | 20.9% |

වගුව 6 2025 සහ 2026 දී ණය ආපසු ගෙවීම සඳහා අයවැය වෙන් කිරීම

(අ) **මූල්‍ය අවකාශයේ සීමාවන්:** ණය ආපසු ගෙවීම සඳහා ප්‍රතිපාදන වැඩියෙන් වෙන් කිරීම රාජ්‍ය ආයෝජන, සමාජ ආරක්ෂණය, යටිතල පහසුකම් සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා ඇති මූල්‍ය අවකාශය අඩු කරයි. ප්‍රාග්ධන වියදම් සම්පීඩනය කළහොත් මෙය මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් ආර්ථික වර්ධනය මන්දගාමී කිරීම කළ හැකිය.

(ආ) **සංවර්ධනය වෙනුවෙන් වියදම් කිරීම අඩුවීම:** මුළු වියදමෙන් පහෙන් එකකට වඩා ණය සේවාකරණය සඳහා යොමු කරන විට, රජය සංවර්ධනය කේන්ද්‍ර කරගත් ව්‍යාපෘතිවලට වඩා පුනරාවර්තන කැපවීම් සඳහා ප්‍රමුඛත්වය දීම සිදු කරනු ඇත. මෙය විශේෂයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය සහ ප්‍රාදේශීය සංවර්ධනය වැනි අංශ වල රාජ්‍ය ආයෝජන ගම්‍යතාව දුර්වල කිරීම කළ හැකිය.

(ඇ) **බදුකරණය සහ ආදායම් ඒකරාශී කිරීම සඳහා වන පීඩනය:** ඉහළ ණය සේවාකරණ බැඳීම් පවත්වා ගැනීම සඳහා, රජය වැඩි කරන ලද බදුකරණය හෝ පුළුල් කළ බදු පදනමක් මත විශ්වාසය තබනු ඇත. මෙයින් ආදායම් කාර්යසාධනය ශක්තිමත් කළ හැකි වුවද, ප්‍රවේශමෙන් කළමනාකරණය නොකළහොත්, අධික බදු පීඩනය පෞද්ගලික අංශයේ ආයෝජන සහ පරිභෝජනය අඩාල කිරීම කළ හැකිය.

(ඈ) **ආර්ථිකය පහළ යන අවස්ථාවල දී එයට ප්‍රතිචාර දීමට ඇති හැකියාව සීමිත වීම:** ඉහළ ණය සේවාකරණ බැඳීම් ආර්ථික පසුබෑම්වලදී ඒවාට ප්‍රතිචාර දැක්වීමට මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජයට ඇති හැකියාව සීමා කරයි. අර්බුදකාරී කාල වලදී, සීමිත මූල්‍ය නම්‍යශීලීභාවය, උනන්දු කරන ක්‍රියාමාර්ග සීමා කිරීම කළ හැකිය.

(ඉ) **ආයෝජකයින් තුළ විශ්වාසය සහ ණය පිළිබඳ තිරසරභාවය:** ධනාත්මක පැත්තෙන් බලන කල, විශේෂයෙන් පශ්චාත්-අර්බුද ආපසු අය කර ගැනීමේ (ප්‍රතිසාධන) සන්දර්භයක් තුළ, ස්ථාවර සහ වැඩියෙන් ණය ආපසු ගෙවීමෙන්, ණය ගැනීමට ඇති සුදුසුකම් ඉහළ නැංවීමට, ආයෝජකයන්ගේ විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීමට සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වයට සහාය ලබාදීම සිදු විය හැකිය. කෙසේ වෙතත්, තිරසරභාවය රඳා පවතින්නේ, ආර්ථික වර්ධනය සහ ප්‍රාථමික අතිරික්ත මුදල් උත්පාදනය සමඟ ණය සේවාකරණය අනුබද්ධ වී තිබේ ද යන්න මත ය.

(ඊ) **වර්ධනය සහ සමාජ සාධාරණත්වය කෙරෙහි ඇති බලපෑම:** පුනරාවර්තන සහ ණය බැඳීම් වියදම් සංයුතිය අභිභවා යන්නේ නම්, ආර්ථිකය ආයෝජන මඟින් මෙහෙයවනු වෙනුවට, පරිභෝජනය කෙරෙහි නැඹුරු වීමේ අවදානමක් ඇත. කාලයත් සමඟ, මෙය රැකියා උත්පාදනය, ඵලදායිතාවෙන් ලැබෙන වාසි සහ සමස්තය ඇතුළත් කරන වර්ධන ප්‍රතිඵල කෙරෙහි බලපෑ හැකිය.

මෙම තත්ත්වය මඟින් ණය ස්ථාවරභාවය ප්‍රමුඛතාවක් ලෙස සලකා බලන සීමිත මූල්‍ය පරිසරයක් නිරූපණය වේ. ප්‍රධාන ආර්ථික බලපෑම රඳා පවතින්නේ, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ආදායම් ඉහළ නැංවීම සහ දිගුකාලීන වර්ධනය උත්තේජනය කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන ආයෝජන මඟින් ණය සේවාකරණ ඌනපූරණය වේද යන්න මත ය. මෙම සාධක සමතුලිත කිරීමකින් තොරව, ඉහළ ණය ආපසු ගෙවීමේ අනුපාත, සංවර්ධනය සහ අයකර ගැනීමේ උත්සාහයන් සීමා කිරීම කළ හැකිය.

- විශේෂ වියදම් ඒකකය (Special Spending Unit-SSU) 2025 ජාතික අයවැයෙන් රුපියල් මිලියන 45,593 ක් ද, 2026 දී රුපියල් මිලියන 33,881 ක් ද වෙන්කොට ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික අයවැය පාරිභාෂිතය තුළ, විශේෂ වියදම් ඒකකයක් යනුවෙන් සඳහන් කරන්නේ, රේඛීය අමාත්‍යාංශ නොවන නමුත්, ව්‍යවස්ථානුකූල, ව්‍යවස්ථාපිත හෝ වෙනත් ජාතික වශයෙන් වැදගත් කාර්යයන් ඉටු කරන රජයේ නියෝජිතායතන, කාර්යාල සහ කොමිෂන් සභා වෙනුවෙන් මුදල් වෙන් කිරීම සඳහා භාවිතා කරන ආයතනික කාණ්ඩයකි. එම ආයතන සහ මුදල් වෙන් කිරීම් පහත සඳහන් පරිදි වේ:

| අංකය | ආයතනය | 2025 තුළ මුදල් වෙන් කිරීම (රු.මිලියන) | 2026 තුළ මුදල් වෙන් කිරීම (රු.මිලියන) |
|---|---|---|---|
| 01 | ජනාධිපති කාර්යාලය | 9,000.00 | 11,385.00 |
| 02 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 1,170.00 | 975.00 |
| 03 | ඉහළ අධිකරණ විනිසුරුවරුන් | 577.00 | 689.00 |
| 04 | අමාත්‍ය මණ්ඩල අමාත්‍යවරුන්ගේ කාර්යාලය | 231.00 | 275.00 |
| 05 | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය | 345.50 | 433.00 |
| 06 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 165.00 | 185.00 |
| 07 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 245.00 | 270.00 |
| 08 | පරිපාලන අභියාචනා විනිශ්චය සභාව | 49.50 | 53.00 |
| 09 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 1,374.00 | 2,109.00 |
| 10 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 133.00 | 162.00 |
| 11 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 449.00 | 494.00 |
| 12 | පාර්ලිමේන්තුව | 5,150.43 | 5,280.00 |
| 13 | පාර්ලිමේන්තු සභානායක කාර්යාලය | 78.00 | 85.00 |
| 14 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය | 88.50 | 90.00 |
| 15 | පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය | 331.00 | 337.00 |
| 16 | මැතිවරණ කොමිෂන් සභාව | 21,487.00 | 6,650.00 |
| 17 | ජාතික විගණන කාර්යාලය | 4,352.50 | 4,120.00 |
| 18 | පරිපාලනය සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය | 46.00 | 52.00 |
| 19 | විගණන සේවා කොමිෂන් සභාව | 80.00 | 75.00 |
| 20 | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | 222.00 | 140.00 |
| 21 | සීමානිර්ණය කොමිෂන් සභාව | 19.00 | 22.00 |
| | **එකතුව** | **45,593.43** | **33,881.00** |

**වගුව 7 විශේෂ වියදම් ඒකක ආයතන සහ මුදල් වෙන් කිරීම**

සාම්ප්‍රදායික අමාත්‍යාංශ ව්‍යුහයෙන් පිටත ඒවයෙහි නිශ්චිත කාර්යභාරයන් සහ වියදම්වල වගකීම් පිළිබිඹු කිරීම සඳහා අයවැය තුළ විශේෂ වියදම් ඒකක වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, විශේෂ වියදම් ඒකක සඳහා 2025 ජාතික අයවැයෙන් රු. මිලියන 45,593ක් සහ 2026 අයවැයෙන් රු. මිලියන 33,881 ක් වෙන් කර ඇති අතර, එම මුදල් ප්‍රධාන ස්වාධීන හෝ අර්ධ ස්වාධීන ආයතනවල ක්‍රියාකාරකම්, පරිපාලන වියදම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීමට නියමිතය. මෙම වියදම් යටතේ සේවක වැටුප් හා දීමනා, මෙහෙයුම් වියදම් සහ ඇතැම් අවස්ථාවල ආයතනික වැඩසටහන් සඳහාවන වියදම්ද ඇතුළත් වන අතර, ඒවා ආණ්ඩුකරණය, අධීක්ෂණය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල කාර්යයන් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වේ.

- **2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනත** සඳහා වූ පනත් කෙටුම්පත 2025 ජූලි 8 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන කළ අතර, 2025 සැප්තැම්බර් 11 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව, 2025 සැප්තැම්බර් 23 වන දින එය නීතිගත කරමින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. සභාගත කිරීමේ සිට නීතිගත කිරීම දක්වා සාපේක්ෂ කඩිනම් ප්‍රගතිය මගින් පිළිබිඹු කරන්නේ, ජාතික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය තුළ ආණ්ඩුකරණය සහ වගවීමේ ප්‍රතිසංස්කරණ සඳහා පුමුඛත්වය දෙන බවය. රාජ්‍ය අංශයේ වගවීම ශක්තිමත් කිරීම, දූෂණයට එරෙහිව සටන් කිරීම සහ මූල්‍ය පාලනය වැඩි දියුණු කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමට අනුකූලව, මෙම පනත සැලකිය යුතු ව්‍යවස්ථාදායක පියවරක් ලෙස සැලකිය හැකිය.

**ජාත්‍යන්තර මූල්‍ය අරමුදල** සමඟ ශ්‍රී ලංකාවේ වැඩසටහන හා සම්බන්ධ ආණ්ඩුකරණයේ සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කැපවීම්වල වඩා පුළුල් රාමුව තුළ හඳුන්වා දී ඇති මෙම සංශෝධනය, ආයතනික අධීක්ෂණ යාන්ත්‍රණයන් ශක්තිමත් කරන අතර, විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය, අධිකාරිය සහ බලාත්මක කිරීමේ ධාරිතාව ශක්තිමත් කරයි. කෙසේ වෙතත්, මෙම කාලය තුළ විගණකාධිපතිවරයා පත් කිරීම රජය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අතර මතභේදයට තුඩු දුන් කරුණක් බවට පත් වූ අතර, විධායකයේ අභිලාෂයන් සහ ක්‍රියාපටිපාටිමය පිළිපැදීම පිළිබඳව ගැටළු මතු විය. පසුව ආයතනික මැදිහත්වීම හරහා ගැටළුව විසඳා ගත් අතර, වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසුව එකඟතාවයකට එළඹුණි.

- විශ්‍රාමික ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ලබා දී ඇති විශ්‍රාම වැටුප් සහ විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවකි. 2025 සැප්තැම්බර් 10 වන දින 2025 අංක 18 දරන ජනාධිපතිවරුන්ගේ හිමිකම් (අවලංගු කිරීමේ) පනත බලාත්මක කිරීම, හිටපු ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ලබා දී ඇති විශ්‍රාම වැටුප් සහ විශේෂ වරප්‍රසාද අහෝසි කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම ඉටු කිරීම සඳහා ගනු ලබන ප්‍රත්‍යක්ෂ පියවරක් නියෝජනය කරයි. මෙම පනත මඟින් 1986 අංක 4 දරන ජනාධිපතිවරුන්ගේ හිමිකම් පනත අවලංගු කරයි. එමඟින් හිටපු ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ වැන්දඹුවන්ට කලින් ලබා දී තිබූ නිල නිවාස, මාසික දීමනා, කාර්යමණ්ඩලය, කාර්යාල පහසුකම් සහ ප්‍රවාහනය වැනි රාජ්‍ය අරමුදල් වලින් ගෙවනු ලබන ප්‍රතිලාභ ඉවත් කරනු ලැබේ. පාර්ලිමේන්තුවේ අතිමහත් බහුතරයකින් සම්මත වූ මෙම ප්‍රතිසංස්කරණය, ආර්ථික අර්බුදයෙන් පසු මූල්‍ය වඩාත් ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ස්ථානගත කර ඇති අතර, එය වැඩි දේශපාලනික වගවීමක් සහ රාජ්‍ය වියදම් හේතුයුක්තව සාධාරණීකරණය කිරීම කෙරෙහි මාරුවීමක් පිළිබිඹු කරයි; කෙසේ වෙතත්, වාර්තාවලින් පෙන්නුම් කරන්නේ හිටපු ජනාධිපතිවරුන් සඳහා ව්‍යවස්ථාපිත විශ්‍රාම වැටුප් හිමිකම් තවමත් ක්‍රියාත්මකවන බව ය. එයින් ඇඟවෙන්නේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව ක්‍රියාත්මක කිරීම බොහෝ දුරට සත්‍ය නමුත් සම්පූර්ණයෙන්ම ඉටු වී නොමැති බවයි.

- වසර පහක සේවා කාලයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පිරිනමන විශ්‍රාම වැටුප අහෝසි කිරීම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රධාන පොරොන්දුවකි. මෙම කැපවීම ක්‍රියාත්මක කිරීම සඳහා 2025 ජුනි 16 සහ 2025 නොවැම්බර් 17 යන දිනවල අමාත්‍ය මණ්ඩල තීරණයක් ගනු ලබන අතර, මෙම අදියරේ අධීක්ෂණ කාල සීමාවෙන් පසුව පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම අධීක්ෂණ අභ්‍යාසයේ ඊළඟ අදියරේ දී මෙම ක්‍රියාමාර්ගයේ ප්‍රගතිය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරනු ඇත.

- පාර්ලිමේන්තු සැසිවාරවලට සහභාගී වීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ගෙවනු ලබන දීමනා අහෝසි කිරීමට රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීමක් ඇතුළත් වේ. කෙසේ වෙතත්, වාර්තා කිරීමේ කාලය තුළ, **මෙම පොරොන්දුව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය හෝ ව්‍යවස්ථානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.** කෙසේ වෙතත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදෙන සමූහ රක්ෂණ පහසුකම සම්බන්ධයෙන් වියදම් සාධාරණීකරණයට අදාළ පියවරක් ක්‍රියාත්මක කර ඇත. පාර්ලිමේන්තු වර්ෂයකට මන්ත්‍රීවරයෙකුට රු. 1,000,000 ක උපරිම ආවරණ සීමාවක් සහිත සමූහ රක්ෂණ ඔප්පුවක් ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2023 මැයි 15 වන දින මුලින් ලබා දී තිබුණි. පසුගිය කාලය තුළ මෙම ආවරණය ක්‍රියාත්මක විය. 2025 අයවැය තුළ, වියදම් පාලන ක්‍රියාමාර්ග වල කොටසක් ලෙස, ගරු ජනාධිපතිතුමා විසින් මෙම රක්ෂණ සීමාව එක් සාමාජිකයෙකුට රු. 250,000 දක්වා අඩු කිරීමට යෝජනා කරන ලදී. ඉන් අනතුරුව, මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් රක්ෂණ ප්‍රතිලාභ සීමාව රු. 250,000 ක් කිරීමට ඉදිරිපත් කරන ලද යෝජනාවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. එය 2025 ඔක්තෝබර් 09 දිනෙන් ආරම්භවන රක්ෂණ වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. මෙම තීරණය පාර්ලිමේන්තු වරප්‍රසාද සහ රාජ්‍ය වියදම් අඩු කිරීම සඳහා ගත් අසම්පූර්ණ උත්සාහයක් පිළිබිඹු කරන අතර, සැසිවාර පාදක කරගත් දීමනා අහෝසි කිරීමේ මූලික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම මෙම අදියරේ දී ඉටු වී නැත.

- මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධ වැළැක්වීම සඳහා ඒකාබද්ධ මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීමට සහ නඩු කඩිනමින් විසඳීම සහතික කරමින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා දඬුවම් ශක්තිමත් කිරීමට ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු, ව්‍යවස්ථාදායක සහ මෙහෙයුම් හා සම්බන්ධ පියවරවල සංයෝජනයක් හරහා ආමන්ත්‍රණය කර ඇත.

(අ) ව්‍යවස්ථානුකූල ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ගත් කල, 2022 අංක 41 දරන විෂ, අබිං සහ අන්තරායකර ඖෂධ (සංශෝධන) පනත බලාත්මක කිරීම ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය වැරදි පාලනය කරන නෛතික රාමුව ශක්තිමත් කිරීමේ සැලකිය යුතු පියවරක් සනිටුහන් කළේය. 2022 නොවැම්බර් 25 දින සිට බලාත්මක වූ ප්‍රධාන ආඥා පනතට (218 වන පරිච්ඡේදය) ගෙන එන ලද මෙම සංශෝධනය, බලාත්මක කිරීම වැඩි දියුණු කිරීම සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු පිළිබඳව කටයුතු කිරීම කඩිනම් කිරීම අරමුණු කරගත් ඉහළ නැංවූ දඬුවම් සහ ක්‍රියා පටිපාටිමය විධිවිධාන හඳුන්වා දෙන ලදී. සංශෝධිත නීති රාමුව මඟින් මත්ද්‍රව්‍ය පාලනය සඳහා වඩාත් දැඩි සහ වැළැක්වීමේ ප්‍රවේශයක් අනුගමනය කිරීමේ චේතනාවක් පිළිබිඹු කරයි.

(ආ) මෙම නෛතික ක්‍රියාමාර්ග වලට අනුපූරකව "මතින් තොර රටක්-නිරෝගී පුරවැසි දිවියක්" යන තේමාව යටතේ ඉවත්වන්න-රටම එකට නම් ජාතික මෙහෙයුම ක්‍රියාත්මක කෙරේ. ජනාධිපතිතුමාගේ අනුග්‍රහය යටතේ පවත්වනු ලබන මෙම ව්‍යාපාරය, දිස්ත්‍රික් මට්ටමේ සහභාගිත්වය, මහජන දැනුවත් කිරීමේ මුලපිරීම් සහ නීතිය බලාත්මක කරන සහ පරිපාලන බලධාරීන් අතර සම්බන්ධීකරණ ක්‍රියාකාරිත්වයන් ඇතුළත් කරන ජාතික මට්ටමේ, ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම ප්‍රචාරක වැඩසටහනේ කොටසක් ලෙස ජනාධිපතිවරයා දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන සංචාර, ඉහළ මට්ටමේ දේශපාලන කැපවීමක් පෙන්නුම් කරන අතර මත්ද්‍රව්‍ය වැළැක්වීම සහ සංවිධානාත්මක අපරාධ මැඩපැවැත්වීම සඳහා ඒකාබද්ධ ජාතික ප්‍රතිචාරයක අවශ්‍යතාවය තවදුරටත් තහවුරු කරයි.

(ඇ) මෙම සියලු පියවර එක්ව සලකා බැලීමේදී, ශක්තිමත් කරන ලද නීතිමය ක්‍රමවේදයන් සහ ජාතික මට්ටමේ සම්බන්ධීකරණ ක්‍රියාමාර්ග මගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ඉටු කිරීමේ දිශාවට ප්‍රගතියක් පෙන්නුම් කරයි.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා බදු රහිත වාහන බලපත්‍ර ඉවත් කිරීම (පි. 194) ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දැක්වෙන කැපවීමකි. මෙම අධීක්ෂණ ක්‍රියාවලියේ පළමු අදියරේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කිසිදු වාහන බලපත්‍රයක් නිකුත් කර නොමැති බව හඳුනාගත් අතර, එය මෙම පොරොන්දු කෙරෙහි මුල් අනුකූලතාව පෙන්නුම් කරයි.

- කෙසේ වෙතත්, පසුකාලීනව ගත් පියවරක් මගින් හෙළිදරව් කරන්නේ, මන්ත්‍රීවරුන් සඳහා පමණක් නොව, රාජ්‍ය නිලධාරීන් සඳහා ද වාහන ආනයනය කිරීම අඛණ්ඩව කරගෙන යාමට රජය තීරණය කර ඇති බවයි. මෙම කාරණය පාර්ලිමේන්තුවේ දී ජ්‍යෙෂ්ඨ අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති විසින් ඉදිරිපත් කර, 2025 අයවැයෙන් ඉතිරි මුදල් මේ සඳහා යොදා ගන්නා බව ප්‍රකාශකොට ඇත.

- මෙම පැහැදිලි කිරීම තිබියදී, 2026 අයවැය යෝජනාවක් ලෙස රුපියල් මිලියන 12,500 ක වෙනම වෙන් කිරීමක් අධීක්ෂණ අභ්‍යාසය මඟින් හඳුනාගෙන ඇති අතර, එයට පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 2,500 ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 10,000 ක්[1] වාහන ප්‍රසම්පාදනය සඳහා අඩංගු වේ. ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කැපවීමට ඇති මූලික අනුකූලතාව සහතික කිරීම සහ තීරණයේ මූල්‍ය ගම්‍යාර්ථයන් පැහැදිලි කිරීම සඳහා මෙම වර්ධනයන් තවදුරටත් සත්‍යාපනය කිරීම සහ වඩා ඉහළ විනිවිදභාවයක් මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් අවශ්‍ය වේ.

- කාර්යක්ෂම රාජ්‍ය සේවයක්-කුසලතා කේන්ද්‍රගත වෘත්තීයභාවයක් සඳහා, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් බහු සේවා සැපයුම් මධ්‍යස්ථාන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල ස්ථාපිත කිරීමට පොරොන්දු විය (පි. 198). අධීක්ෂණ ක්‍රියාවලියේ පළමු අදියරේ දී, මුලපිරීම්වලට රජයේ සියලුම ගෙවීම් ඩිජිටල්කරණය සඳහා (GovPay) මාර්ගගත වේදිකාව දියත් කිරීම, ජනාධිපති අරමුදලේ සේවාවන් කොළඹ පිහිටි එහි ප්‍රධාන කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම සහ විද්‍යුත් උපත්, විවාහ සහ මරණ සහතික (Electronic Birth, Marriage or Death Certificates-EBMD) පහසුකම් හඳුන්වා දීම ඇතුළත් වන බව නිරීක්ෂණය කෙරේ. එමගින් විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයින්ට ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල හරහා විද්‍යුත් වශයෙන් උපත්, විවාහ සහ මරණ සහතිකවල සහතික කළ පිටපත් ලබාගැනීමට ඉඩ සැලසේ. 2026 ජාතික අයවැයෙන්, ශ්‍රී ලංකාවට සුවිශේෂී ඩිජිටල් අනන්‍යතා ව්‍යාපෘතිය, ඊ-ග්‍රාම නිලධාරි

1 P, 178, Budget Estimates (Approved), 2026, Volume I, https://www.treasury.gov.lk/api/file/f5514bb0-58d9-4a6b-8bd5-0684966285e0

මාර්ගගත වේදිකාව සහ ඩිජිටල් ආර්ථිකය ප්‍රගමනය වැඩසටහන වැනි ප්‍රධාන ජාතික ඩිජිටල් මුලපිරීම් සඳහා, ශ්‍රී ලංකා රුපියල් බිලියන 30 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 98 ක්) වෙන් කර ඇත. මෙම ව්‍යාපෘති රජයේ නියෝජිතායතන හරහා කාර්යක්ෂම සන්නිවේදනය සහ සේවා සම්බන්ධීකරණයට පහසුකම් සැපයීම සඳහා මධ්‍යගත සහ ආරක්ෂිත ඩිජිටල් රාමුවක් නිර්මාණය කිරීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.[1] ජනාධිපති මාධ්‍ය අංශයට අනුව, 'ප්‍රජා ශක්ති ජාතික වැඩසටහන යටතේ, රජය දිවයින පුරා සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙනුවෙන් රුපියල් මිලියන 01 බැගින් වෙන් කර ඇත. මෙම අරමුදල් ලැප්ටොප් සහ පරිගණක ඇතුළු අවශ්‍ය තොරතුරු තාක්ෂණ දෘඩාංග සහ සේවා ප්‍රසම්පාදනය සඳහා මෙන්ම, නිලධාරීන්ගේ අදාළ ධාරිතාව ගොඩනැඟීම සඳහා වේ.[2] වත්මන් රජයේ කේන්ද්‍රීය ප්‍රමුඛතාවයක් වන්නේ, පුරවැසියන්ට වඩාත් කාර්යක්ෂම, ප්‍රතිචාරාත්මක සහ උසස් ගුණාත්මකභාවයකින් යුත් සේවාවන් සැපයීම සහතික කිරීම සඳහා රාජ්‍ය අංශය ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීම වේ.

- විධායක ජනාධිපති ධුරය අහෝසි කර පාර්ලිමේන්තුව විසින් පත් කරන ලද විධායක බලතල රහිත ජනාධිපතිවරයෙකු පත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම (පි. 194)යි. මෙය මෙම අභ්‍යාසය තුළ අධීක්ෂණයකොට ඇත. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන බවට ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් පාර්ලිමේන්තුවට සහතික වී ඇති බව නිරීක්ෂණය විය. එසේම, අධීක්ෂණ ක්‍රියාවලියේ දෙවන අදියරේ දී අගමැතිනි හරිනි අමරසූරිය මෙම කැපවීම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බලාත්මක කිරීම සමඟ සම්බන්ධ කර, පාර්ලිමේන්තු වේදී[3] එම සහතිකයම ලබා දුන්නාය.

මෙම සහතික කිරීම් මගින් දේශපාලනික අභිප්‍රායයක් පෙන්නුම් කරන අතර, ක්‍රියාවලිය පිළිබඳ ප්‍රත්‍යක්ෂ පැහැදිලි කිරීමක් සහ ක්‍රියාත්මක කිරීම සඳහා නිල කාලරාමුවක් රජය විසින් තවමත් ප්‍රකාශයට පත් කළ යුතුව ඇත. ක්‍රියාපටිපාටිමය පියවර සහ සන්ධිස්ථාන පිළිබඳ විධිමත් සන්නිවේදනයක් නොමැතිකම හේතුවෙන්, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මෙම ප්‍රධාන පොරොන්දුව ඉටු කිරීම පිළිබඳවවන ප්‍රගතිය තක්සේරු කිරීමේ හැකියාව සීමා කරයි.

- අමාත්‍යවරුන්ට/නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ඔවුන්ගේ ධුර කාලය තුළ භාවිතා කිරීම සඳහා එක් වාහනයක් පමණක් ලබාදීම (පි. 194) ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පළමු අදියරේදී අධීක්ෂණය කරන ලද අතර, එක් වාහනයක් පමණක් වෙන් කිරීමේ පොරොන්දුව අමාත්‍යවරෙයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට ද යන්න පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වේ. අමාත්‍යාංශ 25 සඳහාම තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කරන ලද අතර, අමාත්‍යාංශ 13 ක් පමණක් ඒ සඳහා ප්‍රතිචාර දක්වා තිබුණි. පළමු ඉල්ලීම අමාත්‍යාංශ 07 කට ඉදිරිපත් කරන ලදී. අමාත්‍යාංශ 13 කින් ලැබුණු ප්‍රතිචාර පහත පරිදි දැක්විය හැකː

-

1 https://english.news.cn/20251107/9e30e116da1947b3b81e4903b5866ca5/c.html#:~:text=According%20to%20President%20and%20Finance,provincial%20and%20local%20government%20offices.

2 https://pmd.gov.lk/news/under-the-praja-shakthi-initiative-rs-01-million-each-will-be-provided-to-district-secretariats-and-divisional-secretariats-to-enhance-their-digitalisation-capacity/#:~:text=Under%20the%20Praja%20Shakthi%20initiative,limiting%20it%20to%20Colombo%20alone.

3 https://www.pmoffice.gov.lk/news.php?para=RU5vekFVR2dpQTd2VGRiMkZUNE4wREZ6ZGk2VGF0MXFnK1 BpTmFMMkpQajdnQ3QzQ3NYRHFYbDdlZEdTSmtOKw==

| අංකය | අමාත්‍යාංශය | අමාත්‍යවරයා වෙනුවෙන් පවරා ඇති වාහන සංඛ්‍යාව | නියෝජ්‍ය අමාත්‍යවරයා/වරුන් සඳහා පවරා ඇති වාහන සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | වෙළඳ, වානිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන | 02 | 02 |
| 02 | කාන්තා හා ළමා කටයුතු | 02 | 02 |
| 03 | ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණය සහ ප්‍රජා සවිබල ගැන්වීම | 02 | 01 |
| 04 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග | පැහැදිලි නැත[1] | 01 |
| 05 | බලශක්ති | 02 | පැහැදිලි නැත[2] |
| 06 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු | 01<br>01 (ජාතික උරුමය කටයුතු අංශය) | 01 (සංස්කෘතික කටයුතු අංශය)<br>01 (ආගමික කටයුතු අංශය) |
| 07 | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන | පැහැදිලි නැත[3] | 01 |
| 08 | පරිසර | 02 | 01 |
| 09 | වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් | 02 | 02 |
| 10 | කම්කරු | පැහැදිලි නැත[4] | 02 |
| 11 | ආරක්ෂක | 01 | 02 |
| 12 | නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන | 01 | 02 |
| 13 | ධීවර, ජලජ හා සාගර සම්පත් | 02 | 01 |

**වගුව 8 අමාත්‍යාංශ 13ක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය හරහා හරහා ලැබුණු ප්‍රතිචාර**

ඉහත වගුවට ට අනුව, මෙම පොරොන්දුව සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය හරහා හරහා ලැබුණු ප්‍රතිචාර පැහැදිලිව ඉදිරිපත් කර නොමැති බැවින්, අමාත්‍යවරුන් විසින් වාහන භාවිතය පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛය පිළිබඳව මෙම අධීක්ෂණ අභ්‍යාසය මගින් තවදුරටත් විමර්ශනය කිරීමට උත්සාහ දරයි.

- 2019.04.21 වන පාස්කු ඉරුදින සිදුවූ ප්‍රහාරය සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා නිර්දේශවලට අනුව, අදාළ දේශපාලනඥයන් සහ නිලධාරීන්ට කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම (පි. 206) අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත. ජනාධිපතිවරයා විසින් පෙර කමිටුවේ වාර්තාව නිල වශයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදුන් අතර, කඩිනම් නීතිමය ක්‍රියාමර්ග සහතික කිරීමේ පියවරවල කොටසක් ලෙස දැනට දිනපතා සාක්ෂි විමසීම් පවත්වනු ලබයි.
- මෙම පියවරයන් මගින් එම පොරොන්දුව ඉටු කිරීමේ දිශාවට ප්‍රගතියක් පෙන්නුම් කරන අතර, නඩු කටයුතුවල කාර්යක්ෂමතාව සහ කාලෝචිතභාවය ඇගයීම සඳහා අඛණ්ඩ නිරීක්ෂණය අවශ්‍ය වේ.
- පුරවැසියන් හට ආණ්ඩුකරණයට සම්බන්ධ වීමට අවස්ථාවක් සලසමින්, වසරක් ඇතුළත පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ පැවැත්වීම සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව (පි. 230), අර්ධ වශයෙන් ඉටු කර ඇත. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු වූ පරිදි පළාත් පාලන මැතිවරණ පවත්වන ලදී. කෙසේ වෙතත්, පළාත් සභා මැතිවරණ තවමත් පවත්වා නොමැත. 2026 අයවැයට මේ අරමුණ සඳහා ප්‍රතිපාදන ඇතුළත් කර ඇති අතර, එය ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීමේ පියවර පිළිබිඹු කරයි.
- දෙවන අදියරෙහි අධීක්ෂණ කාල සීමාවෙන් පසුව, පළාත් සභා මැතිවරණ පැවැත්වීමේ ක්‍රමවේදය සහ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විදේශ අමාත්‍ය විජිත හේරත් ගේ ප්‍රධානත්වයෙන් විපක්ෂ මන්ත්‍රීවරුන් ඇතුළු පාර්ලිමේන්තු කාරක සභාවක් පිහිටුවන ලද බව ද නිරීක්ෂණය විය. සම්පූර්ණ කැපවීම තවමත් ඉටුකළ යුතුව පවතින නමුත්, මෙම වර්ධනයන් පෙන්නුම් කරන්නේ, ඒ සඳහා වන අඛණ්ඩ උත්සාහයන් ය.

1. අමාත්‍යාංශය මගින් අමාත්‍යවරයා/වරිය සඳහා වාහන වෙන් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු නැත.
2. අමාත්‍යාංශය මගින් අමාත්‍යවරයා/වරිය සඳහා වාහන වෙන් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු නැත.
3. අමාත්‍යාංශය මගින් අමාත්‍යවරයා/වරිය සඳහා වාහන වෙන් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු නැත.
4. අමාත්‍යාංශය මගින් අමාත්‍යවරයා/වරිය සඳහා වාහන වෙන් කර තිබේද යන්න පිළිබඳ තොරතුරු නැත.

- සමස්ත ජනමාධ්‍ය ක්‍රියාවලිය ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම සඳහා ස්වාධීන ජනමාධ්‍ය කොමිෂන් සභාවක් පිහිටුවීමේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම (පි. 61) ඉටුකිරීම තුළ අර්ධ ප්‍රගතියක් පෙන්වයි. මාධ්‍ය වෘත්තිකයන් ප්‍රමිතිකරණය කිරීම සහ පිළිගැනීම අරමුණු කරගත් ශ්‍රී ලංකා මාධ්‍ය වෘත්තිකයන්ගේ වරලත් ආයතනය පිහිටුවීම සඳහාවන පනත් කෙටුම්පතක් සඳහාවන අනුමැතිය අමාත්‍ය මණ්ඩලය විසින් 2025 අප්‍රේල් 7 වන දින ලබාදෙන ලදී. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වගවීම සහ මාධ්‍ය ප්‍රමිතීන් කෙරෙහි අවධානය යොමු කරමින්, පුවත්පත් කලාව අධීක්ෂණය කිරීම සඳහා නියාමන ආයතනයක් අපේක්ෂා කළ ද, වරලත් ආයතනය ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන්නේ ස්වාධීන නියාමන කොමිෂන් සභාවකට වඩා වෘත්තීය ආයතනයක් ලෙස ය.
- විධිමත් මාර්ග හරහා ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ උත්සාහයන් සම්බන්ධයෙන් අභියෝග වලට මුහුණ දීමට සිදුවී ඇත. 2025 දෙසැම්බර් 2 වන දින සෞඛ්‍ය හා මාධ්‍ය අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ සිදුකළ ඉල්ලීමට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු අතර, 2026 ජනවාරි 20 වන දින මේ සම්බන්ධයෙන් පළමු අභියාචනය ඉදිරිපත් කරන ලදී. මේ අතර, මාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය කෞශල්‍යා ආරියරත්න පාර්ලිමේන්තුව අමතමින්, වරලත් ආයතනය පිහිටුවීම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව ඉටු කරන බව ප්‍රකාශ කළාය.
- මුල් පොරොන්දුව සහ වර්තමාන ක්‍රියාත්මක කිරීම අතර ඇති මෙම විෂමතා සැලකිල්ලට ගෙන, රජයේ ක්‍රියාමාර්ග ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුව නිවැරදිව පිළිබිඹු කරන්නේ ද යන්න සහ පුවත්පත් කලාව පිළිබඳ අපේක්ෂිත ස්වාධීන අධීක්ෂණය සාක්ෂාත් කර ගන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා තවදුරටත් සත්‍යාපනය කිරීම අවශ්‍ය වේ.
- දූෂණ විරෝධී කොමිසම වෙත ලැබෙන පැමිණිලි මාස හයක් ඇතුළත විමර්ශනය කිරීම හෝ එසේ නොකරන ලද පැමිණිලි පිළිබඳ වාර්තාවක් සෑම මාස හයකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පි. 202) තොරතුරු දැනගැනීමේ අයිතිය ක්‍රියාවලිය හරහා පසු විපරම් කරන ලදී. 2025 දෙසැම්බර් 22 වන දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (Commission to Investigate Allegations of Bribery or Corruption-CIABOC)) සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත තොරතුරු දැනගැනීමේ අයිතිය පදනම් කරගනිමින් ඉල්ලීමක් කරන ලදී. මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බැවින් 2026 ජනවාරි 20 දින අභියාචනයක් ද ඉදිරිපත් කරන ලදී .
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වැනි සංශෝධනය යටතේ පිළිගත් ජාතික භාෂා ප්‍රතිපත්තිය අවශ්‍ය සම්පත් හා තාක්ෂණික පහසුකම් ලබා දී ක්‍රියාත්මක කිරීම (පි. 231) සඳහාවන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම තවමත් අර්ධ වශයෙන් ඉටු නොවී පවතී. ප්‍රතිපත්තිය මඟින් සියලුම නිල භාෂාවන්ට සමාන පිළිගැනීමක් අවධාරණය කළ ද, දිට්වා සුළි කුණාටු ව්‍යසනය අතරතුර, තවත් ජාතික භාෂාවක්වන දෙමළ භාෂාව නොසලකා හරිමින්, රජයේ නිවේදන සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කරන ලද බව නිරීක්ෂණය විය. මෙය සැලකිය යුතු අන්දමින් මහජන සැලකිල්ලට භාජනය වීම සහ විවේචන ඇති කළේය.[1]
- ප්‍රතිපත්තප්‍රකාශනයේ පොරොන්දුව සම්පූර්ණයෙන්ම ඉටු කිරීම සඳහා, රජය සියලු නිල සන්නිවේදනයන් හරහා ජාතික භාෂා ප්‍රතිපත්තිය ස්ථිරව ක්‍රියාත්මක කළ යුතු අතර, සියලු භාෂාමය ප්‍රජාවන් සඳහා තොරතුරු කෙරෙහි සාධාරණ ප්‍රවේශයක් සහතික කළ යුතු ය.
- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවට අනුකූලව 2025 දී රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා වැටුප් ව්‍යුහය ප්‍රතිසංස්කරණය කරන ලද නමුත්, කඳුකර දෙමළ ප්‍රජාවගේ වැටුප් ජීවන වියදමට සරිලන සේ ඉහළ දැමීම (පි. 231) තවමත් සම්පූර්ණයෙන් ම ඉටුකර නොමැත. 2026 ජාතික අයවැය මඟින් උඩරට වතු කම්කරුවන් වෙනුවෙන් වැටුප් දිරිගැන්වීම් සඳහා රුපියල් මිලියන 5,000 ක් වෙන් කරන ලද අතර, ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම් සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කරන ලදී. අධීක්ෂණ කාලපරිච්ඡේදයේ දෙවන අදියරෙන් පසුව, අවබෝධතා ගිවිසුම දැන් ක්‍රියාත්මක වෙමින් පවතී.
- කෙසේ වෙතත්, ව්‍යුහාත්මක විධිවිධාන පාර්ලිමේන්තුව සහ රාජ්‍ය මුදල් කාරක සභාව තුළ මතභේදයට තුඩු දී ඇති අතර, පොරොන්දුව ඵලදායී ලෙස සහ තිරසර ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සුදුසු නෛතික ක්‍රියාමාර්ග ඉල්ලා ඇත.

1 https://www.thenewhumanitarian.org/news-feature/2025/12/18/lost-translation-how-sri-lankas-tamils-face-repeated-disaster-warning

- රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්-ශ්‍රී ලාංකේය ජාතික සාමාග්‍රියක් යන අංශය යටතේ සෑම අමාත්‍යාංශයකටම විෂය පිළිබඳ විශේෂඥයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩල පිහිටුවීම (පි. 194) පොරොන්දුවක් ලෙස දක්වා ඇත. මේ සම්බන්ධයෙන්, 2025 නොවැම්බර් 18 වන දින අමාත්‍යාංශ 25 සඳහාම තොරතුරු දැනගැනීමේ අයිතිය පදනම් කරගනිමින් ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ 16 ක් ප්‍රතිචාර දක්වා ඇති අතර, අනෙක් 09 ප්‍රතිචාර දක්වා නොමැත. අමාත්‍යාංශ 16 න් ලැබුණු ප්‍රතිචාර වල තොරතුරු පහත පරිදි වේ:

| අංකය | අමාත්‍යාංශය | උපදේශක මණ්ඩලයක් පත් කර ඇත (ඔව්/නැත) |
|---|---|---|
| 01 | අධ්‍යාපන හා උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන | ඔව් |
| 02 | කාන්තා හා ළමා කටයුතු | නැත |
| 03 | ආරක්ෂක | නැත |
| 04 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග- ඉඩම් අංශය | නැත |
| 05 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු | නැත |
| 06 | බලශක්ති | නැත |
| 07 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන | නැත |
| 08 | ධීවර, ජලජ හා සාගර සම්පත් | නැත |
| 09 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක- විදේශ කටයුතු | නැත |
| 10 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා | නැත |
| 11 | කම්කරු | නැත |
| 12 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන | ඔව් |
| 13 | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් | නැත |
| 14 | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන | නැත |
| 15 | පරිසර | නැත |
| 16 | ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණය සහ ප්‍රජා සවිබල ගැන්වීම | නැත |

**වගුව 9 අමාත්‍යාංශ 16ක් සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය හරහා හරහා ලැබුණු ප්‍රතිචාර**

ඉහත වගුවට අනුව, අමාත්‍යාංශවලට සහාය වීම සඳහා උපදේශන මණ්ඩල පිහිටුවීමේ පොරොන්දුව රජය තවමත් සම්පූර්ණයෙන්ම ඉටු කර නොමැත. පවතින ලියකියවිලි මත පදනම්ව, උපදේශකයින්ගේ සංඛ්‍යාව, තෝරා ගැනීමේ ක්‍රියාවලිය හෝ සුදුසුකම්වල අවශ්‍යතා සම්බන්ධයෙන් පැහැදිලිව අර්ථ දක්වන ලද නිර්ණායක නොමැති බව අධීක්ෂණ ක්‍රියාවලිය මඟින් තවදුරටත් නිරීක්ෂණය කරන ල දී. එබැවින්, මෙම පොරොන්දුව ක්‍රියාත්මකවීම පිළිබඳ තත්ත්වය සහ ඒ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කිරීමක් ලබාගැනීමට මෙම අධීක්ෂණයේ මීළඟ අදියරේදී අදහස් කරයි.

# 6

# 2026 ජාතික අයවැයට අනුව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අනුකූලතා සමාලෝචනය

## 6.1 2026 ජාතික අයවැයේ ප්‍රතිපත්තිමය දිශානතිය පිළිබඳ දළ විශ්ලේෂණය

2026 ජාතික අයවැය යනු, රජය සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන පළමු පූර්ණ මූල්‍ය මෙවලම යි. මෙම පරිච්ඡේදය, 2026 වසර සහ ඉන් ඔබ්බට ඇති අයවැයගත වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු (ජාතික ප්‍රතිපත්ති රාමුවෙන් පිළිබිඹු වන පරිදි) කොතරම් දුරට ඉලක්ක කර තිබේද යන්න තක්සේරු කරයි. මෙම විශ්ලේෂණය පහත සඳහන් කරුණු සංසන්දනය කරයි:

- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එක් එක් අමාත්‍යාංශයට පවරා ඇති පොරොන්දු සංඛ්‍යාව
- අයවැයගත වැඩසටහන්/ව්‍යාපෘති සංඛ්‍යාව
- 2026 ජාතික අයවැය හරහා ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු සංඛ්‍යාව

පහත වගුවෙහි පළමු තීරුවේ දක්වා ඇති පරිදි, නිශ්චිත පොරොන්දු සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරීම සඳහා සෑම අමාත්‍යාංශයකටම වගකීම පවරා ඇත. දෙවන තීරුවෙන් 2026 ජාතික අයවැය යටතේ අදාළ අමාත්‍යාංශවලට වෙන් කර ඇති ව්‍යාපෘති සහ වැඩසටහන් සංඛ්‍යාව ඉදිරිපත් කරයි.

මෙම අධීක්ෂණ අභ්‍යාසය මඟින් ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ප්‍රකාශිත පොරොන්දු සහ ඒවාට අනුරූප අයවැය වැඩසටහන් අතර අනුකූලතාවේ මට්ටම තක්සේරු කරන ලද අතර, මෙම අදාළතා විශ්ලේෂණයේ සොයාගැනීම් තුන්වන තීරුවේ ඉදිරිපත් කර ඇත.

| අංකය | අමාත්‍යාංශය | ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු මුළු ගණන | 2026 ජාතික අයවැය ව්‍යාපෘතිය/ වැඩසටහන් | 2026 ජාතික අයවැය හරහා ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු ගණන |
|---|---|---|---|---|
| 01 | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග | 107 | 120 | 74 |
| 02 | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු | 82 | 84 | 22 |
| 03 | ආරක්ෂක | 42 | 71 | 31 |
| 04 | ඩිජිටල් ආර්ථික | 37 | 22 | 22 |
| 05 | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන | 108 | 171 | 35 |
| 06 | බලශක්ති | 68 | 21 | 7 |
| 07 | පරිසර | 76 | 52 | 30 |
| 08 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන | 55 | 124 | 41 |
| 09 | ධීවර, ජලජ හා සාගර සම්පත් | 66 | 20 | 21 |
| 10 | විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක | 139 | 12 | 6 |
| 11 | සෞඛ්‍ය හා ජනමාධ්‍ය | 94 | 143 | 29 |
| 12 | නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන | 33 | 53 | 20 |
| 13 | කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන | 95 | 24 | 13 |
| 14 | අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා | 33 | 62 | 19 |
| 15 | කම්කරු | 25 | 16 | 6 |
| 16 | වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් | 11 | 31 | 11 |
| 17 | වරාය හා සිවිල් ගුවන්සේවා | 28 | 10 | 10 |
| 18 | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන | 20 | 107 | 7 |
| 19 | මහජන ආරක්ෂාව සහ පාර්ලිමේන්තු කටයුතු | 45 | 15 | 8 |
| 20 | ග්‍රාමීය සංවර්ධනය, සමාජ ආරක්ෂණය සහ ප්‍රජා සවිබල ගැන්වීම | 81 | 31 | 16 |
| 21 | විද්‍යා හා තාක්ෂණ | 28 | 18 | 6 |
| 22 | වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන | 21 | 15 | 5 |
| 23 | ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන | 50 | 120 | 65 |
| 24 | කාන්තා හා ළමා කටයුතු | 59 | 21 | 11 |
| 25 | තරුණ කටයුතු සහ ක්‍රීඩා | 64 | 20 | 19 |

**වගුව 10 ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු සහ මූල්‍ය සැලසුම්කරණය අතර අනුකූලතාව**

## 6.2 2026 ජාතික අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශනය සමඟ ඇති අනුකූලතාව

අධීක්ෂණ අභ්‍යාසයේ පළමු අදියරේ දී, 2025 ජාතික අයවැයේ යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර, 2025 වර්ෂයේ දී සම්පූර්ණ කිරීමට යෝජිත යෝජනා 133 ක් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දුවලට අනුකූලබව සොයා ගන්නා ලදී. කෙසේ වෙතත්, අදාළ අමාත්‍යාංශවල වාර්තා වලින් ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ පැහැදිලි තොරතුරු අධීක්ෂණ අභ්‍යාසයට ලබා ගැනීමට අපහසු විය.

අනෙක් අතට, 2026 ජාතික අයවැයට අදාළව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා අධීක්ෂණය මඟින් හඳුනාගෙන ඇත.

| අංකය | 2026 අයවැය යෝජනා | ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දුව |
|---|---|---|
| 01 | රජයේ ආයතන සහ පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය වාහන/යන්ත්‍රෝපකරණ සැපයීම පුනරාවර්තන වියදම් ලෙස මිලියන 2,500 ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස මිලියන 10,000 ක් | මන්ත්‍රීවරුන්ගේ තීරුබදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවතට (194) |
| 02 | රජයේ සේවකයින් සඳහා බැංකු හරහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 500 ක් ලබාදෙන දේපල ණය යෝජනා ක්‍රමය යළි සක්‍රීය කිරීම | අනුරූප පොරොන්දුවක් නැත |
| 03 | ගුරු දුෂ්කරතා දීමනාව සහ විදුහල්පති දීමනාව පුනරාවර්තන වියදම් ලෙස මිලියන 1,000 දක්වා වැඩි කිරීම | විශේෂ හේතූන් මත ශ්‍රම බලකායට ඇතුළත් වීමට නොහැකි වූ අයට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අන්තර්කාලීන දීමනා (72) |
| 04 | අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග වල ගේට්ටු මුරකරුවන් සඳහා දීමනාව පුනරාවර්තන වියදමක් ලෙස රුපියල් මිලියන 250 ක් වැඩි කිරීම | විශේෂ හේතූන් මත ශ්‍රම බලකායට ඇතුළත් වීමට නොහැකි වූ අයට මූලික අවශ්‍යතා සපුරා ගැනීමට අන්තර්කාලීන දීමනාවක් (72) |
| 05 | අබාධ සහිත හෝ විශේෂ අවශ්‍යතා ඇති තරුණ තරුණියන්ගේ රැකියා දිරිගැන්වීම සඳහා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 500 ක් | ආබාධ සහිත පුද්ගලයින්ට අධ්‍යාපනය, පුහුණුව, රැකියා සහ ජීවනෝපාය අවස්ථා සඳහා පහසුකම් (66) |
| 06 | තැලසීමියා රෝගීන්ට සහන සැලසීම සඳහා රාජ්‍ය ආයතන වලට පහසුකම් සැලසීමට පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 1,000 ක් | අනුරූප පොරොන්දුවක් නැත |
| 07 | මුදල් රහිත ආර්ථිකය (Cashless Economy) ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය ආයතන වලට පහසුකම් සැලසීමට පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 1,000 ක් | පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහි කිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම (132) |
| 08 | මත්ද්‍රව්‍ය උවදුර වැළැක්වීම සඳහා ජාතික මට්ටමේ මෙහෙයුමක් දියත් කිරීමට පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 500 ක් සහ ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 1000 ක් | රට තුළ මත්ද්‍රව්‍ය හා පාතාලය මැඩපැවැත්වීම සඳහා ඒකාබද්ධ මෙහෙයුමක් (212) |
| 09 | රාජ්‍ය ආයතන වල ඩිජිටල් ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම - ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 1,000 ක් | පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහිකිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම (132) |
| 10 | අබාධ සහිත සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා පොදු ස්ථාන වල ප්‍රවේශ්‍යතාව සහ සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීම - ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 1,000 ක් | පොදු ගොඩනැගිලි සැලසුම්කරණයේදී ආබාධ සහිත පුද්ගලයින්ගේ ආරක්ෂාව සහ ප්‍රවේශය සහතික කිරීම (97) |
| 11 | රත්නපුර නගර සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීම (රජයේ නිලධාරීන් සඳහා නිල නිවාස ඉදිකිරීම) ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 500 ක් | අනුරූප පොරොන්දුවක් නැත |
| 12 | ඔටිසම් ඇතුළු ආබාධ සහිත දරුවන් වෙනුවෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 500 ක් | ආබාධ සහිත ළමයින්, වීදි දරුවන් සහ පාසල් නොයන ළමයින් ඇතුළු අවදානම් සහිත දරුවන් කල්තියා හඳුනා ගැනීමට සහ ඔවුන් වෙනුවෙන් මැදිහත්වී කටයුතු කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම (83) |
| 13 | ආයතනගත කර සිටින පුද්ගලයින් යළි සමාජගත කිරීම සහ ළමා ආරක්ෂණය සඳහා නිවාස ආධාර සැපයීම ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 2,000 ක් | සහන සහ රැකවරණය අවශ්‍ය යුද- වැන්දඹුවන්, අනාථ පුද්ගලයින්, ආබාධ සහිත ප්‍රජාව හා මානසික පීඩනයට ලක්<br>වූවන් සඳහා සහන සැලසීම (231) |
| 14 | ආරෝග්‍යා මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 1,500 ක් | අනුරූප පොරොන්දුවක් නැත |

| | | |
|---|---|---|
| 15 | දෙනියාය සහ දඹුල්ල රෝහල් සුදුසු ස්ථාන වලට ගෙනයාම සඳහා ප්‍රාග ්ධන වියදම ලෙස රුපියල් මිලියන 1,000 ක් | අනුරූප පොරොන්දුවක් නැත |
| 16 | අම්පාර සහ මොනරාගල නගර ශාලා ඉදිකිරීම සඳහා ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 200 ක් | අනුරූප පොරොන්දුවක් නැත |
| 17 | ඉදිකිරීම් නතර කරන ලද නින්දවූර් සංස්කෘතික මධ්‍යස්ථානය නිම කිරීම සඳහා ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 300 ක් | අනුරූප පොරොන්දුවක් නැත |
| 18 | රිදී ආර්ථිකය (Silver Economy)- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ආයෝජනය - ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 10 ක් | අනුරූප පොරොන්දුවක් නැත |
| 19 | මාතර නිල්වලා ගඟ දිගේ ගංවතුර පාලනය කිරීම සහ ලවණ ජලය ඇතුළුවීම පාලනය කිරීම - ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 1,000 ක් | අනුරූප පොරොන්දුවක් නැත |
| 20 | දේශීය ගුවන්තොටුපළ සංවර්ධනය - ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් මිලියන 1,000 ක් | අනුරූප පොරොන්දුවක් නැත |

**වගුව 11 2026 අයවැය යෝජනා**

ඉහත අයවැය යෝජනා 20 සඳහා, මෙම අධීක්ෂණ ක්‍රියාවලිය මඟින් අර්ධ වශයෙන් උචිතවන ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු 10 ක් හඳුනාගෙන ඇත. 2026 දී සම්පූර්ණ කිරීමට නියමිත ඉහත පොරොන්දු ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ අධීක්ෂණය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

# 7

# අපදා කළමනාකරණය පිළිබඳ රජයේ ක්‍රියාමාර්ග

## 7.1 අපදා කළමනාකරණය සහ පශ්චාත්-දිට්වා සුළි කුණාටු ක්‍රියාමාර්ග පිළිබඳ පොරොන්දු

"පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ආපදා කළමනාකරණය පිළිබඳ කැපවූ තේමාත්මක කොටසක් ඇතුළත් නොවේ. කෙසේ වෙතත්, ආපදා හා සම්බන්ධ කැපවීම් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තේමාත්මක ක්ෂේත්‍ර කිහිපයක් හරහා ගැබ්වී ඇත. මෙම අධීක්ෂණ අභ්‍යාසය විවිධ තේමාවන් හරහා විසිරී ඇති පහත සඳහන් ආපදා හා සම්බන්ධ පොරොන්දු හඳුනා ගත්තේය:

1. ස්වභාවික ආපදා අවදානම් භූමි හඳුනා ගැනීම, කළමනාකරණය හා ආපදා අවම කිරීම (පි. 51)
2. තිරසර භූමි (ඉඩම්) පරිහරණ සැලැස්මක් විද්‍යානුකූලව සකසා ක්‍රියාවට නැංවීම (පි.51)
3. ස්වභාවික විපත් සඳහා පූර්ණ අනතුරු ඇඟවීමේ ක්‍රමවේද හඳුන්වාදීම, මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීම, වන්දි හා රක්ෂණ ක්‍රම හඳුන්වා දීම (පි. 54)
4. ආර්ථික හා සමාජීය කටයුතු සඳහා කඳු වැටි සහ විශාල කඳු බෑවුම් සහිත වනාන්තර භාවිතයට ගැනීම නියාමනය (පි. 53)
5. දේශගුණික විපර්යාසයන්ට අනුගත භෝග ප්‍රභේද, වගා හා වාරි තාක්ෂණික ක්‍රම සැලසුම් කිරීම, ජනනය කිරීම සහ යොදා ගැනීම (පි.116)
6. නීතිවිරෝධී ධීවර කටයුතු අධෛර්යමත් කිරීම, සමුද්‍රීය අනතුරු සහ දූෂණයන් අවම කිරීම සහ හදිසි ප්‍රතිචාර හා සමුද්‍රීය විපත් අවම කිරීම සඳහා යාන්ත්‍රණයන් (පි. 125)
7. ගංවතුර, ලැව්ගිනි සහ නායයෑම් සඳහා (පූර්ව) ප්‍රගාමීය සහ සක්‍රීය (Proactive and real-time alerts systems) අනතුරු ඇඟවීම් සඳහා ක්‍රියාකාරී ආපදා කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම (පි. 138)

8. හදිසි ආපදා ප්‍රතිචාර සහ සූදානම් වීමට ප්‍රමුඛත්වය දීම ඇතුළුව සමුද්‍රීය වසමෙහි ධාරිතා හිඩැස් සොයා ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම (පි. 140)

9. ඉඩම් පරිහරණ ජාතික සැලැස්මට අනුකූලව ජලපෝෂක, ජෛව විවිධත්ව උණුසුම් ස්ථාන ආදිය සිතියම් ගත කිරීම (පි. 140)

10. ඉඩම් පරිහරණ සැලසුම් කිරීම තුළින් ආපදා අවම කිරීම, දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ යාන්ත්‍රණයක් (පි. 187)

11. ජාතික ආපදා තත්ත්වයන් කළමනාකරණය සහ ශ්‍රම බලකාය පුහුණු කිරීමේ දී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතන වල සහභාගිත්වය සහතික කිරීම (පි. 191)

12. ගෝලීය මානුෂීය ආධාර සහ ආපදා සහන මෙහෙයුම් වලදී ශ්‍රී ලංකාවේ කාර්යභාරය වැඩි දියුණු කිරීම, දේශීය ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකාව තුළ ධාරිතාව ගොඩනැගීම (පි. 221)

13. සෞඛ්‍ය සහ ආර්ථික බලපෑම් අවම කිරීම, කාර්මික හා පාරිසරික දූෂණ, ස්වාභාවික විපත්, ගිනි ගැනීම් සහ නියඟ ආදියෙන් සිදුවන බලපෑම් හඳුනාගෙන ප්‍රතිචාර දැක්වීමෙන් පුරවැසියන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා ආපදා කළමනාකරණ ව්‍යුහය විධිමත් කිරීම (පි. 227)

පළමු පොරොන්දු හතර **"පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්"** යන තේමාව යටතට වැටේ. ඊළඟ පොරොන්දු **"නවීන ජීවිතයක් - පොහොසත් රටක්"** යටතේ වර්ගීකරණය කර ඇත. ඉතිරි පොරොන්දු දෙක **"අභිමානවත් ජීවිතයක්- නොසැලෙන රටක්"** යටතේ ඇතුළත් කර ඇත. සැලකිය යුතු අයුරින්, **"ගෞරවනීය ජීවිතයක්- සුරක්ෂිත රටක්"** යන තේමාව යටතේ ආපදා හා සම්බන්ධ කිසිදු පොරොන්දුවක් ඇතුළත් කර නොමැත. සමස්තයක් වශයෙන්, මෙම ආපදා හා සම්බන්ධ කැපවීම් 13, අමාත්‍යාංශ කිහිපයක විෂය භාරයන් හරහා බෙදා හැර ඇත.

## 7.2 ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ ආපදා හා සම්බන්ධ කැපවීම්

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්ති ප්‍රකාශනය ජාතික ප්‍රතිපත්ති රාමුවක් ලෙස පිළිගත් පසු, ආපදා හා සම්බන්ධ කැපවීම් තනි තේමාත්මක කාණ්ඩයක් යටතේ ගොනු කරන ලදී. ආපදා කේන්ද්‍ර කරගත් ප්‍රතිපත්ති කැපවීම් දහයක් පහත සඳහන් පරිදි හඳුනා ගන්නා ලදී:

1. ස්වාභාවික විපත් ඇති විය හැකි ප්‍රදේශවල අවදානම් හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ අඩු කිරීම

2. විද්‍යාත්මකව නිර්මාණය කරන ලද තිරසර ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

3. දැඩි පාලනයන් සමඟ කඳු වැටි සහ අධික බෑවුම් සහිත පෙදෙස්වල වනාන්තර නියාමනය කිරීම

4. පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හඳුන්වා දීම, මිනිස් ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ වන්දි සහ රක්ෂණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම

5. සෞඛ්‍ය හා ආර්ථික බලපෑම් අවම කිරීම සහ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ආපදා කළමනාකරණ ව්‍යුහයන් විධිමත් කිරීම

6. දත්ත මඟින් මෙහෙයවන පර්යේෂණ සහ සංවර්ධන විසඳුම් සපයමින්, ගංවතුර කලාප සිතියම් ගත කිරීම සහ මිනිසා විසින් සිදුකළ සංවර්ධනයන් සමඟ ඇති සහසම්බන්ධනයන් තක්සේරු කිරීම

7. කුණාටු, ගංවතුර, සුනාමි, නායයෑම් සහ අනෙකුත් ව්‍යසන සඳහා පූර්ව මහජන අනතුරු ඇඟවීම් ලබාදීම සඳහා අධි-තාක්ෂණික කාලගුණ යෙදුම් වර්ධනය කිරීම

8. අධි-අවදානම් ප්‍රදේශවල භූමි හායනය පිළිබඳ සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම සහ නායයෑම් වැළැක්වීම සඳහා පසෙහි සශ්‍රිකත්වය සහ ව්‍යුහය වැඩි දියුණු කිරීම

9. පාඩු අවම කිරීම සඳහා දියුණු තාක්ෂණයන් භාවිතා කරමින් දේශගුණික විපර්යාස නිසා ඇතිවන ස්වභාවික විපත් විමර්ශනය කිරීම

10. රක්ෂණ යෝජනා ක්‍රම සහ විශේෂ ආපදා සූදානම් අරමුදල් ඇතුළුව, ඉදිරි දශකය සඳහා ස්වභාවික ආපදා කළමනාකරණ උපායමාර්ගයන් ස්ථාපිත කිරීම සඳහා කර්මාන්ත හා මහජන සංසද සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම

මෙම කැපවීම් දහයෙන්, පළමු පහ සෘජුවම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී. ඉතිරි පහ ජාතික ප්‍රතිපත්ති රාමු මට්ටමින් හඳුන්වා දුන් නව එකතු කිරීම් නියෝජනය කරයි. මෙම අධීක්ෂණ ක්‍රියාවලිය මඟින් මෙම එකතු කිරීම් හඳුනා ගන්නේ, දිට්වා සුළි කුණාටු ව්‍යසනයට පෙර හඳුන්වා දුන්, ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පසු සිදු කළ ප්‍රතිපත්ති පුළුල් කිරීම් ලෙස ය.

## 7.3 දිට්වා සුළි කුණාටුවෙන් පසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ ඒවා ක්‍රියාත්මක කිරීම

දිට්වා සුළි කුණාටුවෙන් පසු සන්දර්භය තුළ, ආපදා කළමනාකරණය රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ තීරණාත්මක අංගයක් බවට පත්ව ඇත. විශේෂයෙන් ගලවා ගැනීම, සහන සහ ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් එසේ වේ. ක්ෂණික ප්‍රතිචාරයක් ලෙස, රජය රටපුරා හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ අතර, වගවීම ශක්තිමත් කිරීම සහ ප්‍රතිචාර යාන්ත්‍රණයන් කඩිනම් කිරීම අරමුණු කරගත් රෙගුලාසි සහ චක්‍රලේඛ නිකුත් කළේය.

දිට්වා ව්‍යසනයෙන් පසු ගලවා ගැනීමේ, සහන සහ නැවත ගොඩනැඟීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා, රජය පහත සඳහන් ගැසට් පත්‍ර සහ චක්‍රලේඛ නිකුත් කරන ලදී:

| ගැසට්/චක්‍රලේඛ අංකය | අමාත්‍යාංශය/ආයතනය | නාමය/ශීර්ෂය | නිකුත් කළ දිනය | සබැඳිය |
|---|---|---|---|---|
| අතිවිශේෂ ගැසට් පත්‍රය අංකය 2464/30 | ජනාධිපතිවරයා | ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ශ්‍රී ලංකාවේ මහජන හදිසි අවස්ථා තත්ත්වයක් පැවතීම | 28-11-2025 | https://documents.gov.lk/view/extra-gazettes/2025/11/2464-30_S.pdf |
| අයවැය චක්‍රලේඛය අංකය 05/2025 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් පීඩාවට පත්වී ඇති ජනතාවට සහන සැලසීම | 28-11-2025 | https://www.treasury.gov.lk/api/file/83635791-9ce0-4bc3-8656-6f03fd989491 |
| අයවැය චක්‍රලේඛය අංකය 06/2025 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බිඳ වැටී ඇති ජන ජීවිතය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම | 01-12-2025 | https://www.treasury.gov.lk/api/file/5fb01300-9652-4cac-9698-57ee3f86ffb8 |
| අයවැය චක්‍රලේඛය අංකය 07/2025 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බිඳ වැටී ඇති ජන ජීවිතය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම | 02-12-2025 | https://www.treasury.gov.lk/api/file/6776d6b7-676b-4662-a818-9191665225bf |
| අයවැය චක්‍රලේඛය අංකය 08/2025 | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන | 05-12-2025 | https://www.treasury.gov.lk/api/file/34b7f398-5f52-422b-aee7-fd9834f3c224 |
| අයවැය චක්‍රලේඛය අංකය 08/2025 (i) | මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන | 20-12-2025 | https://www.treasury.gov.lk/api/file/a3c76c53-332e-4789-9e8f-329ad86d8a91 |
| අතිවිශේෂ ගැසට් පත්‍රය අංකය 2464/30 | ජනාධිපතිවරයා | ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධන බලකායක් ස්ථාපිත කිරීම | 31-12-2025 | https://sinhala.dgi.gov.lk/images/2025/12/31/2469-09_S.pdf |

වගුව 12 පශ්චාත්-ව්‍යසන කාලය තුළ නිකුත් කළ රජයේ ගැසට් සහ චක්‍රලේඛ

ඊට අමතරව, දිට්වා ව්‍යසනයෙන් පසු ප්‍රතිසාධන කටයුතු සඳහා සහාය වීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ පහක් ගනු ලැබීය:

1. ආපදාවෙන් පීඩාවට පත් ජනගහනයට හදිසි සහන සැලසීම (2025 දෙසැම්බර් 1)
2. Rebuilding Sri Lanka අරමුදල (2025 දෙසැම්බර් 1)
3. ලෝක බැංකුවෙන් අරමුදල් සපයන ව්‍යාපෘති තුළ හදිසි අවස්ථා හදිසි ප්‍රතිචාර සංරචක සක්‍රීය කිරීම (2025 දෙසැම්බර් 10)
4. සහන සහ පුනරුත්ථාපනය සඳහා ආසියා පැසිෆික් ආපදා ප්‍රතිචාර අරමුදලෙන් ප්‍රදානයක් ලබා ගැනීම (2025 දෙසැම්බර් 10)
5. ව්‍යසනයෙන් බලපෑමට ලක් වූ ආගමික ආයතන ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ආධාර සැපයීම (2025 දෙසැම්බර් 10)

## 7.4 මූල්‍ය කැපවීම්

රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වලට අමතරව, 2026 පරිපූරක ඇස්තමේන්තුවක් හරහා වෙන් කළ මූල්‍ය කැපවීම් ද ඇත. 2025 දෙසැම්බර් 19 වන දින, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ විනාශයෙන් පසු ප්‍රතිසාධන කටයුතු වෙනුවෙන් අරමුදල් සැපයීම සඳහා රුපියල් බිලියන 500 ක (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.6 ක) අතිරේක වෙන් කිරීමක් අනුමත කරන ලදී. කෙසේ වෙතත්, මෙම අතිරේක වියදම් 2026 අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.5% කින් ඉහළ නංවන අතර, එමගින් මූල්‍ය අවකාශය (fiscal space) සීමා කිරීමක් සිදුවේ.[1] මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2025 අංක BD/CBP/01/01/50/2025 දරන චක්‍රලේඛය හරහා මෙය දැනුම් දෙන ලදී.[2] ආපදාව හේතුවෙන් අඩාල වූ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සහ විනාශ වූ යටිතල පහසුකම් යළි ගොඩනැගීම සඳහා මෙම පරිපූරක ඇස්තමේන්තුව අනුමත කරන ලදී. මෙම ඇස්තමේන්තුව මඟින් යටිතල පහසුකම් සඳහා රුපියල් බිලියන 250 ක්, ව්‍යාපාර සහ ජීවනෝපායයන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රුපියල් බිලියන 150 ක් සහ සෘජු සහන සහ නිවාස සඳහා රුපියල් බිලියන 100 ක් වෙන් කර ඇත.

## 7.5 අධීක්ෂණ අර්ථකථන

ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම්, අලුතින් සම්මත කරගත් ප්‍රතිපත්තිමය පියවර, හදිසි ගැසට්, භාණ්ඩාගාර චක්‍රලේඛ, අමාත්‍ය මණ්ඩල තීරණ සහ Rebuilding Sri Lanka අරමුදල හරහා ඒකරාශී කරන ලද අරමුදල් වල එකතුව, ආපදා කළමනාකරණය සහ ප්‍රතිසාධන උත්සාහයන් අධීක්ෂණය කිරීම සඳහා අතිරේක සහ සමාන්තර මාර්ගයක් නිර්මාණය කර ඇත. ඒ අනුව, තෙවන පාර්ශවීය සහ ස්වාධීන අධීක්ෂණ යාන්ත්‍රණයන්, විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථය යටතේ 2026 වසර පුරාවටම ආපදා ප්‍රතිචාර, ප්‍රතිසාධනය සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ ක්‍රියාවලීන් තක්සේරු කිරීම අඛණ්ඩව සිදු කරගෙන යයි. "Rebuilding Sri Lanka ජනාධිපති කාර්ය සාධක බලකාය" පිහිටුවන ලද්දේ, සියලු පශ්චාත්-ආපදා පුනරුත්ථාපන, ප්‍රතිසාධන සහ යළි ඉදිකිරීමේ කටයුතු සඳහා උපායමාර්ගික නායකත්වය, සම්බන්ධීකරණය, ඒකාබද්ධ ප්‍රවේශයක් සහ අධීක්ෂණය සැපයීම සහ විශාල විශ්වාසයක් සහ විශ්වාසවන්ත බවක් ඇති කිරීම සඳහා ය.[3] කෙසේ වෙතත්, Rebuilding Sri Lanka අරමුදලේ නෛතික තත්ත්වය පිළිබඳව රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ දී ප්‍රශ්න කර ඇත.

අර්බුදය අතරතුර උද්දේශනය සහ ප්‍රතිචාර දැක්වීම සඳහා සිවිල් සමාජ සංවිධාන ක්‍රියාකාරීව නියැලී සිටියහ. කාර්යසාධන බලකායට සහ අදාළ අනුකමිටු වලට සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් ඇතුළත් කිරීම ප්‍රශංසනීයවන අතර, පශ්චාත් අර්බුද කළමනාකරණ ක්‍රියාවලිය තුළ ප්‍රධාන කරුණු ආමන්ත්‍රණය කරන ආකාරය පිළිබඳ ප්‍රසිද්ධියේ ලබාගත හැකි තොරතුරු නොමැති බව දක්නට ලැබුණි. වඩාත් ඵලදායී සහ සමස්තය ඇතුළත් කරන ප්‍රතිචාරයක් සහතික කිරීම සඳහා ප්‍රාදේශීය, කලාපීය සහ ජාතික මට්ටම් හරහා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමට සැලකිය යුතු ඉඩකඩක් ද තිබේ. ආපදා වලට ප්‍රතිචාර දැක්වීමේ සහ ප්‍රතිසාධන ප්‍රයත්නයන් තුළ නොසලකා හැරීමේ අවදානමක් ඇති, කාන්තාවන්

1 https://publicfinance.lk/public/en/topics/budget-2026-lkr-500-billion-relief-bill-shrinks-fiscal-space-1766561006
2 https://treasury.gov.lk/api/file/4f526647-b266-4ebe-aeee-ae6612c47cd3?utm_source=chatgpt.com
3 https://www.dgi.gov.lk/images/2025/12/31/2469-09_E.pdf

ඇතුළු, අවදානමට ලක්විය හැකි ජනගහනයන් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරන ලෙස සිවිල් සමාජ සංවිධාන රජයෙන් ඉල්ලා සිටියහ. ආපදා කළමනාකරණ මැදිහත්වීම් සමස්තය ඇතුළත් කිරීම සහ සාධාරණව තිබීම සහතික කිරීම සඳහා අධීක්ෂණ යාන්ත්‍රණයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය බිම් මට්ටමෙන් ලැබෙන ඇතැම් නිරීක්ෂණ වලින් පෙන්නුම් කරයි. සහන ප්‍රයත්නයන්, නෛතික හා ප්‍රතිපත්තිමය ගැටළු, ආණ්ඩුකරණය සහ ව්‍යුහාත්මක ගැටළු, රාජ්‍ය මූල්‍ය, සහ මතුවෙමින් පවතින සහ දිගුකාලීන ගැටළු වල කොටසක් ලෙස ගත යුතු ක්ෂණික පියවර ඉස්මතු කිරීම හරහා, දිට්වා පශ්චාත් සුළි කුණාටුවෙන් පසු ප්‍රකෘති තත්ත්වයට පත්වීම සඳහා සලකා බැලිය යුතු ප්‍රධාන කෙටිකාලීන හා දිගුකාලීන ගැටළු පිළිබඳව රජයේ අවධානය යොමු කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternatives-CPA) යෝජනා කර ඇත.[1] වැදගත් ලෙස, අර්බුදය තුළ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට සහාය වීම, සමස්තය ඇතුළත් කරන සහ අයිතීන් පදනම් කරගත් ප්‍රතිචාර වෙනුවෙන් පෙනී සිටීම සහ බිම් මට්ටමේ යථාර්ථයන් ඉස්මතු කිරීම මගින් සිවිල් සමාජය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. එබැවින් සිවිල් සමාජ සංවිධාන සමග අඛණ්ඩව සම්බන්ධ වීමෙන්, විනිවිදභාවය, වගවීම සහ ප්‍රජා කේන්ද්‍රීය ප්‍රතිසාධන උත්සාහයන් ශක්තිමත් කිරීම සඳහා අර්ථවත් ලෙස දායක විය හැකිය.

මේ අතර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (National Building Research Institute-NBRO) නීත්‍යානුකූල, සංස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා 2025 ඔක්තෝබර් 7 වන දින 2025 අංක 20 දරන ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන පනත පාර්ලමේන්තුව විසින් අනුමත කරන ලදී. මෙම පනත මගින් නායයෑම් අවදානම් කළමනාකරණය කිරීම, ජාතික ගොඩනැගිලි කේත සැකසීම සහ ආපදා වලට ඔරොත්තු දෙන ඉදිකිරීම් සහතික කිරීම අරමුණු කරයි. 2021 දී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට නීතිමය පිළිගැනීමක් ලබාදීමට පනතක් සකස් කිරීම සඳහා 2021-10-05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් නීති කෙටුම්පත් සම්පාදක හට උපදෙස් දෙන ලදී.[2]

1 https://www.cpalanka.org/key-short-term-and-long-term-issues-to-consider-for-post-cyclone-ditwah-recovery/

2 https://island.lk/national-building-research-institute-to-be-established/

# 8

# නිර්දේශ

ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයේ දෙවන අර්ධ-වාර්ෂික වාර්තාවේ සොයාගැනීම් මත පදනම්ව, පහත සඳහන් නිර්දේශ යෝජනා කරනු ලබයි:

1. **පරතරයන් පිළිබඳ පැහැදිලි කිරීම:** දේශපාලන ලේඛනයක් ලෙස ඉදිරිපත් කරන ලද මුල් ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම් සහ ඒවා රාජ්‍ය ලේඛනයක් ලෙස ජාතික ප්‍රතිපත්ති රාමුව තුළට පරිවර්තනය කිරීම අතර පවතින නිරීක්ෂණය කරන ලද පරතරයන් සම්බන්ධයෙන් රජය විසින් සවිස්තරාත්මක පැහැදිලි කිරීම් ලබා දිය යුතුය. මෙය රජයේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට සහ මහජන විශ්වාසය ඉහළ නැංවීමට දායක වනු ඇත.

2. **අභ්‍යන්තර අධීක්ෂණ යාන්ත්‍රණයන්:** ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම නිරීක්ෂීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලබන වැඩපිළිවෙළ ඇතුළුව, රජය විසින් ක්‍රියාත්මක කරන අභ්‍යන්තර අධීක්ෂණ ක්‍රියාවලීන්ගේ කාර්යක්ෂමතාව සොයාබලා වාර්තා කළ යුතුය. මෙය එම යාන්ත්‍රණ පැහැදිලිව නිර්වචිත ආයතනික මට්ටමක ක්‍රියාත්මක වීම සහ ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම්වල ප්‍රගතිය පිළිබඳ වාර්තා නිරන්තරයෙන් ප්‍රකාශයට පත් කිරීම සහතික කරයි.

3. **ක්‍රියාත්මක කිරීමේ මාර්ගය පිළිබඳ ඇගයීම:** ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ , එය සකස් කර ඇති ආකාරයේ සිට ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කිරීම, උපායමාර්ගික සැලසුම්වලට පරිවර්තනය කිරීම සහ අදාළ අමාත්‍යාංශ මට්ටමේ ක්‍රියාකාරී සැලසුම් හරහා ක්‍රියාත්මක කිරීම දක්වා වූ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක ඇගයීමක් සිදු කිරීම. මෙහිදී, අදාළ අමාත්‍යාංශ හා ආයතන විසින් ඉටු කරන ලද කාර්යභාරයන් ද විමර්ශනයට ලක් කරනු ලැබේ.

4. **අමාත්‍යාංශ මට්ටමේ අනුගමනය:** අමාත්‍යාංශ විසින් උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් අනුගමනය කර ඇතිද නැද්ද යන්න ඇගයීමට ලක් කිරීම සහ ප්‍රතිපත්ති ප්‍රකාශන මුලපිරීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ කැපවීම් මට්ටම්වල ඇති වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කිරීම.

5. **අයවැය භාවිතයේ වගවීම:** ප්‍රතිපත්ති ප්‍රකාශන කැපවීම්වලට අදාළ ජාතික අයවැය 2025 ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස භාවිත නොකිරීම හෝ ක්‍රියාත්මක නොකිරීම සඳහා හේතු පැහැදිලි කිරීම සහ අමාත්‍යාංශ විසින් භාණ්ඩාගාරයට ආපසු යොමු කරන ලද මුදල් ප්‍රමාණ පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම.

6. **දත්ත ලබාගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම:** ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කැපවීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අමාත්‍යාංශ මට්ටමේ දත්ත සහ තොරතුරු රැස් කිරීම, ප්‍රවේශ්‍යතාව සහ පාරදෘශ්‍යභාවය වැඩිදියුණු කිරීම මඟින් කාර්යක්ෂම අධීක්ෂණය සහ ඇගයීම සඳහා සහාය සැපයීම.

7. **තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) යටතේ ප්‍රතිචාර කාර්යක්ෂමතාව:** ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ දත්ත ඉල්ලීම් තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) යාන්ත්‍රණය හරහා වේගවත්, විශ්වාසනීය සහ නිවැරදි ආකාරයෙන් සකස් කර ලබාදීම සහතික කිරීම සඳහා තොරතුරු සැපයීමේ කාලෝචිතභාවය හා නිරවද්‍යතාව වැඩිදියුණු කිරීම. එමෙන්ම, තොරතුරු දැනගැනීමේ අයිතිය පනතේ 8 සහ 9 වගන්තිවලට අනුකූලව තොරතුරු ප්‍රාක්‍රියාවෙන් ලබාදීම ද මෙහි අරමුණ වේ. මෙය සාක්ෂි මත පදනම් වූ ස්වාධීන අධීක්ෂණය ප්‍රවර්ධනය කිරීමටත්, පුරවැසියන්ට ව්‍යවස්ථානුකූලව සහතික කර ඇති තම අයිතිවාසිකම් නිදහසේ භාවිත කිරීමටත් දායක වේ.

# 9

# නිගමනය

ප්‍රතිපත්ති ප්‍රකාශන අධීක්ෂණයේ දෙවන අර්ධ වාර්ෂික වාර්තාව මගින් රජයේ "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිපත්ති සහ වැඩසටහන් බවට පරිවර්තනය කිරීමේ ප්‍රගතිය, අභියෝග සහ පවතින හිඩැස් අවධාරණය කරයි. මෙම විශ්ලේෂණයෙන් පෙනී යන්නේ ප්‍රකාශන කැපවීම් කිහිපයක් ජාතික ප්‍රතිපත්ති රාමුවට ඇතුළත් කර අමාත්‍යාංශ මට්ටමේ උපායමාර්ගික සැලසුම් සහ ක්‍රියාකාරී සැලසුම් හරහා තවදුරටත් ක්‍රියාත්මක කර ඇති නමුත්, මුල් දේශපාලන කැපවීම් සහ ඒවායේ ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීම අතර තවමත් සැලකිය යුතු පරතරයන් පවතින බවයි.

මෙම වාර්තාව මගින් ප්‍රධාන නිරීක්ෂණ කිහිපයක් අවධාරණය කරයි: මැතිවරණ ප්‍රතිඥා සහ ජාතික අයවැය ප්‍රතිපාදන අතර ඇති අනුකූලතාව මගින් වැඩසටහන් සඳහා අර්ධ වශයෙන් ප්‍රමුඛත්වය ලබාදී ඇති බව පෙන්නුම් කරන නමුත් ආයතනික හැකියාවන්හි සීමාවන්, දත්ත ලබාගැනීමේ අපහසුතා සහ ක්‍රියාපටිපාටිමය දුර්වලතා හේතුවෙන් සම්පූර්ණ ක්‍රියාත්මක කිරීම සීමා වී ඇත. අමාත්‍යාංශ උපායමාර්ගික හා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබුණද, ඒවා අනුගමනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ඇති වෙනස්කම් මගින් වැඩිදියුණු කළ අධීක්ෂණය සහ සම්බන්ධීකරණයේ අවශ්‍යතාව පැහැදිලි වේ.

මීට අමතරව, දිට්වා සුළි කුණාටුවෙන් පසු ගත් ක්‍රියාමාර්ග ඇතුළුව ආපදා කළමනාකරණය වැනි ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ අයවැය ප්‍රතිපාදන ඇතුළත් කිරීම සමාන ලෙස සිදු නොවූ බව මෙම වාර්තාව හඳුනාගනී. එසේම, පාරදෘශ්‍යභාවය වැඩිදියුණු කිරීම, ආයතනික සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සහ සමාජ ආරක්ෂණය, තරුණ රැකියා සහ පාරිසරික තිරසාරභාවය වැනි පුරවැසියා කේන්ද්‍ර කරගත් අරමුණු අඛණ්ඩව ප්‍රමුඛතාවයට ලක් කිරීම සඳහා පවතින අවස්ථා ද මෙම සොයාගැනීම් මගින් පෙන්වා දෙයි.

සමස්තයක් ලෙස, 2026 ජාතික අයවැය සහ ඒ හා සම්බන්ධ ආයතනික ක්‍රියාමාර්ග මගින් ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණ ඉදිරියට ගෙනයාමේ අභිප්‍රාය පෙන්වා දෙයි. කෙසේවෙතත්, දේශපාලන ප්‍රතිඥා සහ ප්‍රායෝගික ප්‍රතිඵල අතර පවතින හිඩැස පියවීම සඳහා අඛණ්ඩ ප්‍රතිපත්ති අවධානයක්, ශක්තිමත් පාලන යාන්ත්‍රණ සහ අමාත්‍යාංශ මට්ටමේ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩිදියුණු කළ අධීක්ෂණයක් අවශ්‍ය වේ. එබැවින්, මෙම වාර්තාව ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු ඵලදායී ලෙස මහජනතාවට සැබෑවට දැනෙන ප්‍රතිලාභ බවට පරිවර්තනයවන බව සහතික කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණයට පදනමක් සපයයි.

# 10

# ආශ්‍රිත මූලාශ්‍ර


Department of Project Management and Monitoring- Ministry of Finance, Planning and Economic Stabilization. 2026. Institutionalizing the Results-based Management in the Public Sector. Colombo: Department of Project Management and Monitoring- Ministry of Finance, Planning and Economic Stabilization. https://www.treasury.gov.lk/api/file/0a2a5037-bcb8-4106-95fb-b46dafbbc66f

Department of Project Management and Monitoring. 2025. Progress of Mega Scale Development Projects First Quarter – Year 2025. Colombo: Department of Project Management and Monitoring. https://www.treasury.gov.lk/api/file/461ff3f7-7ca0-4719-8103-89c59c5a4305

Department of Project Management and Monitoring. 2025. Progress of Mega Scale Development Projects Second Quarter – Year 2025. Colombo: Department of Project Management and Monitoring. https://www.treasury.gov.lk/api/file/8e22d73e-32dd-450f-b6ac-c8bc527e0358

Department of Project Management and Monitoring. 2025. Progress of Mega Scale Development Projects Third Quarter – Year 2025. Colombo: Department of Project Management and Monitoring. https://www.treasury.gov.lk/api/file/c93a03b1-f11c-4b59-91be-203798d10bd2

Department of State Accounts-General Treasury. 2025. Report on Financial Performance of the Government Upto 04th Quarter Ending 31st December 2025. Colombo: Department of State Accounts-General Treasury. https://www.treasury.gov.lk/api/file/80ecb34e-b50b-419d-9f83-bec02e640399

Department of State Accounts-General Treasury. 2025. Report on Financial Performance of the Government Upto 03rd Quarter Ending 30th September 2025. Colombo: Department of State Accounts-General Treasury. https://www.treasury.gov.lk/api/file/9c848db6-0230-46d4-ba0d-a1906966ea3b

Department of State Accounts-General Treasury. 2025. Report on Financial Performance of the Government Upto 02nd Quarter Ending 30th June 2025. Colombo: Department of State Accounts-General Treasury. https://www.treasury.gov.lk/api/file/9c848db6-0230-46d4-ba0d-a1906966ea3b

Jathika Jana Balawegaya (NPP Sri Lanka). 2024. A Thriving Nation–A Beautiful Life. Battaramulla: Jathika Jana Balawegaya (NPP Sri Lanka). https://www.npp.lk/en/policies/npppolicystatement

Ministry of Finance, Planning and Economic Development. 2025. National Policy Framework: A Thriving Nation-A Beautiful Life. Colombo: Ministry of Finance, Planning and Economic Development. https://www.treasury.gov.lk/api/file/beb1840e-cfd0-447f-9d0e-35937c48f1f7

Ministry of Finance, Planning and Economic Development. 2026. Approved Detailed Budget Estimate-Volume I. Colombo: Ministry of Finance, Planning and Economic Development. https://www.treasury.gov.lk/api/file/f5514bb0-58d9-4a6b-8bd5-0684966285e0

Ministry of Finance, Planning and Economic Development. 2026. Approved Detailed Budget Estimate-Volume II. Colombo: Ministry of Finance, Planning and Economic Development. https://www.treasury.gov.lk/api/file/2dfd2838-0d34-4b1b-98ec-a0d69dd870e9

Ministry of Finance, Planning and Economic Development. 2026. Approved Detailed Budget Estimate-Volume III. Colombo: Ministry of Finance, Planning and Economic Development. https://www.treasury.gov.lk/api/file/bc9d-ca02-97c4-4429-a349-13acc2bfb6b2

Ministry of Finance, Planning and Economic Development. 2026. National Budget 2026: Citizen Budget-A Public -Friendly Version of the Annual Budget. Colombo: Ministry of Finance, Planning and Economic Development. https://www.treasury.gov.lk/api/file/806f5cd4-f5fe-47da-8284-912658d73bd0

Parliament Of The Democratic Socialist Republic Of Sri Lanka. 2024. Public Financial Management Act, No. 44 Of 2024. https://www.treasury.gov.lk/api/file/0ad40728-60bd-41e3-980b-8bd4d173bb86

Sivagnanasothy, V. 2020. Development Evaluation in Sri Lanka. USAID/SDGAP.

# 11

# ඇමුණුම්

ඇමුණුම 1: 2025 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඇගයීමට ලක් කළ කැබිනට් මණ්ඩල තීරණ

ඇමුණුම 2: අමාත්‍ය මට්ටමේ ප්‍රකාශිත ප්‍රතිඥා ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය

**නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය (පැෆ්රල් සංවිධානය)**
**මාර්තු 12 ව්‍යාපාරය**
නො. 16, බයර්ඩ් පෙදෙස, පාමංකඩ හරස් පාර, කොළඹ 06
+94 11 255 8570/71
paffrel@sltnet.lk